# XIX පරිච්ඡේදය

## විනය කාර්ය පරිපාටිය


1. සාමාන්‍ය කරුණු
2. විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන වරදවල්
3. වරදවල් වාර්තා කිරීම
4. දඬුවම්
5. විනයානුකූලව ක්‍රියාකිරීම සඳහා බලය පැවරීම
6. මූලික විමර්ශන සහ විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා පත්කරනු ලබන තැනැත්තන්
7. සුළු වරදවල් සඳහා ලඝු දඬුවම් දීමේ ක්‍රියා පරිපාටිය
8. මූලික විමර්ශන සහ විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම් ක්‍රමවේදය
9. ලේඛන
10. විනය පරීක්ෂණවලදී නියෝජනය
11. විනය පරීක්ෂණ පැවැත්වීම
12. නිර්මාණ කොල්ලයට (Plagiarism) එරෙහිව ගතයුතු ක්‍රියාමාර්ග
13. විනය බලධරයාගේ නියෝගය
14. විනය නියෝගයන් සංශෝධනය කිරීම සහ වෙනස් කිරීම
15. විනය නියෝගයන්ට විරුද්ධව කරන අභියාචනා
16. සාපරාධී වැරදි, අල්ලස් චෝදනා සහ විනිශ්චයට භාජනය වී ඇති කරුණු
17. උසාවියකින් වරදකරු කරනු ලැබීම හෝ ව්‍යවස්ථාපිත බලධරයෙකු විසින් දඬුවම් ලබාදීම
18. විමර්ශන, කොමිෂන් සභා වාර්තාවන් සහ විගණන වාර්තාවන් මගින් අනාවරණය වූ වැරදි
19. වැඩ තහනම් කිරීම සහ අනිවාර්ය නිවාඩු යැවීම
20. සාමාන්‍ය අකාර්යක්ෂමතාවය හේතුවෙන් විශ්‍රාම ගැන්වීම

21. විනය ක්‍රියාමාර්ගයක් සිදුකෙරෙමින් පවතින විට හෝ විනය ක්‍රියාමාර්ගයක් ගැනීමට නියමිත අවස්ථාවන්හි දී, සේවයෙන් ඉල්ලා අස්වීම, සේවයෙන් විශ්‍රාමයාම හෝ විදේශගතවීම සඳහා අවසර ඉල්ලා සිටීම

22. තනතුර අතහැර යාම

23. පරිවාස කාලය ගතකරමින් සිටින සේවකයින් විෂයයෙහි ක්‍රියාත්මක වන ලඝු විනය පරීක්ෂණ ක්‍රමවේදය

24. චෝදනා පත්‍රයක් නිකුත් කිරීමෙන් පසු, විනය බලධරයා වෙනස්වන අවස්ථාවන්හි දී, එම සේවකයා සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීම

25. විනිශ්චය සභා/ පරීක්ෂණ නිලධාරීන් සඳහා මගපෙන්වීමේ සටහන්

26. (අ) උපලේඛනය: කොමිෂන් සභාවේ සේවකයින් විෂයයෙහි සුළු දඬුවම් ලබාදීමේ බලය පැවරීම

27. (ආ)උපලේඛනය: උසස් අධ්‍යාපන ආයතනයන්හි/විද්‍යායතනයන්හි සේවකයින් විෂයයෙහි සුළු දඬුවම් ලබාදීමේ බලය පැවරීම

28. (ඇ) උපලේඛනය: කොමිෂන් සභාවේ සේවකයින් විෂයයෙහි බරපතල දඬුවම් ලබාදීමේ බලය පැවරීම

29. (ඈ)උපලේඛනය: උසස් අධ්‍යාපන ආයතනයන්හි/විද්‍යායතනයන්හි සේවකයින් විෂයයෙහි බරපතල දඬුවම් ලබාදීමේ බලය පැවරීම

# XIX පරිච්ඡේදය

## විනය කාර්ය පරිපාටිය

1. **සාමාන්‍ය**

1.1 කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි විනය බලධරයින් පහත සඳහන් පරිදි වේ; — විනය බලධරයින්

(අ) කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය විෂයයෙහි, කොමිෂන් සභාව හෝ එහි යෝජනා සම්මතයෙන් බලය පවරා දී ඇති විටක දී, කොමිෂන් සභාවේ සභාපතිවරයා [පනතෙහි 7(3) සහ 8 (3) (a) පරිදි]. — කොමිෂන් සභාව

(ආ) විශ්වවිද්‍යාලයක කාර්ය මණ්ඩලය විෂයයෙහි, එහි පාලක සභාව වේ. පාලක සභාව විසින් බලය පවරා දී ඇති විටක දී, ආචාර්යවරුන් සහ නිලධාරීන් හැර අනෙකුත් කාර්ය මණ්ඩලය උදෙසා, එහි උපකුලපතිවරයා හට විනය බලධරයා ලෙස කටයුතු කළ හැකි ය. [පනතෙහි 45(2) (xii) වගන්තිය පරිදි] — විශ්වවිද්‍යාල

(ඇ) විශ්වවිද්‍යාල විද්‍යායතන කාර්ය මණ්ඩලය විෂයයෙහි, එහි කළමනාකරණ මණ්ඩලය විනය බලධරයා ලෙස කටයුතු කරයි. කළමනාකරණ මණ්ඩලය විසින් බලය පවරා දී ඇති විටක දී ආචාර්යවරුන් සහ නිලධාරීන් හැරෙන්නට, අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින් උදෙසා, එහි අධ්‍යක්ෂවරයා විනය බලධරයා ලෙස කටයුතු කළ හැකි ය. [පනතෙහි 45 වන වගන්තිය සමඟ කියවෙන 63(3) වගන්තියට අනුව] — විශ්වවිද්‍යාල විද්‍යායතන

(ඈ) යම් ආයතනයක් හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක අධ්‍යක්ෂවරයා විෂයයෙහි, එම ආයතනය හෝ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානය අනුයුක්තව ඇති විශ්වවිද්‍යාලයේ පාලක සභාව. — උසස් අධ්‍යාපන මධ්‍යස්ථාන

(ඉ) යම් මධ්‍යස්ථානයක හෝ ආයතනයක කාර්ය මණ්ඩල විෂයයෙහි, එකී මණ්ඩපය/ ආයතනය අනුබද්ධිතව/ අනුයුක්තව ඇති විශ්වවිද්‍යාලයේ පාලක සභාව මඟින් එම ආයතනයන්හි ආචාර්යවරුන් සහ නිලධාරීන් හැර අනෙකුත් කාර්ය මණ්ඩලය උදෙසා, විනය බලධරයා ලෙස කටයුතු කිරීමේ බලය, අදාල විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත පවරා දිය හැකි ය. — මණ්ඩප/ආයතන

(ඊ) උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක කාර්ය මණ්ඩලය විෂයයෙහි, එහි පාලක බල මණ්ඩලය විනය බලධරයා ලෙස ක්‍රියාකරයි. එම මධ්‍යස්ථානයන් හි ආචාර්යවරුන් සහ නිලධාරීන් හැරෙන්නට අනෙකුත් කාර්ය මණ්ඩලය විෂයයෙහි විනය බලධරයා ලෙස ක්‍රියාකිරීම සඳහා, එහි පාලක බල මණ්ඩලය මඟින්, මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා වෙත බලය පවරා දිය හැකි ය. — උසස් අධ්‍යාපන මධ්‍යස්ථාන

(ඩ) විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ සේවය සඳහා කොමිෂන් සභාව විසින් හෝ යම් උසස් අධ්‍යාපන ආයතනයක් විසින් හෝ ලබා දී ඇති කාර්ය මණ්ඩලය විෂයයෙහි, විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය විනය බලධරයා ලෙස ක්‍රියා කරයි. [පනතෙහි 84(2) වගන්තිය පරිදි] — විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය

(ඩඅ) කොමිෂන් සභාව විසින් එහි අධ්‍යක්ෂවරයා පත්කළ යුතු යැයි අදාල නියමාවලියේ සඳහන් කොට ඇති සහ යම් විශ්වවිද්‍යාලයකට අනුයුක්ත නොකොට පිහිටුවන ලද උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක අධ්‍යක්ෂවරයා විෂයයෙහි, කොමිෂන් සභාව විනය බලධරයා ලෙස ක්‍රියා කරයි. — උසස් අධ්‍යාපන මධ්‍යස්ථාන

(ඵ) යම් විශ්වවිද්‍යාලයක/ මණ්ඩපයක/ උසස් අධ්‍යාපන ආයතනයක/ මධ්‍යස්ථානයක මණ්ඩපාධිපතිවරයා, නියෝජ්‍ය උපකුලපතිවරයා හෝ අධ්‍යයනාංශයක ප්‍රධානියා විෂයයෙහි එම උසස් අධ්‍යාපන ආයතනයේ පාලක බල මණ්ඩලය.

(ඵ්) යම් විශ්වවිද්‍යාලයක/ මණ්ඩපයක/ විශ්වවිද්‍යාල විද්‍යායතනයක පීඨයක පීඨාධිපතිවරයා විෂයයෙහි එම උසස් අධ්‍යාපන ආයතනයේ/ විද්‍යායතනයේ පාලක බල මණ්ඩලය.

1.2 “විනය පාලනය” යන්නෙන් අදහස් වන්නේ, මෙම පරිච්ඡේදයේ දෙවන (2) ඡේදයේ විස්තර කොට ඇති “විනයානුකූල ක්‍රියාමාර්ගයන් ගත යුතු වැරදි” සම්බන්ධයෙන්, කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක/ විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය යනාදියෙහි සේවයේ නියුක්ත තැනැත්තන්, සේවයෙන් පහකිරීමේ හෝ නැතහොත් වෙනත් දඬුවම් දීමට ඇති බලයයි. — විනය පාලනය

1.3 මූලික විමර්ශනයක් හෝ විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා යම් තැනැත්තෙකු, විනිශ්චය සභාවක්, මෙම පරිච්ඡේදයේ 6.1.1 උපඡේදයෙහි දක්වා ඇති තැනැත්තන් අතුරින් විනය බලධරයා විසින් පත්කල හැකි ය. — විනය පරීක්ෂණ පැවැත්වීමට බලය ලබා දී ඇති තැනැත්තන්

කෙසේ වුවද, යම් විෂමාචාරයක් සම්බන්ධයෙන් තොරතුරක් ලැබුණු වහාම මූලික විමර්ශනයක් පැවැත්විය යුතු යැයි හැඟෙන අවස්ථාවක දී, කොමිෂන් සභාවේ සභාපතිවරයා/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයා විසින් එම මූලික විමර්ශනය පැවැත්වීම සඳහා, අදාල පාලක බල මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව සුදුසු තැනැත්තෙකු පත්කිරීමට බලය තිබේ.

1.4 පරිවාස කාලයේ ස්ථිර හෝ තාවකාලික හෝ අනියම් හෝ තනතුරු ඇතුළු ව, සියළුම තනතුරු දරන්නන් වෙතින් සිදුවන කුමන ආකාරයකින් හෝ දඬුවම් පැමිණ විය යුතු විෂමාචාර ක්‍රියාවක් හෝ ප්‍රමාද දෝෂයක් හෝ සම්බන්ධයෙන් මෙම පරිච්ඡේදයේ සඳහන් විධිවිධාන අනුව නොපමාව ක්‍රියාකළ යුතු වේ. මෙම පරිච්ඡේදයේ සඳහන් නොවන කුමන හෝ විෂමාචාර ක්‍රියාවක් හෝ ප්‍රමාද දෝෂයක් අදාල විනය බලධරයා වෙත වාර්තාකල යුතු අතර, ඒ සඳහා අවශ්‍ය උපදෙස් ඔහු විසින් ලබාදෙනු ඇත.

කඩිනමින් විනයානුකූලව ක්‍රියාකල යුතු ය

1.5 මෙම විධිවිධාන යටතේ ගනු ලැබූ යම් ක්‍රියාමාර්ගයක් හෝ දෙනු ලැබූ නියෝගයක්, නොවිධිමත් භාවය නිසාවෙන් හෝ යම් විධිවිධානයක් නොපිළිපැදීම නිසාවෙන් හෝ සාධාරණය ඉටුනොවී නැත්නම්, එකී හේතුමත පමණක් එම ක්‍රියාමාර්ග හෝ නියෝග බල රහිත වීමක් නොවන්නේ ය.

ක්‍රියාමාර්ගවල සහ නියෝගවල බලාත්මක භාවය

1.6 පවත්වනු ලබන විනය පරීක්ෂණයක් අවසන් වීමට පෙර, කිසියම් අවස්ථාවක දී, විනය කටයුතු පිළිබඳ විස්තර විනය බලධරයා වෙත ඉදිරිපත් කිරීමට සිදුවන අවස්ථාවක දී, එම ලේඛන සමඟ ප්‍රස්තුත කාරණයට අදාල වැදගත් සම්පූර්ණ කරුණු සඳහන් සංක්ෂිප්ත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. විද්‍යුත් වාර්තා, විද්‍යුත් ලේඛන ආදිය ද ඇතුළත් ව යම් ලේඛන සහ වාර්තාවන් පිළිබඳව යොමුව දන්වා ඇති කල්හි, එම වාර්තා, විද්‍යුත් ලේඛනවල මුද්‍රිත පිටපත්, අදාල මෘදුකාංග පිළිබඳ විස්තර ද පහසුවෙන් සොයාගත හැකි ආකාරයට "කොඩ්" ආදිය ද සමඟ අමුණා යැවිය යුතු ය. පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලද ලේඛනවල මුල් පිටපත් මෙන් ම, විත්තිය විසින් ඉදිරිපත් කරන ලද ලේඛනවල සහතික කල පිටපත් ද, අදාල තැනැත්තාගේ පෞද්ගලික ලිපිගොනුව සහ චර්යා සටහන් ද එම වාර්තාව සමඟ ඉදිරිපත් කළ යුතු වේ. එසේ ඉදිරිපත් කරන්නා වූ ලේඛනවලට යම් විද්‍යුත් ලේඛන හෝ වාර්තා වේ නම් ඒවා ද ඇතුලත් විය යුතු ය.

විනය බලධරයා හට වාර්තාකරන අවස්ථාවකදී

1.7 පරීක්ෂණයක් පවත්වන ලද නම්, එම පරීක්ෂණයට අදාළ ලේඛන, කාලානුක්‍රමයට අනුව පිළියෙල කොට, අදාල විනය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. පරීක්ෂණයේ යම් අවධියකට අදාළ ලේඛන, එනම් , මූලික විමර්ශනයට අදාල ලියවිලි, චෝදනා සහ ඒවාට ලැබුණු පිළිතුරු, පරීක්ෂණ සටහන්, විනිශ්චය සභාවේ/ පරීක්ෂණ නිලධාරියාගේ තීරණ සහ නිර්දේශ උචිත පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධාරියාගේ නිර්දේශ සමඟ අදාල ලේඛන පහසුවෙන් හඳුනාගත හැකි පරිදි ලකුණු කොට, නිත්‍ය විනය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

පරීක්ෂණය පවත්වා තිබෙන විට

## 2. විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන වරදවල්

2.1 මෙම විධිවිධාන යටතේ ක්‍රියාකරනු ලැබිය හැකි වැරදි, පහත සඳහන් ආකාරයට විවිධ ශීර්ෂයන් යටතේ වර්ග කළ හැකි ය. එහෙත්, මෙම ඡේදයෙහි සඳහන් වැරදි, ඒ පිළිබඳ පරිපූර්ණ වාර්තාවක් ලෙස නො සැලකිය යුතු අතර, යම් වරදක නිර්වචනය මෙම ඡේදයෙහි අඩංගු නිර්වචනයන්ට සීමා කරන්නක් ලෙස ද නොසැලකිය යුතු වේ. මෙහි සඳහන් නිර්වචනයන් මඟින් ආවරණය නොවන්නා වූ, එහෙත් අදාල විනය බලධරයාට අනුව යම් ක්‍රියාවක් විනය ක්‍රියාමාර්ග ගැනීමට තරම් වේ යැයි අදහස් කරන වි ටකදී, එම ක්‍රියාවන් පිළිබඳව මෙම පරිච්ඡේදයෙහි සඳහන් විධිවිධානවලට අනුව ක්‍රියාකල යුතු වේ. සවිස්තරාත්මක ලැයිස්තුවක් නොවේ

2.2 විනයානුකූලව ක්‍රියාකල හැකි වරදවල්, මෙහි දක්වා ඇති ශීර්ෂයන් යටතේ පුළුල්ව වර්ගකල හැකි ය. වැරදි කාණ්ඩ

- අකාර්යක්ෂමතාව (Inefficiency)
- අදක්ෂතාව (Incompetence)
- නොසැලකිලිමත්බව (Negligence)
- පාක්ෂිකභාවය නොමැතිවීම (Lack of Integrity)
- අනිසි හැසිරීම (යම් තැනැත්තෙකුගේ රාජකාරියට අදාලව හෝ එසේ නොමැතිව) (Improper Conduct)
- අවිනය (Indiscipline)
- නිර්මාණ කොල්ලය (Plagiarism)
- දූෂණය (Corruption)

2.2.1 **අකාර්යක්ෂමතාවය:** යම් තැනැත්තෙකුගෙන් අපේක්ෂිත රාජකාරිය, ඔහුගේ උදාසීනභාවය, අනවධානය හෝ වෙනත් දෝෂයක් නිසා සැහෙන ප්‍රමාණයකින් ඉටුනොවීම අකාර්යක්ෂමතාවය ලෙස හැඳින්විය හැකිය. අකාර්යක්ෂමතාවය, යම් තැනැත්තෙකුගේ අදක්ෂභාවය හේතුකොට ගෙන ද ඇතිවීමට හැකියාව තිබේ. අකාර්යක්ෂමතාවය

2.2.2 **අදක්ෂභාවය:** අදක්ෂභාවය ඇති වනුයේ යම් තැනැත්තෙකු, ඔහුගේ රාජකාරී කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා, තමන් කෙරෙහි පිහිටා තිබිය යුතු හෝ නැතහොත් තමන් විසින් වර්ධනය කරගතයුතු යැයි අපේක්ෂා කරන්නා වූ බුද්ධිමය, ගතිලක්ෂණ, ශාරීරික සහ/හෝ අනෙකුත් ගුණාංගයන් නොතිබීම යන තත්ත්වය මත ය. අදක්ෂභාවය ගැනිය යුත්තේ, එම තැනැත්තාගේ තත්ත්වය, ජ්‍යෙෂ්ඨත්වය, පළපුරුද්ද, සේවා ස්ථානයේ ඔහුට පැවරී ඇති වගකීම් ප්‍රමාණය සහ ඔහු සේවය කරන තනතුරට බඳවාගැනීමට නියම කර ඇති සුදුසුකම් ද පදනම් කරගෙනය. අදක්ෂභාවය, ශිල්පීය, වෘත්තීමය හෝ පරිපාලනමය අදක්ෂභාවයක් හෝ ශිෂ්‍යයින්, කාර්ය මණ්ඩලය, කම්කරුවන් සමඟ හෝ තම සේවා ස්ථානයේ වෙනත් පෞද්ගලික සම්බන්ධතා විෂයයෙහි ඇති වූ අදක්ෂභාවයන් වීමටද පුළුවන. අදක්ෂභාවය

2.2.3 **නොසැලකිලිමත්බව (අනවධානය) :** නොසැලකිලිමත්බව යන්නෙන් අදහස් වන්නේ, යම් තැනැත්තෙකුහට පවරන ලද රාජකාරී පැහැරහැරීමය. මෙයට සැලකිල්ලක් හෝ අනලස් බවක් නොමැති වීම නිසා සිදුවන අතපසුවීම්, වැරදි, පිළිගත හැකි මට්ටමකට කටයුතු සිදුකෙරෙන බවට මුදල් නාස්තියක් සිදුනොවන බවට සහ දේපලවලට හානිවීමක් හෝ නැතිවීමක් නොවන බවට වගබලා ගැනීම සඳහා වැඩ පිළිවෙලක් නොයෙදීම, නිසි සුපරීක්ෂණයක් නොමැති වීම ආදී කරුණු ය. අනවධානය

2.2.4 **පාක්ෂිකභාවය නොමැතිවීම (අවංකභාවය නොමැතිවීම):** පාක්ෂිකභාවය නොමැතිකම යන්නෙන්, අනිසි සහ පෞද්ගලික ලාභයක් ලැබීමේ අරමුණ ඇතිව ක්‍රියාකිරීම හෝ යම් යම් දේ නොකර සිටීම, වංචාකිරීම, සොරකම් කිරීම, රැවටීම, වංචාකාරී ලෙස අත්සන් තැබීම, කූඨ ලේඛන පිළියෙල කිරීම, අරමුදල් හෝ යම් නිශ්චිත කාර්යයක් සඳහා වෙන්කොට ඇති මුදල් දූෂ්පරිහරණය කිරීම හෝ තාවකාලිකව දූෂ්පරිහරණය කිරීම, වාර්තා සහ ලිපිලේඛන සකස් කිරීමේ දී සත්‍යය මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් වසන් කිරීම, ලිපි ලේඛන හෝ කරුණු යටපත් කිරීම, අල්ලස් දීම හෝ ගැනීම, තම ඥාතියෙකුගේ හෝ හිතවතෙකුගේ ලාභ ප්‍රයෝජනතකා, තම නිල තත්ත්වය භාවිතා කිරීම හෝ තමාගේ රාජකාරී කටයුතු හෝ බලය ක්‍රියාවේ යෙදවීම, යම් පෞද්ගලික කාර්යයන් සඳහා ආයතනයේ මුදල්, දේපල හෝ කම්කරුවන් හෝ යටත් සේවකයින් යොදාගැනීම, තමා විසින් දැනට හෝ මතුවට උපකාරයක් කරනු ලැබිය හැකි තැනැත්තකුගේ ත්‍යාග හෝ උදව් උපකාර ලබාගැනීම, විශ්වවිද්‍යාලයේ තම රාජකාරී කටයුතු සහ පෞද්ගලික අවශ්‍යතා අතර නියත ගැටුමක් ඇති වන ආකාරයේ වෙනත් ඕනෑම ක්‍රියාවක් අදහස් වේ. පාක්ෂිකභාවය නොමැතිවීම

2.2.5 **අනිසි හැසිරීම:** අනිසි හැසිරීම යන්නට, යම් තැනැත්තකුගේ රාජකාරී සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු ඇතුලත් වේ; අනිසි හැසිරීම

(අ) නිල වශයෙන් භුක්ති විඳින්නා වූ විශ්වාසය කඩවන අන්දමට ක්‍රියාකිරීම.

(ආ) සේවා ස්ථානයේ දී හෝ ඉන් පිටතදී, තම යටත් සේවකයින් සම්බන්ධයෙන් අවිචාරමත් ලෙස සහ තර්ජනාත්මකව කටයුතු කිරීම.

(ඇ) එසේ කිරීමට තහනම් කොට ඇති යම් රාජකාරියට සම්බන්ධ ප්‍රකාශනයක්, පළකිරීමත්, මහජනයාට හෝ සේවකයින්හට දැනගැනීමට සැලැස්වීම.

(ඈ) ශිෂ්‍යයින් සහ සේවකයින් ආයතනයට විරුද්ධව කටයුතු කිරීමට පෙළඹවීම.

(ඉ) තමන් රාජකාරී කරන ස්ථානය හෝ රාජකාරී පරිශ්‍රය දේශපාලන රැස්වීම් පැවැත්වීමට හෝ වෙනත් දේශපාලන කටයුතු සඳහා යොදාගැනීමට ඉඩහැරීම.

(ඊ) තම රාජකාරී කාලය තුළදී හෝ ඉන් පිටතදී, තම ආයතනයේ සේවකයින් හට අණ නොපිළිපැදීමට, තර්ජනය කිරීමට හෝ අවිචාරවත් ලෙස හැසිරීමට පෙළඹ වීම.

(උ) ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට සහ දේපලවලට හානිවන ආකාරයේ ක්‍රියාවල යෙදීමට හෝ ආයතනයේ රාජකාරී නිසිලෙස පවත්වාගෙන යාමට බාධා ඇතිවන ස්වභාවයේ ක්‍රියාවන් සිදුකිරීමට ශිෂ්‍යයින් සහ සේවකයින් පෙළඹවීම.

(ඌ) තම සේවා ස්ථානයේ දේපල, පෞද්ගලික කටයුතු සඳහා යොදා ගැනීම.

(එ) තම නිල තත්ත්වයට (දරන තනතුරට) අහිතකර විය හැකි කිසියම් කටයුත්තක යෙදීමට හෝ තමන් සේවය කරන ආයතනය අපකීර්තියට පත්වන අන්දමේ ක්‍රියාවක නිරත වීම.

(ඒ) තමන්ගේ පෞද්ගලික අවශ්‍යතාවයන් සහ රාජකාරී කටයුතු අතර, සත්‍ය වශයෙන්ම යම් ගැටුමක් නොතිබුනද, එවැනි ගැටුමක් ඇතිබව පෙනීයන අන්දමේ ක්‍රියාවක නිරත වීම.

තමන්ගේ රාජකාරී කටයුතුවලට ඍජුවම සම්බන්ධතාවක් නොමැති, නමුත් අනිසි හැසිරීමක් ලෙසට සැලකෙන කරුණුවලට;

රාජකාරියට ඍජුවම සම්බන්ධතාවයක් නොමැති අනිසි හැසිරීම්

(අ) පුරුද්දක් ලෙස බීමත්ව සිටීම (XVIII වන පරිච්ඡේදයේ 6 වන ඡේදය බලන්න)

(ආ)මත්ද්‍රව්‍ය භාවිතා කිරීම (XVIII වන පරිච්ඡේදයේ 6 වන ඡේදය බලන්න)

(ඇ) ප්‍රසිද්ධ ස්ථානයන්හි අසංවර ලෙස හැසිරීම

(ඈ) මහජන ගර්හාවට පාත්‍රවන්නා වූ දුරාචාරයන්

(ඉ) අවිචක්ෂනභාවය නිසා හෝ වෙනත් ගර්හාවට භාජනය කළයුතු හේතු මත තදබල ලෙස ණයගැති වීම

(ඊ) තම සේවා ස්ථානය හෝ ආයතනය අපකීර්තියට පත්විය හැකි ආකාරයේ යම් වෙනත් ඕනෑම කටයුත්තක්

2.2.6 **අවිනය :** අවිනය යන්නට, පුරුද්දක් වශයෙන් සේවයට වාර්තා නොකර සිටීම, නිසි වේලාවට රාජකාරියට වාර්තා නොකිරීම, නියෝග ක්‍රියාත්මක කිරීම පැහැර හැරීම, තම උසස් නිලධාරීන්ට, යටත් සේවකයින්ට හෝ මහජනයාට අවිනීත අන්දමින් කටයුතු කිරීම, රාජකාරියේ යෙදී සිටින විට බීමත්ව සිටීම, මත්ද්‍රව්‍ය භාවිතා කිරීම, අවසරයකින් තොරව සේවා ස්ථානයෙන් බැහැරවීම, සේවයට වාර්තා කිරීම නිසි පරිදි සටහන් කිරීමට අපොහොසත් වීම හෝ එම ලේඛන සහ එහි ඇති සටහන් වෙනස් කිරීමට කටයුතු කිරීම, සේවා ස්ථාන පරිශ්‍රයේදී යම් තැනැත්තෙකුහට ශාරීරික අඩත්තේට්ටම් කිරීම (පහරදීම) ආදිය අයත් වේ. — අවිනය

2.2.7 නිර්මාණ කොල්ලය : නිර්මාණ කොල්ලය යනුවෙන් අදහස් කරනුයේ, ඇත්ත වශයෙන්ම වෙනත් අයෙකුගේ යම් නිර්මාණයක් තමන් විසින් නිර්මාණය කරන ලද්දක් වශයෙන් ඉදිරිපත් කිරීමයි. මෙහිදී, එම වරද කරන තැනැත්තා ඇත්ත වශයෙන්ම විෂමාචාරයන් දෙකක් සිදුකරයි.එනම්, අන් අයෙකුගේ නිර්මානයක් සොරකම් කිරීම සහ එය තමන් විසින් කරන ලද දෙයක් නොවූව ද, තම නිර්මාණයක් ලෙසට ඉදිරිපත් කිරීම යන කරුණු ය. එබැවින්, එවැනි ක්‍රියාවක් තුළ වංචා කිරීම, අධ්‍යාපනික වශයෙන් ඇති කරන්නා වූ වංකභාවය සහ නොසැලකිල්ල නිසාවෙන් හෝ හිතාමතාම හෝ සිදුකරන්නා වූ අනිසි හැසිරීම යන කරුණු ගැබ් වී තිබේ. එවැනි ක්‍රියාවක්, සදාචාර සම්පන්න වශයෙන් සහ අචාරධර්මයන්ට අනුව පිළිගත නොහැකි වන්නේ, එය අන්සතු විෂය දැනුම, අදහස් සහ කරුණු දැක්වීම් වෙනත් අයෙකු විසින් සොරකම් කිරීමත්, වංචා කිරීමත් සහ කරුණු සාවද්‍ය ලෙස වාර්තා කිරීමත් යන කරුණු හේතුවෙන් ය. — නිර්මාණ කොල්ලය (Plagiarism)

2.2.8 **දූෂණය:** දූෂණය යනු, (i) රජයට, කොමිෂන් සභාවට, උසස් අධ්‍යාපන ආයතනයකට/ විද්‍යායතනයකට හෝ විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයට සිදුකරන ලද වැරදි සහගත සහ අනීතික පාඩුවක්; (ii) වැරදි සහගත ලෙස සහ අනීතික ලෙස තමන් විසින් ලබාගන්නා ලද හෝ දුන් අයෙකුට ලබාදුන් වාසියක්, ප්‍රතිලාභයක් හෝ වෙනත් උපකාරයන්; (iii) රජයට, කොමිෂන් සභාවට, උසස් අධ්‍යාපන ආයතනයකට, විද්‍යායතනයකට හිතාමතාම පාඩුවක් සිදු කරන චේතනාවෙන් කරන ලද වැරදි සහගත සහ අනීතික කටයුත්තක්; හෝ (iv) යම් තැනැත්තෙකු හට වැරදි සහගත ලෙස සහ අනීතික අයුරින් ලබාදුන්නා වූ වාසියක්, ප්‍රතිලාභයක් හෝ උපකාරයක් - — දූෂණය

(අ) සේවකයකු වශයෙන් තම නිල බලය භාවිතා කිරීම තුළින්;

(ආ) තම නිල බලයෙන් ලැබී ඇති බලතල භාවිතා කරමින් වෙනත් සේවකයෙකු හට යම් කර්තව්‍යයක් ඉටුකිරීමට යොමු කිරීම හෝ යම් කර්තව්‍යයක් ඉටුකිරීමෙන් වැළකී සිටීමට දැන්වීම තුළින්;

(ඇ) තම නිල තත්ත්වය නිසා, දැනගැනීමට ලැබුණු යම් තොරතුරක් භාවිතා කිරීම තුළින්;

(ඈ) සේවකයකු වශයෙන් තම නිල තත්ත්වය උපයෝගී කරගනිමින් යම් තීරණයක් ගැනීමට සහභාගී වීම තුළින්;

(ඉ) තමන්ගේ නිල තත්ත්වය භාවිතා කරමින්, සෘජුවම හෝ අන්‍යයාකාරයකින්, වෙනත් තැනැත්තකු යම් කර්තව්‍යයක් ඉටුකිරීමට යොදා ගැනීම හෝ එසේ ඉටුකිරීමෙන් වැළැක්වීමට කටයුතු කිරීම.

2.3 1978 අංක 16 දරන පනත සහ එහි සංශෝධන ද ඇතුළුව, එකී පනත යටතේ ක්‍රියාත්මක වන්නා වූ පනත් සහ නීතිද; පනතෙහි විධිවිධාන යටතේ අමාත්‍යවරයා විසින් දෙනු ලබන නියෝග ද, ඒ යටතේ පනවා ඇති ලිඛිත ව්‍යවස්ථා, නියමාවලි සහ රීති ද, වෙනත් යම් උචිත සාධන පත්‍රයන් ද; මෙම සංග්‍රහයෙහි සඳහන් නියමයන් ද; කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන ආයතනයන් හි නිලධාරීන් හෝ බලධාරීන් විසින් මෙහි 1 වන පරිච්ඡේදයේ 3.5.3. උප ඡේදයෙහි දන්වා ඇති පරිදි වරින් වර නිකුත් කරනු ලබන්නා වූ වෙනත් විධානයන් ද, උල්ලංඝනය කිරීම අදක්ෂභාවය, නොසැලකිල්ල, පක්ෂපාතිභාවය නොමැතිකම හෝ අනිසි හැසිරීම ආදී විශේෂිත වරදවල් යටතට ගැනෙන වරදක් ලෙස සැලකේ.

පනතෙහි හෝ උචිත සාධන පත්‍රයක නියමයන්ගෙන් බැහැරවීම

2.4 වරදක බරපතලකම තීරණය කළ යුත්තේ, වරදක් ලෙස ගැනෙන ක්‍රියාවක හෝ අඩුපාඩුවක, ස්වභාවය පමණක් සළකා බැලීමෙන් පසුව නොව, වරද සිදු කරන හෝ සිදුකල තැනැත්තා දරන තනතුර, ජ්‍යෙෂ්ඨත්වය හා පළපුරුද්ද, වගකීම් මට්ටම සහ එම වරදට සම්බන්ධ අනෙක් සියලුම කරුණුද සළකා බැලීමෙන් අනතුරුවය. සුළු වරදක් වුවද, අවවාද දී තිබිය දී හෝ යම් දඬුවමක් දී තිබිය දී, නැවත නැවතත් එම වරදම සිදුකරන්නේ නම්, විනයානුකූලව කටයුත් කිරීම සඳහා එකී වරදේ බරපතලකම වර්ධනය වී ඇති බව සැලකිය යුතු ය.

වරදක බරපතලකම

## 3. වරදවල් වාර්තා කිරීම

3.1 කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවයේ නියුතු සෑම තැනැත්තකුම, එම කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක යම් තැනැත්තකු විසින් විනයානුකූලව දඬුවම් ලැබිය හැකි වරදක් කර ඇති බව දැනගැනීමට ලැබුණු අවස්ථාවක දී, ඒ බව තම ඉහළ නිලධාරීන්ට

විශ්වවිද්‍යාල පද්ධතියේ සෑම තැනැත්තකුම වරදක් දුටුවිට වාර්තා කළ යුතු ය

දැන්වීමට බැඳී සිටී. එසේ දැන්වීමක් ලැබුණු පසු, අදාල ඉහළ නිලධාරියා, ඒ බව වහාම උචිත විනය බලධරයන් හට දැන්වීමට වගකීමෙන් බැඳී සිටී.

3.2 තමා යටතේ සේවය කරන තැනැත්තන්ගේ අකාර්යක්ෂමතාවය සහ අදක්ෂභාවය පිළිබඳව මෙන්ම, නොසැලකිල්ල, පාක්ෂිකභාවය නොමැතිකම, අනිසි හැසිරීම, අවිනය, දූෂණය හෝ නිර්මාණ කොල්ලය යන මෙම පර්විඡේදයේ විනයානුකූලව දඬුවම් ලැබිය හැකි වරදවල් ගණයට වැටෙන ක්‍රියාවන් පිළිබඳවද, තම ඉහළ නිලධාරීන් හට වාර්තා කිරීම අධීක්ෂණ නිලධාරීන්ගේ වගකීම වේ. අධීක්ෂණ නිලධාරීන්ගේ වගකීම

## 4. දඬුවම්

4.1 දඬුවම්, සුළු දඬුවම් සහ බරපතල දඬුවම් ලෙස වර්ගකොට තිබේ.

4.1.1 සුළු දඬුවම් ගණයට: සුළු දඬුවම්
අවවාද කිරීම; තදින් අවවාද කිරීම; තහනම් කිරීම; සතියක වැටුපට නොවැඩි දඩයක් පැනවීම; එක් වසරකට නොවැඩි කාලයක් සඳහා වැටුප් වර්ධකය නැවැත්වීම, අඩුකිරීම හෝ විලම්භනය කිරීම; විනය පරීක්ෂණයකට පසු අධිභාරයක් පැනවීම; සේවකයාගේම වියදමින් දරාගත යුතු පරිදි, විනය පරීක්ෂණයකට පසු සිදුකරන ස්ථාන මාරුවීම්; ඉහත දක්වා ඇති දඬුවම්වලට වඩා බරපතල නොවන වෙනත් ඕනෑම දඬුවමක් ඇතුලත් වේ.

4.1.2 බරපතල දඬුවම් ගණයට: බරපතල දඬුවම්
එක් වසරකට වැඩි කාලයක් සඳහා වැටුප් වර්ධක නැවැත්වීම, අඩුකිරීම හෝ විලම්භනය කිරීම; යම් නිශ්චිත කාලයක් සඳහා උසස්වීම් සඳහා පවත්වන පරීක්ෂණයකට පෙනී සිටීමට නුසුදුස්සකු ලෙස සැලකීම; යම් නිශ්චිත කාලයක් සඳහා උසස්වීමක් විලම්භනය කිරීම; යම් ශ්‍රේණියක ජ්‍යෙෂ්ඨත්වයෙන්, නිශ්චිත කාලයක් සඳහා පහළ දැමීම; තත්ත්වයෙන් පහළ දැමීම; එනම්, එම තනතුරේ ඊලඟ පහළ ශ්‍රේණියකට හෝ පංතියකට යැවීම හෝ පහළ තනතුරකට යැවීම; සාමාන්‍ය අකාර්යක්ෂමතාව හේතුකොට ගෙන සේවයෙන් විශ්‍රාම ගැන්වීම; විනය පරීක්ෂණයකින් අනතුරුව සේවය අවසන් කිරීම; කොමිෂන් සභාව විසින් පමණක් නියෝග කළ හැකි, සේවයෙන් පහකිරීම වෙනුවට සානුකම්පිත හේතු මත කරනු ලබන සේවයෙන් පහකිරීම හෝ අනිවාර්ය විශ්රාම යැවීම.

4.2 යම් යටත් සේවකයකු හට දඩයක් නියම කරන විටදී, එය අදාල තැනැත්තාගේ වැටුපට සාපේක්ෂව දරාගත හැකි ප්‍රමාණයෙන් නියම කළයුතු වේ. දඩය දරාගැනීමට හැකියාව

4.3 යම් තැනැත්තකු දරන තනතුරට අදාලව වැටුප් පරිමාණයක් නොමැතිවීම සහ එම තැනැත්තාට ගෙවනුයේ ඔහුගේ ස්ථිර වැටුපට අදාල වැටුප සහ දීමනාවක් වන අවස්ථාවකදී, මෙකී 4.1 උපඡේදයේ සඳහන් දඬුවම සඳහා සැලකිය යුතු "වැටුප් වර්ධකය" යනු, ඔහුගේ ස්ථිර වැටුපේ ඔහුට හිමි වැටුප් වර්ධකයයි. — වැටුප් පරිමාණයන් නොමැති වීම

4.4 "අවවාද කිරීම" දඬුවමක් නොවන අතර, එසේ අවවාද කරනු ලබන්නේ, යම් තැනැත්තකු විසින් එම වරදම හෝ අතපසුවීම් නැවත නැවත සිදුකිරීම හේතුවෙන් විනයානුකූලව කටයුතු කිරීමට ඉඩ ඇති බවට අනතුරු ඇඟවීම පිණිස ය. "අවවාද කිරීමක්" අදාල විනය බලධරයා විසින් සිදුකල යුතු අතර, එසේ අවවාද කල බව දන්වමින් නිකුත් කල ලිපියේ පිටපතක්, අදාල තැනැත්තාගේ පෞද්ගලික ලිපි ගොනුවේ ද ගොනුකල යුතු ය. — "අවවාද කිරීම"

## 5. විනයානුකූලව ක්‍රියා කිරීමේ බලය පැවරීම

5.1 කොමිෂන් සභාවට, පනතේ 7(3) සහ 8(3)(a) වගන්ති ප්‍රකාරව පැවරී ඇති එකී කාර්ය මණ්ඩල සාමාජිකයින් විෂයයෙහි විනයානුකූලව ක්‍රියා කිරීමේ බලය, යෝජනා සම්මතයෙන්, කොමිෂන් සභාවේ සභාපතිවරයා හට පැවරිය හැකි ය. — කොමිෂන් සභාව

5.2 පනතෙහි 45(2) (xii) වගන්තියට අනුව, විශ්වවිද්‍යාලයක කාර්ය මණ්ඩලය විෂයයෙහි එහි පාලක සභාවට පැවරී ඇති විනයානුකූලව ක්‍රියාකිරීමේ බලය, ආචාර්යවරුන් සහ නිලධාරීන් හැරෙන්නට අනෙකුත් තැනැත්තන් විෂයයෙහි ක්‍රියාත්මක කිරීමට, පාලක සභාවේ යෝජනා සම්මතයෙන්, එහි උපකුලපතිවරයා හට පැවරිය හැකි ය. — පාලක සභාව විසින් උපකුලපතිවරයාට

5.3 පනතෙහි 63(3) වගන්තියට අනුව, විශ්වවිද්‍යාල විද්‍යායතනයක කාර්ය මණ්ඩලය විෂයයෙහි එහි කළමනාකාර මණ්ඩලයට පැවරී ඇති විනයානුකූලව ක්‍රියාකිරීමේ බලය, ආචාර්යවරුන් සහ නිලධාරීන් හැරෙන්නට අනෙකුත් තැනැත්තන් විෂයයෙහි ක්‍රියාත්මක කිරීමට, එම කළමනාකරණ මණ්ඩලයේ යෝජනා සම්බන්ධයෙන්, අධ්‍යක්ෂවරයාට පැවරිය හැක. — කළමනාකරණ මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරයාට

5.4 මණ්ඩපයන්ට සහ ආයතනයන්ට අනුයුක්ත කාර්ය මණ්ඩල විෂයයෙහි විනයානුකූලව කටයුත් කිරීමේ බලය, එකී මණ්ඩපය/ආයතනය අනුයුක්තව හෝ අනුබද්ධිකව ඇති විශ්වවිද්යාලයේ පාලක සභාව සතුවේ. කෙසේ වුවද, අචාර්යවරුන් සහ නිලධාරීන් හැරෙන්නට අනෙකුත් තැනැත්තන් විෂයයෙහි විනයානුකූලව ක්‍රියාකිරීමේ බලය, අදාල පාලක සභාව විසින් එහි උපකුලපතිවරයාට පැවරිය හැකි ය. — මණ්ඩප සහ ආයතනයන්හි කාර්ය මණ්ඩලය සඳහා

5.5 විශ්වවිද්‍යාලයකට අනුයුක්ත කොට නොමැති උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක කාර්ය මණ්ඩලයේ විනය පාලනය එම උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයේ පාලක බල මණ්ඩලය මගින් පවරා දී ඇති අවස්ථාවලදී, එහි අධ්‍යක්ෂවරයා යටතට ගැනෙනු ඇත. — උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලය

5.6 විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සම්බන්ධ විනය පාලනය, පනතේ 84(1) සහ (2) වගන්තිවලට අනුව සිදුවේ. — විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ කාර්ය මණ්ඩලය

5.7 පනත මගින් විනය පාලනය පවරා දීම අනුව අවසර දී ඇති පරිදි, එක් එක් විනය බලධරයා වෙත පැවරී ඇති වැඩ ප්‍රමාණයෙහි අධික ස්වභාවය සලකා, කොමිෂන් සභාව විසින් හෝ උසස් අධ්‍යාපන ආයතනයක/විද්‍යායතනයක පාලක බල මණ්ඩලය විසින්, සුළු දඬුවම් පැනවීම සහ බරපතල දඬුවම් පැනවීමට අදාල බලය මෙම පරිච්ඡේදයේ අවසානයේ දක්වා ඇති 4.1.1. සහ 4.1.2. උපඡේදයන්හි සඳහන් (අ), (ආ), (ඇ) සහ (ඈ) යන උපලේඛනයන්ට අනුව පවරා දිය හැකි ය. — උපලේඛන (අ), (ආ), (ඇ) සහ (ඈ) අනුව බලය පවරා දීම

5.7.1 මෙම උපඡේදයෙහි සඳහන් විනයානුකූලව කටයුතු කිරීම පිළිබඳ බලය පවරාදීම, කුමන ආකාරයකින් හෝ ආචාර්යවරුන් සහ නිලධාරීන්ගේ විනය කටයුතු සම්බන්ධයෙන් අදාල නොවේ. — ආචාර්යවරුන් සහ නිලධාරීන්ට අදාල නොවේ

## 6. මූලික විමර්ශන සහ විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා පත්කරනු ලබන තැනැත්තන්

6.1 විනය බලධරයා විසින්, මෙහි පහත උපඡේදයෙහි සඳහන් ආකාරයට පත් කරනු ලබන, යම් තැනැත්තකු හෝ එවැනි තැනැත්තන් කිහිප දෙනෙකුගෙන් සමන්විත විනිශ්චය සභාවක් මගින් හෝ මූලික විමර්ශනයක් හෝ විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්විය හැකි ය. — විමර්ශන නිලධාරීන් හෝ විනිශ්චය සභා

6.1.1 මෙම පරිච්ඡේදයේ 1.3 උපඡේදයෙහි දක්වා ඇති පරිදි, පහත සඳහන් තැනැත්තන්, මූලික විමර්ශනයක් හෝ විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා නිසි විනය බලධරයා විසින් පත්කල කල්හි බලය ලබති. — මූලික විමර්ශන සහ විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමට බලය ලත් තැනැත්තන්

(අ) වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක/විද්‍යායතනයක විනය කරුණක් සඳහා යම් උසස් අධ්‍යාපන ආයතනයක/විද්‍යායතනයක පාලක බල මණ්ඩල සාමාජිකයකු;

(ආ) යම් උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු II වන ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරක්

දරන්නෙකු හෝ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී තනතුරක් දරන්නෙකු;

(ඇ) කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක විධායක ශ්‍රේණියකට අයත් යම් නිලධරයකු;

(ඇ) කොමිෂන් සභාවෙන්/උසස් අධ්‍යාපන ආයතනයකින්/විද්‍යායතනයකින් බැහැර වූ එහෙත් මූලික විමර්ශන හෝ විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමට අවශ්‍ය හැකියාව සහ පළපුරුද්ද සහිත තැනැත්තන්, කොමිෂන් සභාව/උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක පාලක බල මණ්ඩලය විසින් පත්කල විට;

(ඉ) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් විනය පරීක්ෂණ නිලධාරීන් ලෙස ලැයිස්තුගත කරන ලද නිලධාරීන්.

විමර්ශනයට භාජනය වී ඇති යම් සිදුවීමකට, කෙළින්ම හෝ වක්‍රාකාරයෙන් සම්බන්ධ තැනැත්තකු, මූලික විමර්ශනයක් පැවැත්වීමට හෝ විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට මෙන්ම පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටීමට එවැනි පරීක්ෂණ පැවැත්වෙන විට පත් නොකළ යුතු ය.

6.2 මූලික පරීක්ෂණයක් හෝ විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා යම් තැනැත්තකු පත්කරන විට, සිදුකර ඇති වරදේ බරපතලකම, අදාල වරදට සම්බන්ධ විෂය ක්ෂේත්‍රය පිළිබඳ ඔහුගේ දැනුම, චෝදනා ලද තැනැත්තාගේ ජ්‍යෙෂ්ඨත්වය සහ තත්ත්වය ආදි කරුණු ගැන ද සැළකිලිමත් වෙමින්, පරීක්ෂණය පැවැත්වීමට සුදුසු අයෙකු පත්කළ යුතු ය. සුදුසු තැනැත්තකු තෝරා ගැනීම

## 7. සුළු වරදක් සඳහා ලඝු දඬුවම් දීමේ ක්‍රමවේදය

7.1 මෙම පර්ච්ඡේදයේ 4.1.1. උපඡේදයෙහි සඳහන් කොට ඇති, සුළු දඬුවම්වලට වඩා බරපතල දඬුවමක් පැනවීමට යෝග්‍ය නොවන සුළු වරදක් සම්බන්ධයෙන් විධායක කාර්ය මණ්ඩලයේ නිලධරයෙකුට වඩා පහළ තත්ත්වයක් දරන අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු හට විනය ක්‍රියාමාර්ගයක් ගැනීමට අදහස් කරන අවස්ථාවක දී, ඔහුගේ ඊළඟ ඉහළ නිලධරයා (අධ්‍යයනාංශ/ අංශ/ මධ්‍යස්ථාන/ ඒකක ප්‍රධානියෙකු) හැකි සෑම අවස්ථාවකදීම එම කරුණු ගැන විමර්ශනයක් සිදුකළ යුතු ය. එවැනි අවස්ථාවකදී චෝදනාවට භාජනය වී ඇති තැනැත්තා හට, ඔහු විසින් කර ඇති වරද විධායක ශ්‍රේණිවලට පහතින් ඇති අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අදාළ වේ

සම්බන්ධයෙන් ලිඛිතව දැනුම්දිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් කරුණු දක්වන ලෙසට ද, එවැනි විෂමාචාරයක් සිදුකිරීම හේතුවෙන් දඬුවම් නොපැමිණ විය යුතු නම් එයට හේතු ද විමසා සිටිය යුතුය. අදාළ තැනැත්තා විමසා ඇති කරුණු දැක්වීම සිදුනොකරන්නේ නම්, ඔහුට ඒ සම්බන්ධයෙන් කිසිඳු කරුණු දැක්වීමක් සිදුකිරීමට නොමැති සේ සලකා අදාල විෂමාචාරයට වැරදිකරු ලෙසට නිගමනය කොට ක්‍රියාකිරීමට සිදුවන බවද එම ලිපියෙන්ම දැන්විය යුතු වේ.

7.2 චෝදනාවට භාජනය වී ඇති තැනැත්තා ඉදිරිපත් කල කරුණු, ඔහු අදාල වරදෙන් නිදහස් කිරීමට තරම් ප්‍රමාණවත් නොවන කල්හි හෝ දී ඇති කාලය තුළ තම නිදහසට කරුණු දැක්වීමට අපොහොසත් වන කල්හි, එසේ නිදහසට කරුණු විමසන ලද නිලධරයා විසින්, තම ඉහළ නිලධාරීන් මාර්ගයෙන් ඔවුන්ගේ නිර්දේශද සහිතව, සුදුසු විනයානුකූල පියවර ගැනීම සඳහා අදාල විනය බලධරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ. ඉහළ නිලධාරීන් මාර්ගයෙන් විනය බලධරයා වෙත වාර්තා කිරීම

7.3 එම තැනැත්තා සුළු වරදක් සඳහා වැරදිකරු බවට, විනය බලධරයා සෑහීමට පත්වූ විට, එකී විනය බලධරයා විසින් මෙම පරිච්ඡේදයේ 4.1.1. උපඡේදයෙහි සඳහන් සුළු දඬුවම් අතුරින් එක් දඬුවමක් නියම කරනු ඇත. සුළු දඬුවමක් සඳහා නියෝගය

7.4 ඉහත 7.1 උපඡේදයේ සඳහන් ආකාරයට පවත්වන ලද විමර්ශනයක් අවසානයේ දී, යම් තැනැත්තකු විසින් සිදුකර ඇති වරද, මෙම ඡේදයෙහි 4.1.2 උපඡේදයෙහි සඳහන් බරපතල දඬුවමක් ලැබීමට තරම් වන, බරපතල වැරැද්දක් බවට අනාවරණය වූ කල්හි, එම කරුණ මෙහි පහත 8 වන ඡේදයෙහි සඳහන්කොට ඇති ආකාරයට විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා යොමුකළ යුතු ය. බරපතල වරදක් අනාවරණය වූ විට

## 8. මූලික විමර්ශන සහ විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමේ ක්‍රමවේදය

8.1 මෙහි 4.1.2 උපඡේදය යටතේ බරපතල දඬුවම් ලබාදීමට යෝග්‍ය වරදක් සම්බන්ධයෙන් හෝ අදාළ තැනැත්තාට එරෙහිව සුළු වරදක් කිරීම සම්බන්ධයෙන්, මෙම පරිච්ඡේදයේ 7 වන ඡේදයෙහි සඳහන් සුළු වැරදි සඳහා වන ක්‍රියාපරිපාටිය අදාල නොවන කල්හි, කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් හෝ උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධරයා විසින් හෝ අනාවරණය වූ කරුණු වලට අනුකූල වන පරිදි අදාළ විනය බලධරයාගේ ආවරණ අනුමැතියට යටත්ව මූලික විමර්ශනයක් පැවැත්වීමට නියෝග කරනු ඇත. ක්‍රමවේදය

8.2 මූලික විමර්ශනය

මූලික විමර්ශනයක් යනු, හුදෙක් කරුණු ඇති සැටියෙන් සොයා ගැනීම පිණිස, මෙම පරිච්ඡේදයේ 6.1.1. උපඡේදයෙහි සඳහන් තැනැත්තෙකු හෝ තැනැත්තන් මූලික විමර්ශන ක්‍රමවේදය

විසින් පවත්වනු ලබන විමර්ශනයකි. මූලික විමර්ශනයක් පැවැත්වීමේ අරමුණ වන්නේ, සිදුවී ඇතැයි සැක කරනු ලබන සිද්ධියක සත්‍ය අසත්‍යතාවය සොයා ගැනීමට මෙන්ම යම් සේවකයෙකු හෝ සේවකයින් පිරිසක් විසින් විෂමාචාරයක් සිදු කර ඇත්ද සහ ඔවුනට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට ප්‍රමාණවත් එහි බැලූ බැල්මටම ඔප්පු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි තිබේද යන්න සොයා ගැනීම පිණිස ය.

ක්‍රියාමාර්ගය

8.2.1 මූලික විමර්ශනයක් පවත්වන විට, අදාළ තැනැත්තන්ගේ ප්‍රකාශ සටහන් කර ගැනීම, වාර්තා සහ ලේඛන සොයා බැලීම සහ පරීක්ෂා කිරීම, එකී වාර්තා සහ ලේඛනවල මුල් පිටපත් ලබා ගැනීම, අවශ්‍ය යැයි සැලකෙන සියලුම ලේඛන සහ භාණ්ඩ තම භාරයට ගැනීම සහ පරීක්ෂණය පවත්වන තැනැත්තා/තැනැත්තන් විසින් අනාවරණය කරගත් කරුණු වලට අනුව, සිදුකර ඇති විෂමාචාරය සම්බන්ධයෙන් ඔවුන්ගේ නිරීක්ෂණ හා නිර්දේශද ඇතුළත් විය යුතු වේ.

අවශ්‍ය වූ විට චූදිත තැනැත්තාගේ පෙනී සිටීම

8.2.2 මෙම ක්‍රියාවලිය "පරීක්ෂණයක්" වශයෙන් නොගැනෙන බැවින්, එම විමර්ශනය පැවැත්වෙන විට, චූදිත තැනැත්තා හෝ ඔහුව නියෝජනය කරමින් යම් තැනැත්තකු හෝ ප්‍රකාශ සටහන් කරන අවස්ථාවේදී පෙනී සිටීම අවශ්‍ය නොවේ. කෙසේ වුවද, චූදිත තැනැත්තා භාරයේ තිබූ භාණ්ඩ, ගබඩාව, උපකරණ හෝ විද්‍යුත් උපකරණ සහ මුදල් අදාළ වරද සම්බන්ධයෙන් පරීක්ෂා කරන අවස්ථාවේදී, තමන් එසේ පරීක්ෂා කරන අවස්ථාවේදී එහි පෙනී සිටිය බවට සහ එම පරීක්ෂණයේ ප්‍රතිඵල ගැන සෑහීමකට පත්වන බවට අදාල ලේඛනයන්හි තම අත්සන තබා සහතික කිරීම පිණිස රැඳී සිටිය යුතු වේ. එමෙන්ම, ඉහත සඳහන් භාණ්ඩ පරීක්ෂා කරන ලද්දේ චූදිත තැනැත්තා ඉදිරියේදී යන්න සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂිකරුවකුද එම අවස්ථාවේ දී සිටිය යුතුය. තවද, ඉදිරියේදී පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණයකදී ඉදිරිපත් කරනු පිණිස තෝරාගනු ලැබූ උපකරණ සහ භාණ්ඩ වෙන්කොට මුද්‍රා තබන අවස්ථාවේ දී එහි පෙනී සිටීමටද චූදිත තැනැත්තා හට හිමිකමක් ඇත.

අවම ප්‍රමාදයකින් යුතුව වාර්තාව භාරදීම

8.2.3 පරීක්ෂණ කටයුතු නිසි පරිදි පවත්වා ඉතාමත් කෙටි කාලයක් තුළදී අවසන් කොට අවම ප්‍රමාදයකින් යුතුව වාර්තාව භාරදීමට මූලික විමර්ශන ක්‍රියාවලියකට සම්බන්ධ සියලුම පාර්ශවයන් වග බලා ගත යුතු ය.

8.2.4 නිසි ආකාරයෙන් පත්කරනු ලැබූ විමර්ශන නිලධාරියකු/නිලධාරීන් විසින්, යම් තැනැත්තෙකු හට ප්‍රකාශයක් කිරීම සඳහා කැඳවන ලද අවස්ථාවේ දී, එසේ ප්‍රකාශයන් ලබාදීම ප්‍රතික්ෂේප කිරීම බරපතළ විෂමාචාරයක් ලෙස සැලකේ. එවැනි ප්‍රතික්ෂේප කිරීමක් සම්බන්ධයෙන්, විමර්ශන නිලධාරියකු/ නිලධාරීන් විසින් වාර්තා කළ විට, අදාළ තැනැත්තාට එරෙහිව විනයානුකූලව ක්‍රියා කිරීම පිණිස, ඒ බව නියමිත විනය බලධාරයා හට වාර්තා කිරීම අදාළ බලධරයන්ගේ වගකීම වන්නේ ය.

ප්‍රකාශයක් ලබාදීමට ප්‍රතික්ෂේප කිරීම

8.2.5 මූලික විමර්ශනයක් පැවැත්වෙන අතරතුර දී, චූදිත සේවකයා හෝ සේවකයින් විසින් කිසියම් විෂමාචාරයක් තමන් විසින් සිදුකළ බවට පිළිගත්තද, විමර්ශනය අවසානයක් දක්වා ම පවත්වා, එහි වාර්තාව අදාළ බලධාරීන් වෙත ලබාදීම මූලික විමර්ශනය පවත්වන තැනැත්තා/ තැනැත්තන්ගේ වගකීම වන්නේ ය.

විමර්ශනය අවසානයක් වන තුරු පවත්වාගෙන යාම

එමෙන්ම, මූලික පරීක්ෂණය අවසානයේ දී, චූදිත සේවකයා/සේවකයින්ට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීමට ප්‍රමාණවත් කරුණු අනාවරණය වී ඇති අවස්ථාවක දී මූලික විමර්ශනය පවත්වනු ලැබූ තැනැත්තා/තැනැත්තන් විසින්, තම පරීක්ෂණය අවසානයේ දී චෝදනා පත්‍රයක කෙටුම්පත් ද අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කළ යුතු ය.

8.2.6 8.2.6.1 මූලික පරීක්ෂණයක් අවසානයේදී, එහි මූලික පරීක්ෂණය පැවැත්වූ මූලික පරීක්‍ෂණ නිලධාරියා විසින් ලබාදෙනු ලබන වාර්තාව, නිසි පරිදි අදාළ ලේඛන ද සමඟ භාර ගැනීමට පාලක බල මණ්ඩලයේ ලේකම්වරයා හෝ වෙනත් සුදුසු නිලධාරියෙකු හට නියම කිරීම, එහි මූලික විමර්ශනය පැවැත්වීමට නියෝග කළ විනය බලධරයාගේ වගකීම වන්නේ ය.

වාර්තාව ඉදිරිපත් කිරීම

8.2.6.2 මූලික විමර්ශන නිලධාරියාගෙන් ලබාගත් පරීක්ෂණ වාර්තාව සහ එහි අඩංගු ලේඛනවල රහස්‍යභාවය සහ සුරක්‍ෂිත භාවය ආරක්ෂා කර ගැනීම අදාළ විනය බලධරයාගේ වගකීම වන්නේ ය. මෙම ලේඛන භාරයේ තැබීම, ඉහත 8.2.6.1 හි සඳහන් අදාළ විනය බලධාරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා සතු වේ.

වාර්තාව සහ ලේඛනවල රහස්‍යභාවය හා සුරක්ෂිතභාවය රැකීම

8.2.6.3 විමර්ශන නිලධාරියා විසින් භාරදෙන ලද සියලුම ලේඛන දැඩි පරීක්ෂාවට භාජනය කිරීමෙන් අනතුරුව, එකී පරීක්ෂණය නිසි පරිදි සහ පූර්ණ වශයෙන් පවත්වා ඇති බවට අදාළ විනය බලධරයා සෑහීමකට පත්විය යුතු ය.

8.2.6.4 මූලික විමර්ශනය අවස්ථාවේ දී, කිසියම් විෂමාචාර ක්‍රියාවක් සිදුවී ඇති බව අනාවරණය නොවූ විට, විනය බලධරයා විසින් සියලුම මූලික විමර්ශන කටයුතු සහ විනයානුකූල ක්‍රියාමාර්ග අවසන් කොට, ඒ බව ලේඛනගත කිරීමට ක්‍රියා කළ යුතු වේ. — විෂමාචාර ක්‍රියාවක් අනාවරනය නොවූ විට

8.2.6.5 මූලික විමර්ශන වාර්තාවට අනුව යම් විෂමාචාරයක් සිදු වී ඇතැයි යන්න අනාවරණය වී ඇති අවස්ථාවක දී, එකී වාර්තාවන් සහ ලේඛන මනා අධ්‍යයනයකින් පසු මූලික විමර්ශන නිලධාරියා විසින් ලබාදුන් චෝදනා පත්‍රයේ කෙටුම්පත සහ වාර්තාව එලෙසින්ම භාරගැනීමට හෝ එහි යම් වෙනස්කම් සිදුකල යුතු ද යන්න විනය බලධරයා විසින් නිගමනය කළ හැකි ය. එකී චෝදනා පත්‍රයේ කෙටුම්පත හෝ වාර්තාව හෝ සාක්ෂි හෝ වෙනස් කළයුතු යැයි විනය බලධරයා අදහස් කරන විට, ඉතා ඉක්මනින් එම වෙනස්කම් සිදුකිරීමට කටයුතු කළ යුතු වේ. — විෂමාචාර ක්‍රියාවක් අනාවරනය වූ විට

8.2.6.6 තමන් වෙත ලැබී ඇති සියළුම ලේඛන නිසි පරිදි පරීක්ෂා කිරීමෙන් අනතුරුව, චූදිත තැනැත්තාට එරෙහිව චෝදනා ගොනු කිරීමට හෝ ඔහුගෙන් නිදහසට කරුණු විමසීමට තරම් හේතු වන කරුණු නොමැති බවට, විනය බලධරයා නිගමනය කළ විට, එම කරුණු අදාළ පරිදි ලේඛනගත කොට විනය ක්‍රියාමාර්ගය අවසන් කළ හැකි ය. — විනය ක්‍රියාමාර්ගය අවශානම් කිරීම

8.2.6.7 තමන් වෙත ලැබී ඇති සියලුම ලේඛන නිසි පරිදි පරික්ෂා කිරීමෙන් අනතුරුව, යම් සේවකයෙකු හට විරුද්ධව චෝදනා ගොනු කිරීමට හෝ ඔහුගේ නිදහසට කරුණු විමසීමට හෝ අවශ්‍ය කරුණු යෙදී ඇතැයි අදාළ විනය බලධරයා අදහස් කරන විට, මෙහි දක්වා ඇති පරිදි විනය ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කළ යුතු වේ. — විනය ක්‍රියාමාර්ග ඉදිරියට ගෙනයාම

8.2.7 මූලික විමර්ශනයක් පැවැත්වෙද්දී, සාපරාධි වරදක් කර ඇති බවට හෝ අල්ලස් ගැනීමක් අනාවරණය වීමක් හෝ ඒ පිළිබඳ සැකකිරීමට කරුණු යෙදී තිබීමක් වැනි අවස්ථාවක දී, මෙම පරිච්ඡේදයේ 16 වැනි ඡේදයෙහි සඳහන් ආකාරයට කටයුතු කළ යුතු ය. — සාපරාධි වරදක් හෝ අල්ලස් ගැනීමක් අනාවරණය වූ විට

8.3 මූලික විමර්ශනයේදී, සැක කරන තැනැත්තකු හට බැලූ බැල්මට පෙනෙන ආකාරයේ වරදක් සිදුකොට ඇතැයි යන්න අනාවරණය වූවහොත්, ඔහුට විරුද්ධව දඬුවම් නොකළ යුත්තේ මන්ද යන්නට, නිදහසට කරුණු විමසමින් චෝදනා පත්‍රයක් නිකුත් කළ යුතු ය. සකස් කර ඇති චෝදනා පත්‍රය සඳහා අදාළ විනය බලධාරයාගේ අනුමැතිය ලබා ගත යුතු අතර, කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයා වැනි අපක්ෂපාතී පුද්ගලයකු විසින් එම චෝදනා පත්‍රය අත්සන් කොට නිකුත් කිරීමට කටයුතු යෙදිය යුතු ය. — නිදහසට කරුණු දැක්වීමේ දැන්වීම

8.3.1 චෝදනා පත්‍රය නීතිමය ආකෘතියකට අනුව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ. එහි දී අවශ්‍ය වන්නේ එම තැනැත්තා විසින් සිදු කරන ලදැයි සැලකෙන හෝ සිදුකරන ලද යම් විෂමාචාරයක්, අඩුපාඩුවක් හෝ මගහැරීමක් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට පිළියෙල කරන ලද පැහැදිලි සහ සරල කරුණු ඇතුළත් ප්‍රකාශයකි. එමෙන්ම එකී චෝදනා පත්‍රයේ සඳහන් කරනු ලබන වැරදි, මෙහි 2.2 උපඡේදයෙහි සඳහන් කොට ඇති වරදවල් තුළට ගැලපීමටද අවශ්‍ය වන්නේ නැත. කෙසේ වුවද, චූදිත තැනැත්තකුහට චෝදනා පත්‍රයක් නිකුත් කිරීමේදී, පහත සඳහන් කරුණු අනුගමනය කළ යුතු වේ. — චෝදනා පත්‍රයක් නිකුත් කිරීම

(අ) විනය බලධරයකු විසින් හෝ එම බලධරයා විසින් බලය පවරන ලද වෙනත් බලධරයකු විසින් චූදිත සේවකයකු හට චෝදනා පත්‍රයක් නිකුත් කිරීමේදී, එම චෝදනා පත්‍රය මෙම සංග්‍රහයේ XVII පරිශිෂ්ඨයේ සඳහන් ආකෘතියට අනුව නිකුත් කල යුතුය. — XVII වන පරිශිෂ්ඨය

(ආ) එම චෝදනා පත්‍රය අදාළ තැනැත්තාගේ නම සහ තනතුරට ආමන්ත්‍රණය කරමින් ඔහුගේ ඉහළ නිලධාරීන් මාර්ගයෙන් හෝ ඔහු විසින් ලබා දී ඇති පදිංචි ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු යි.

(ඇ) එහිදී, සිදු කර ඇති වරද මෙහි 4.1.1 උපඡේදයෙහි සඳහන් පරිදි (සුළු දඬුවම්) හෝ මෙහි 4.1.2 උපඡේදයෙහි සඳහන්

පරිදි (බරපතල දඬුවම්) දඬුවම් ලබාදීමට හැකි ආකාරයේ වරදක්ද යන්න ගැන සඳහන් කළ යුතු ය.

(ඇ) සිදුකර ඇති වරදවල් (චෝදනා) සම්බන්ධයෙන් පැහැදිලි සහ බහු අර්ථයක් නොමැති විස්තරයක් සැපයිය යුතුය. එල්ල කර ඇති චෝදනාවන්ට ගැළපෙන ආකාරයෙන්, යම් වරදක් සිදුකොට ඇති දිනය, වේලාව සහ ස්ථානය ද දැන්විය යුතු ය.

(ඉ) පරීක්ෂණයට භාජනය වී ඇති කරුණට අදාළ සාක්ෂි සහිත ලේඛන ගැන සඳහන් ලැයිස්තුවක්ද ලබාදිය යුතුය. එම ලේඛන චූදිත තැනැත්තා විසින් හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පරීක්ෂා කළ හැක්කේ කුමන ස්ථානයකදී, කුමන ආකාරයෙන්ද යන්න ගැනද දැනුම් දීමට අවශ්‍ය වේ. මෙම ලේඛනවලට බොහෝ විට, මූලික විමර්ශනයේ දී ලබා දුන් සාක්ෂි ආදියද ඇතුළත් විය හැකි ය.

**සටහන:**

අදාල ලේඛන භාරව සිටින නිලධාරියාගේ අභිමතය පරිදි, එම නිලධරයා විසින් නියම කරනු ලබන මුදලක් ගෙවීමෙන් අනතුරුව, පරීක්ෂාවට භාජනය වී ඇති ලේඛන වල පිටපත් ලබා ගැනීමට අවස්ථාව දිය හැකි ය.

(ඊ) දක්වා ඇති චෝදනාවන්ට පිළිතුරු සැපයිය යුත්තේ කවර දිනයකට පෙර ද යන්න ගැන ද, අදාළ චෝදනා පත්‍රයේ සඳහන් විය යුතුය. එසේ දින නියම කරන විට, චෝදනාවන්ගේ සංකීර්ණත්වය සහ හොඳින් සලකා බලා පිළියෙල කරන ලද පිළිතුරක් සැකසීමට ගතවන කාලය ගැනද අවශ්‍ය අවධානය යොමු කළ යුතු වේ.

**සටහන:**

චූදිත තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත ඉල්ලීමක් පාදක කරගනිමින්, කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයා විසින් තම අභිමතය පරිදි අදාල තැනැත්තාට එරෙහිව නගා ඇති

චෝදනාවන්ට පිළිතුරු දීම සඳහා තවත් කාලයක් දීර්ඝ කිරීමට අවසර දිය හැකි ය.

(උ) විධිමත් විනය පරීක්ෂණයේ දී නගා ඇති චෝදනා සනාථ කිරීම පිණිස සාක්ෂි දීම සඳහා කැඳවනු ලබන තැනැත්තන්ගේ නම්, තනතුරු, වර්තමාන සේවා ස්ථානයන් ආදී තොරතුරු ද අදාළ චෝදනා පත්‍රයේ සඳහන් කළ යුතු ය.

(ඌ) තමා වෙනුවෙන් පෙනී සිටීම සඳහා යම් නිලධාරියකු පත් කිරීමට, චූදිත තැනැත්තා හට අවසර තිබේද යන්න ගැනද චෝදනා පත්‍රයේ සඳහන් විය යුතු වේ.

(එ) එමෙන්ම, නියමිත කාලය තුළදී, නගා ඇති චෝදනාවන්ට පිළිතුරු සැපයීමට අපොහොසත් වන්නේ නම් ගැනීමට සිදුවන ක්‍රියාමාර්ගයන් ගැනද එම චෝදනා පත්‍රයේ සඳහන් කළ යුතු වේ.

8.3.2 අවශ්‍ය වූ අවස්ථාවක දී, අවසාන චෝදනා පත්‍රය සකස් කිරීම සඳහා නියමිත විනය බලධරයා විසින්, ආයතනයේ නීති නිලධාරියාගේ හෝ නීතිඥයෙකුගේ සහාය ලබා ගැනීමට කටයුතු කළ හැකි ය.

*නීති නිලධාරියාගේ /නීතිඥයෙකුගේ සහාය ලබා ගැනීම*

8.3.3 යම් තැනැත්තෙකුට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණ ඇතිව විධිමත් චෝදනා පත්‍රයක් නිකුත් කර ඇති අවස්ථාවක දී, එම පරීක්ෂණයේ අවසන් නිගමනය ලැබෙන තෙක්, එම තැනැත්තාගේ වැටුප් වර්ධක, උසස්වීම්, විදේශ සංචාර, ශිෂ්‍යත්ව, වැටුප් සහිත අධ්‍යයන නිවාඩු, ණය සහ අත්තිකාරම්, මෙරටදී හෝ විදේශයකදී ගත කිරීමට ලබා දෙන වැටුප් රහිත නිවාඩු ආදී සියල්ලක්ම අත්හිටුවිය යුතු ය.

*වරප්‍රසාද අත්හිටුවිය යුතු ය*

8.4 යම් තැනැත්තකු හට චෝදනා පත්‍රයක් නිකුත් කොට ඇතිවිට, ඔහු විසින් ලබා දී ඇති කාලය තුළදී ඒ සඳහා සම්පූර්ණ සහ විධිමත් පිළිතුරක් ලබාදිය යුතු වේ. තමාට විරුද්ධව නගා ඇති චෝදනාවන්ට "වරදකරු නොවෙමි" යන්න පමණක් පිළිතුරු වශයෙන් සඳහන් කිරීමට ඔහුට අවකාශ නොමැත. නියමිත ආකාරයට විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම වෙනුවට, ඉදිරිපත් කොට ඇති ලේඛන පමණක් සලකා බලමින් තීරණයක් ගෙන දඬුවම් පැනවීමට විනය බලධරයාහට බලය තිබෙන බව, චූදිත තැනැත්තා සිහියේ තබා ගත යුතු ය.

*සම්පූර්ණ සහ විධිමත් පිළිතුරක් ලබාදිය යුතුය.*

8.4.1 චෝදනාවන්ට පිළිතුරු ඉදිරිපත් කරන විට, තමාගේ නිදොස් බව ඔප්පු කිරීම සඳහා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන සියලුම ලේඛනවල මුල් පිටපත් හෝ සහතික කරන ලද පිටපත් මෙන්ම, තමා වෙනුවෙන් සාක්ෂි දීමට ඉදිරිපත් වී සිටින සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ ඇතුළත් දිවුරුම් ප්‍රකාශ ද චූදිත තැනැත්තා විසින් ඉදිරිපත් කළ යුතු වේ.

පිළිතුර සමඟ එවිය යුතු ආධාරක ලේඛන

8.5 යම් තැනැත්තකු තමාට විරුද්ධව නඟා ඇති චෝදනාවන්ට දී ඇති කාලය තුළදී හිතාමතාම පිළිතුරු සැපයීමට අපොහොසත් වන අවස්ථාවකදී, එකී චූදිත තැනැත්තා නඟා ඇති සියලුම චෝදනාවන්ට හෝ එයින් කොටසකට හෝ වරදකරුවන බවට අදාළ විනය බලධරයා හට නිගමනය කලහැකි අතර, ඒ සඳහා යම් සුදුසු විනය ක්‍රියාමාර්ගයක් හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට ද හැකියාව තිබේ.

චූදිත තැනැත්තා පිළිතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරන විට හෝ නොදී සිටින විට

8.6 චූදිත සේවකයා විසින් තමාට විරුද්ධව නගා ඇති චෝදනාවන් අතුරින් එක් චෝදනාවකට හෝ චෝදනා කිහිපයකට පමණක් වරදකරු බවට පිළිතුරු දී ඇති විටකදී හෝ එකී චූදිත සේවකයා එක් චෝදනාවකට හෝ චෝදනා කිහිපයකට හෝ වැරදිකරු වන බවට අනාවරණය වී ඇති විටෙකදී වුවද, එම සේවකයාට විරුද්ධව චෝදනා පත්‍රයහි සඳහන්කොට ඇති සියලුම චෝදනාවන් විභාග කිරීම සඳහා විනය බලධරයා නියෝග කළ යුතු ය.

සියලුම චෝදනාවන් විෂයයෙහි පරීක්ෂණ පැවැත්වීම

8.7 චූදිත සේවකයා විසින් දී ඇති පිළිතුරු වලට අනුව, ඔහු එම පිළිතුරු තුළින් ප්‍රමාණවත් පරිදි තම නිර්දෝෂී භාවය සනාථ කොට තිබෙන බව අනාවරණය වූ කල්හි, විනය බලධරයා විසින්, එකී චූදිත සේවකයා සියලුම චෝදනාවලින් නිදහස් කලයුතු වේ.

නිර්දෝෂීභාවය සනාථ කිරීමට ප්‍රමාණවත් පිළිතුරු

විනය බලධරයාට අනුව, චූදිත තැනැත්තා තම පිළිතුරු තුළින් නගා ඇති චෝදනාවන්ගෙන් සම්පූර්ණයෙන්ම නිදොස් වී නොමැති බවට අනාවරණය වූ කළ, චෝදනා ලබා දී ඇති වරදවල් සුළු දඬුවම් ලැබිය හැකි වරදක් නම්, එයට සුදුසු දඬුවමක් නියම කිරීමට හෝ නගා ඇති චෝදනා බරපතල දඬුවම් ලැබිය හැකි වරදක් නම්, අදාල විධිමත් විනය පරීක්ෂණය පැවැත්වීම සඳහා සහ අවශ්‍ය නිර්දේශ යනාදිය ඉදිරිපත් කිරීම සඳහා විනය පරීක්ෂණ නිලධාරියකු හෝ විනිශ්චය සභාවක් පත් කළ යුතු වේ.

නිර්දෝෂීභාවය ඔප්පු නොවූ විට

8.8 චෝදනා පත්‍රයක් ලැබූ තැනැත්තකු විසින් තමා හට එල්ල කර ඇති චෝදනාවන්ට වැරදිකරු යයි පිළිගත් විට, එසේ වැරදිකරු යයි පැවසීම පිළිගෙන, සුදුසු දඬුවමක් නියම කිරීමට විනය බලධරයාහට තීරණය කිරීමට හැකිවේ. කෙසේවුවද, එසේ වරද පිළිගත් අවස්ථාවකදී පවා කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන ආයතනයක්/ විද්‍යායතනය ක්‍රියාකාරීත්වයට සාධාරණයක් ඉටු විය යුතු යයි විනය බලධරයා අදහස් කරන විට, විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු යෙදිය හැකි ය.

"වැරදිකරු" බව පිළිගැනීම

8.9 කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක්/ විද්‍යායතනයක ඉහළ නිලතල දරන නිලධාරීන් සම්බන්ධ වූ බරපතල වැරදි වලදී, විනය බලධරයා විසින් තම අභිමතය පරිදි, තැනැත්තකුගෙන් හෝ තිදෙනෙකුට නොවැඩි තැනැත්තන් සංඛ්‍යාවකින් සැදුම්ලත් විනිශ්චය සභාවක්/පරීක්ෂණ මණ්ඩලයක් පත් කළ හැකි ය. එසේ පත්කරනු ලබන තැනැත්තන් තෝරා ගත යුත්තේ, මෙහි ඉහත හය වැනි (6) ඡේදයේ සඳහන් විනය පරීක්ෂණ පැවැත්වීමට බලයලත් තැනැත්තන් අතුරින් ය.

ඉහළ නිලතල දරන තැනැත්තන් සම්බන්ධයෙන්

8.10 මූලික විමර්ශනයක් හෝ විධිමත් විනය පරීක්‍ෂණයක් පැවැත්වීමට පත් කරනු ලබන තැනැත්තෙකු, චූදිත තැනැත්තාට වඩා ජ්‍යෙෂ්ඨ තනතුරක් දරන්නෙකු විය යුතු වේ.

පරීක්ෂණ නිලධරයා ඉහළ තනතුරක් දරන්නෙකු වීම

8.11 මූලික විමර්ශනය පැවැත්වීම සම්බන්ධ වූ තැනැත්තෙකු, විධිමත් විනය පරීක්ෂණය පැවැත්වීමට ද පත් නොකළ යුතු ය.

මූලික විමර්ශනයට සම්බන්ධ වූ තැනැත්තන්

8.12 යම් විමර්ශන නිලධරයෙකුට හෝ විනිශ්චය සභාවකට පත් කිරීමේ ලිපි නිකුත් කිරීම සඳහා කොමිෂන් සභාවේ සභාපතිවරයාට/ උසස් අධ්‍යාපන ආයතනයක්/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයා හට බලය පැවරීම, විනය බලධරයන්ගේ වගකීම වේ. තිදෙනෙකුට නොවැඩි තැනැත්තන්ගෙන් සමන්විත විනිශ්චය සභාවක් පත්කල විට, එම තැනැත්තන් අතුරින් එක් අයෙකු එකී විනිශ්චය සභාවේ සභාපතිවරයා ලෙස, විනය බලධරයා විසින් පත්කළ යුතු ය.

විමර්ශන නිලධාරීන්/විනිශ්චය සභාවට පත්කිරීමේ ලිපි නිකුත් කිරීම

## 9. ලිපි ලේඛන

මෙම පරිච්ඡේදයට අදාළ සියලුම අවස්ථාවන්හිදී, විමර්ශනයකදී ලිපි ලේඛන ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් ක්‍රියා පරිපාටිය අනුගමනය කළ යුතු ය.

ලිපි ලේඛන ඉදිරිපත් කිරීම

9.1 විධිමත් චෝදනා පත්‍රයකින් දක්වා ඇති චෝදනා ඔප්පු කිරීමට අදාලව ඉදිරිපත් කරන්නා වූ සියලුම ලිපි ලේඛන, අදාළ චෝදනා පත්‍රයේ වාර්තාගත සාක්ෂි ලෙස සඳහන් කොට ඇති ලිපි ලේඛන විය යුතු ය. චෝදනා පත්‍රය, නිසි අවසරයකින් පසු සංශෝධනය කරන අවස්ථාවකදී, අලුත් ලිපි ලේඛන හඳුන්වා දිය හැකි වේ.

9.2 පැමිණිල්ල මෙහෙයවන නිලධරයා විසින්, පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ලේඛන, ඉහත 9.1 උපඡේදයට අනුව, තමා විසින්ම හෝ සාක්ෂිකරුවන් මාර්ගයෙන් ඉදිරිපත් කළ හැකි ය.

9.3 කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන ආයතනයක්/ විද්‍යායතනයක භාරයේ තිබෙන යම් රාජකාරී ලේඛනයක මුල් පිටපත්, මෙම පරිච්ඡේදයේ විධි විධාන

රාජකාරී ලේඛන

යටතේ කුමන හෝ පරීක්‍ෂණයක් සඳහා ඉදිරිපත් කළ යුතු නොවේ. විනය පරීක්ෂණ නිලධරයා හට යම් ලේඛනයක මුල් පිටපත පරීක්ෂා කළ යුතු යැයි දැන්වූ අවස්ථාවකදී හැර, යම් ලේඛනයක සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කිරීම සෑහේ.

9.4 ඉහත 9.3 උපඡේදය යටතේ රාජකාරි ලේඛනයක් ලෙස සඳහන් නොවූ ලේඛනයක්, පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන විට, එහි මුල් පිටපතම ඉදිරිපත් කළ යුතු ය.

රාජකාරී නොවන ලේඛන

කරුණු එසේ වුවද, රජයේ කාර්යාලයක, රජයේ සංස්ථාවක, පළාත් සභාවක හෝ පළාත් පාලන ආයතනයක එදිනෙදා රාජකාරී කටයුතු පවත්වාගෙන යාම සඳහා භාවිතා කරන්නා වූ ලේඛනයක් හෝ රෙජිස්ටරයක (හෝ වෙනත් එවැනි පොතක රෙජිස්ටරයක සහතික කළ පිටපතක්) සහතික කළ පිටපතක් යම් පරීක්ෂණයකදී ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ. එහි දී, එම ලේඛනය/ රෙජිස්ටරය අදාළ කාර්යාලය, රාජ්‍ය සංස්ථාව, පළාත් සභාව හෝ පළාත් පාලන ආයතනය මගින් ඉදිරිපත් කරන ලද සත්‍ය ලේඛනයක් බවට කරුණු ඉදිරිපත් කිරීමක් අවශ්‍ය නොවේ. වැඩිදුරටත්, එවැනි ලේඛනයක සත්‍ය/ අසත්‍යතාවය ගැන තම විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට අදාළව සාක්ෂි කැඳවීමට චූදිත පාර්ශවයට හැකියාව ඇත.

9.5 විමර්ශන නිලධාරියාගේ/විනිශ්චය සභාවේ අදහසට අනුව සාධාරණය ඉටුවීම පිණිස, යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂිය සනාථ කිරීමට යම් ලේඛනයක කරුණු ඉදිරිපත් කිරීම අවශ්‍ය යැයි සැලකෙන අවස්ථාවක දී හැර සාක්ෂිකරුවන් විසින් ලේඛන ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. එසේ නොමැතිව, යම් එවැනි ලේඛනයක්, පරීක්ෂණයට ඉදිරිපත් කළ ලේඛනයක් ලෙස සලකා, චූදිත පක්ෂයට දැන ගැනීමට සලස්වා පරීක්ෂණයේ වාර්තාවල එවැනි ලේඛනයක් ඉදිරිපත් කළ බවට සඳහන් කළ යුතු වේ.

සාක්ෂිකරුවන් විසින් විධිමත් ලෙස ලේඛන ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ

9.6 යම් චූදිත තැනැත්තෙකුට හෝ ඔහුගේ නියෝජිතයකු හට එම චූදිත තැනැත්තාට විරුද්ධව භාවිතා කිරීමට අදහස් කරන්නාවූ ලේඛන පරීක්ෂා කිරීමට අවසර දිය යුතු ය. සාමාන්‍යයෙන්, චූදිත තැනැත්තා හට පිළිතුරු ලබාදීමට දී ඇති කාලය ද සැලකිල්ලට ගෙන ප්‍රමාණවත් කාලයක් මේ සඳහා ලබාදිය යුතුවේ. එහෙත්, පරීක්ෂණය පැවැත්වෙන අවස්ථාවේදී යම් ලේඛනයක් ඉදිරිපත් කළ විට, එම ලේඛනය චූදිත පාර්ශවයට පෙන්වා, අවශ්‍ය නම් ඔවුනට එකී ලේඛනය පරීක්ෂා කිරීමට අවශ්‍ය කාලය, පරීක්ෂණය සුළු වෙලාවකට අත්හිටුවා ලබාදිය හැකි ය.

චූදිත තැනැත්තන් විසින් ලේඛන පරීක්ෂා කිරීම

9.7 කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක බලයලත් නිලධරයකු විසින් සහතික කරන ලද රහස්‍ය ලේඛන විෂයයෙහි මෙහි ඉහත 9.6 උපඡේදයෙහි සඳහන් නියමයන් බල පැවැත්වෙන්නේ නැත. එවැනි ලේඛන විමර්ශන නිලධරයා/ විනිශ්චය සභාව විසින් පරීක්ෂා කළ යුතු අතර, එවැනි ලේඛනයක් හෝ එයින් කොටසක් චූදිත තැනැත්තාට එරෙහිව භාවිතා කරන විටකදී, එම ලේඛනය හෝ එහි අදාළ කොටස චූදිත තැනැත්තා හට පෙන්විය යුතු ය. — රහස්‍ය ලේඛන

9.8 විමර්ශන නිලධරයා/විනිශ්චය සභාව විසින්, පරීක්ෂණයේදී සාක්ෂි වශයෙන් ඉදිරිපත් නොවුවද, අවසන් නිගමනයට පැමිණීම සඳහා උපයෝගී කරගත්, යම් නීතියකට, රෙගුලාසියකට, හැන්සාඩ් වාර්තාවට, මැනුම්පති විසින් හෝ ඔහුගේ පහළ නිලධරයකු විසින් අත්සන් තබන ලද සිතියමකට/සැලසුමකට, ගැසට් පත්‍රයකට, රජය විසින් හෝ පාර්ලිමේන්තුව විසින් තමන්ට පවරා ඇති බලය යටතේ පළ කරන ලද පොතකට, කොමිෂන් සභාව විසින් පළ කරන ලද රීති, චක්‍රලේඛ සහ නියමාවලියකට, මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද යම් චක්‍රලේඛයකට හෝ මුදල් රෙගුලාසියකට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයක අඩංගු කරුණු, ඉහත 9.6 උපඡේදයෙහි සඳහන් කරුණු හා බල නොපවත්වනු ඇත. — සාක්ෂි වශයෙන් ඉදිරිපත් නොකළ ලේඛන

9.9 පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කරනු ලබන ලේඛන, ඒවා ඉදිරිපත් කරන අනුපිළිවෙලට අනුව පැ.1, පැ.2, පැ.3 ආදී වශයෙන් සලකුණු කොට දැක්විය යුතුය. ඒ ආකාරයෙන්ම, චූදිත පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලේඛන ඩී1, ඩී2, ඩී3 වශයෙන් සලකුණු කොට, ඉදිරිපත් කරන අනුපිළිවෙලට අනුව ගොනු කළ යුතු ය. — ලේඛන සළකුණු කිරීම සහ ඉදිරිපත් කිරීම

එහි සෑම ලේඛනයක්ම, විමර්ශන නිලධාරියා/විනිශ්චය සභාව විසින් තම අත්සන/අත්සන් යොදා පරීක්ෂණ සටහන් සමග අමුණා විනය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතුවේ.

9.10 විධිමත් විනය පරීක්ෂණයක් අවසන් වූ විට සාක්ෂි වශයෙන් සලකුණු කරන ලද ලේඛන පැමිණිල්ල මෙහෙයවන නිලධරයා විසින් සහ චිත්තිය වෙනුවෙන් පෙනී සිටින නිලධරයා විසින් අදාළ විමර්ශන නිලධරයාට/විනිශ්චය සභාවට යැවිය යුතු ය. එම ලේඛනවල පිටපත් තමන් වෙත තබා ගැනීම ඔවුන් හට පැවරී ඇති වගකීමකි. — විමර්ශන නිලධරයාට/ විනිශ්චය සභාවට සලකුණු කරන ලද ලේඛන යැවීම

9.11 ලේඛනයන්හි අන්තර්ගත කරුණු ප්‍රාථමික හෝ ද්විතීයන සාක්ෂි මගින් සනාථ කළ හැකි ය. ප්‍රාථමික සාක්ෂියක් යනුවෙන් හැඳින්වෙන්නේ, විමර්ශන නිලධරයාගේ/ විනිශ්චය සභාවේ සලකා බැලීම සඳහා අදාළ ලේඛණයට ඉදිරිපත් කිරීමයි. ද්විතීයන — ප්‍රාථමික සහ ද්විතීයක සාක්ෂිවල නිර්වචනය

සාක්ෂියක් ලෙස;

(අ) යම් රජයේ නිලධරයකු විසින් මුල් පිටපත තම භාරයේ තිබෙන ප්‍රසිද්ධ ලියවිල්ලක සහතික කරන ලද පිටපතක්;

(ආ) යම් නිලධරයකු විසින් මුල් පිටපත තම භාරයේ තිබෙන යම් පෞද්ගලික ලියවිල්ලක සහතික කරන ලද පිටපතක්;

(ඇ) යම් බැංකු කළමනාකරවරයකු විසින් තම භාරයේ ඇති බැංකු පොතක සහතික කරන ලද බැංකු පොතක්;

(ඈ) යම් මුල් පිටපතක නිරවද්‍යතාවය සනාථ කිරීමට ප්‍රමාණවත් යන්ත්‍රානුසාරයෙන් ලබාගන්නා ලද පිටපත් සහ එම පිටපත් සමඟ සංසන්දනය කිරීමෙන් පසු සනාථ කරගත් වෙනත් පිටපත්;

(ඉ) මුල් පිටපත හා සැසඳීමෙන් පසු ලබාගත් පිටපත්.

(ඊ) යම් ලේඛනයක රඳවාගත් (counter foils) කොටස්;

(උ) යම් ලේඛනයක් දුටු තැනැත්තකු විසින් එහි අන්තර්ගත කරුණු පිළිබඳව වාචිකව කරනු ලබන ප්‍රකාශයක්;

අදහස් වීම සහ පිළිගැනීම සිදුකළ හැකිය.

**නීතිය ඉදිරියේදී පිළිගත හැකි ලේඛන අනුමානයෙන් පිළිගැනීම**

9.12 සහතික පත්‍රයක්, සහතික කරන ලද පිටපතක් හෝ වෙනත් ලියවිල්ලක් නීතිය ඉදිරියේ යම් කරුණක් සනාථ කිරීම අරමුණු කරගත් ලියවිල්ලක් සහ එකී අරමුණ ඇති ව ශ්‍රී ලංකාව තුල යම් නිලධරයකු විසින් සහතික කරන ලද සැබෑ ලේඛන බව, සෑම විනිශ්චය සභාවක් සහ විමර්ශන නිලධරයකුම පිළිගත යුතු වේ. එමෙන් ම, යම් නිලධරයකු විසින් එවැනි ලේඛනයක් අත්සන් කිරීම, සහතික කිරීම හෝ භාරයේ තබා ගැනීම කරන විට, ඔහු එකී ලේඛනයේ දක්වා ඇති නිල තත්ත්වය සහිත තැනැත්තා බවට ද විමර්ශන නිලධරයා/විනිශ්චය සභාව සෑහීමට පත්විය යුතු ය.

9.13 චෝදනා පත්‍රයට පිළිතුරු සැපයීමේදී හෝ පරීක්ෂණයට පෙර චූදිත තැනැත්තා විසින් හෝ ඔහුගේ රැකවරණ නිලධරයා විසින් හෝ පරීක්ෂණය පැවැත්වෙන අතරතුරදී හෝ යම් කරුණක් පිළිගෙන හෝ එකඟ වී ඇත්නම්, එවැනි කරුණක් විධිමත් පරීක්ෂණය පැවැත්වෙන අතරවාරයේදී නැවත සනාථ කිරීමට අවශ්‍යතාවයක් නොමැත.

9.14 යම් දත්ත වලින් සැකසුණු පණිවිඩයක, යම් ඉලෙක්ට්‍රොනික ලේඛනයක, ඉලෙක්ට්‍රොනික සන්නිවේදනයක හෝ එවැනි වාර්තාවක අඩංගු කරුණු,

ඉලෙක්ට්‍රොනික සන්නිවේදන සහ ලේඛන

අ) යම් කරුණකට අදාළ යයි හැඟෙන විට;

ආ) යම් කාර්යයක, ශිල්පයක් හෝ වෘත්තීයක යෙදෙන විට හෝ නිරන්තරයෙන් සිදුකරන යම් කර්තව්‍යයක් අතරතුරදී එකඟ වූ, ලබා ගන්නා වූ හෝ ලැබුණා වූ දත්ත, පණිවිඩ හෝ සන්නිවේදන ආදිය පරීක්ෂණයකදී පිළිගැනීම ඇතුළත් වේ.

එහෙත්, ප්‍රස්තුත කරුණට අදාලව සෘජු වාචික සාක්ෂි තිබෙන නිසා හෝ කරුණු තිබෙන නිසා හෝ යම් දත්ත වලින් සැකසුණු ඉලෙක්ට්‍රොනික පණිවුඩයක, සන්නිවේදනයක හෝ වාර්තාවක අන්තර්ගත කරුණු, අවිශ්වාස කිරීමට හෝ වැරදි සහගතයයි අනුමාන කිරීමට කිසිදු හේතුවක් නොමැත.

9.15 වෙනත් ආකාරයකින් වැරදි සහගතයයි ඔප්පු නොකළ අවස්ථාවකදී විමර්ශන නිලධරයකු/විනිශ්චය සභාවක් විසින් ඉලෙක්ට්‍රොනික දත්ත පණිවිඩයක්, සංවේදනයක් හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික පණිවිඩයක් හෝ වාර්තාවක් තුළ අන්තර්ගත වී ඇති කරුණු සත්‍ය කරුණු ලෙස පිළිගත යුතු අතර, යම් තැනැත්තකු විසින් එවැනි ලේඛණයක තබන ලද ඉලෙක්ට්‍රොනික අත්සනක් හෝ අදාළ තැනැත්තා හඳුනාගැනීමට උපකාරී වන යම් සලකුණක්ද පිළිගත හැකි යැයි අනුමාන කළ යුතු වේ.

නිර්වචනයන්

"දත්ත පණිවිඩයක්" යන්නෙන් අදහස් වනුයේ, ඉලෙක්ට්‍රොනික, මැග්නටික, ඔප්ටිකල් හෝ වෙනත් සමාන මාධ්‍යයන් ආශ්‍රයෙන් ජනිත කළා වූ, යැවුණු ලද හෝ ලබාගත් තොරතුරු ගබඩා කොට තැබූ අවස්ථාවකි.

"ඉලෙක්ට්‍රොනික්" යන්නෙන් අදහස් වන්නේ, මාධ්‍ය කුමක් වුවද යම් "ඉලෙක්ට්‍රොනික", "මැග්නටික", "ඔප්ටිකල්" හෝ වෙනත් ආකාරයකින් ජනිත කළා වූ, ලබා ගත්තා වූ, යවන ලද හෝ ගබඩා කරන ලද තොරතුරු ය.

"ඉලෙක්ට්‍රොනික් ලේඛන" යන්නෙන් අදහස් වනුයේ, ඉලෙක්ට්‍රොනික (විද්‍යුත්) මාධ්‍යය උපයෝගී කරගනිමින් සකස් කරන ලද ලේඛන, වාර්තා, තොරතුරු, පණිවිඩ හෝ ගනුදෙනු කිරීම ය.

"ඉලෙක්ට්‍රොනික වාර්තාව" යන්නෙන් අදහස් වන්නේ, ඉලෙක්ට්‍රොනික (විද්‍යුත්) මාධ්‍ය උපයෝගී කරගනිමින් නිර්මාණයය කරන ලද, ගබඩා කරන ලද, පිළියෙල කරන ලද, ලැබුණු හෝ සන්නිවේදනය කරන ලද ලිඛිත හෝ වෙනත් වාර්තාවකි.

"ඉලෙක්ට්‍රොනික අත්සන" යනුවෙන් අදහස් වන්නේ, ඉලෙක්ට්‍රොනික (විද්‍යුත්) මාධ්‍ය උපයෝගී කර ගනිමින් සම්බන්ධ කරගනිමින් හෝ තර්කයට පහසු වන හෝ උත්පාදනය කරමින් යම් ලේඛනයක් හෝ ලිපියක්, සංඛ්‍යාවක්, සංකේතයක්, ප්‍රතිරූපයක්, එම ක්‍රියාවන් තුළින් සත්‍යාපනය කිරීම පිණිස හෝ අනුමත කිරීම පිණිස හෝ එකී ලේඛන සහ අනෙක් කරුණුවල වලංගුභාවය සහ අවංකභාවය හෝ එම දෙවර්ගයම සනාථ කිරීම පිණිස යොදා ගන්නා අවස්ථාවයි.

"තොරතුරු" යන්නට, විද්‍යුත් පණිවිඩයක්, දත්ත, හඬපට, ශබ්ද, දත්ත ගබඩා, වීඩියෝ, සංඥා, මෘදුකාංග, පරිගණක වැඩසටහන් ඇතුළත් වේ.

"තොරතුරු පද්ධතිය" යන්නෙන් අදහස් වන්නේ, ඉලෙක්ට්‍රොනික පද්ධතියක් අනුසාරයෙන් යම් තොරතුරු සමුච්චයක් නිෂ්පාදනය කිරීම, ඉපදවීම, සම්ප්‍රේෂණය කිරීම, ලබා ගැනීම, ගබඩාකොට තැබීම, යළි නිෂ්පාදනය කිරීම, ප්‍රදර්ශනය කිරීම,තැටිගත කිරීම සහ සකස් කිරීම යන කරුණු ඇතුළත් පද්ධතියකි.

## 10. විනය පරීක්ෂණවලදී නියෝජනය

10.1 කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක/විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධාරයාගේ නිර්දේශය පරිදි, එම ආයතනයේ විනය බලධරයා විසින්, යම් විනය පරීක්ෂණයක පැමිණිල්ල මෙහෙයවීමට සහාය ලබා දීම සඳහා මෙහි පහත සඳහන් 10.2.3 උපඡේදයෙහි නියමයන්ට යටත්ව, කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක හෝ ඉන් පරිබාහිර තැනැත්තකු පත්කළ යුතු ය. එසේ පත් කළ තැනැත්තා, අදාළ විනය පරීක්ෂණයේ සාක්ෂිකරුවකු නොවිය යුතු අතර, පැවැත්වෙන පරීක්ෂණය වෙනුවෙන් යම් සැඟවුණු උනන්දුවක් නොමැති තැනැත්තකු ද විය යුතු වේ. හැකි සෑම අවස්ථාවකදී ම, එසේ පැමිණිල්ල මෙහෙයවීමට සහාය දක්වනු පිණිස පත් කරන තැනැත්තා චූදිත තැනැත්තාට වඩා ඉහළ නිලයක අයෙකු විය යුතු වේ. *පැමිණිල්ල මෙහෙයවීමට සහාය වීමට පත්කරන නිලධරයා*

10.2 චූදිත තැනැත්තා වෙනුවෙන්, කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන ආයතනයක/විද්‍යායතනයක, රජයේ ආයතනයක සේවයේ නියුතු හෝ එම සේවාවලින් විශ්‍රාම ගොස් සිටින හෝ තැනැත්තෙකු පෙනී සිටිය හැකි ය. *චූදිත තැනැත්තා වෙනුවෙන් පෙනී සිටීම*

10.2.1 යම් චූදිත තැනැත්තකු වෙනුවෙන් වෙනත් අයකු පෙනී සිටින අවස්ථාවක දී, එසේ පෙනී සිටින තැනැත්තාගේ, නම, තනතුර (විශ්‍රාමික නිලධරයකු නම් ඔහු සේවයෙන් විශ්‍රාම ලබන විට තනතුර), වෘත්තීමය තත්ත්වය (අදාල වේ නම්) සහ එසේ චූදිත තැනැත්තා වෙනුවෙන් පෙනී සිටීමට කැමැත්ත ප්‍රකාශ කරන ලිපියක්ද ලබාගෙන එය, අදාළ විනය බලධරයා වෙත අවසර ලබා ගැනීම පිණිස ඉදිරිපත් කළ යුතු ය. — පූර්ව අනුමැතිය ලබා ගැනීම

10.2.2 ඉහත 10.2.1 ට අනුව, නියමිත අනුමැතිය ලබා තිබේ නම්, විනිශ්චය සභාව විමර්ශන නිලධරයා විසින්, එම තැනැත්තා හට චූදිතයා වෙනුවෙන් පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

10.2.3 චූදිත තැනැත්තා වෙනුවෙන් නීතිඥයෙකු පෙනී සිටින අවස්ථාවකදී පැමිණිල්ල වෙනුවෙන් ද නීතිඥයෙකු හට පෙනී සිටීමට අවස්ථාව තිබේ. එවැනි අවස්ථාවකදී, විනය බලධරයාගේ තනි කැමැත්ත මත හෝ කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක/විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයාගේ ඉල්ලීම මත එම පත්කිරීම සිදුකළ හැකි ය. — නීතිඥයෙකු චූදිතයා වෙනුවෙන් පෙනී සිටින විට

10.3 කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන ආයතනය/ විද්‍යායතනය වෙනුවෙන්, නීතිඥයෙකු හට පෙනී සිටීම සඳහා විනිශ්චය සභාවට/විමර්ශන නිලධරයාට අවසර දිය හැකි ය. එවැනි අවස්ථාවකදී, තමා වෙනුවෙන් පෙනී සිටීම සඳහා නීතිඥයෙකුගේ සේවය ලබා ගැනීමට චූදිත තැනැත්තාට හිමිකමක් තිබේ.

10.4 ඉහත 10.2 හෝ 10.3 උපඡේදයන් යටතේ ලබා දී ඇති අවසරය, ඕනෑම අවස්ථාවක දී අවලංගු කිරීමට, විනිශ්චය සභාවට/විමර්ශන නිලධරයාහට හැකි අතර, ඒ බව ඔවුන් විසින් චූදිත තැනැත්තා හට දැනුම් දිය යුතු ය. එවැනි අවස්ථාවකදී, චූදිත තැනැත්තා ඒ වෙනුවට තමා වෙනුවෙන් පෙනී සිටීමට කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන ආයතනයක/විද්‍යායතනයක රජයේ සේවයේ හෝ එම සේවාවලින් විශ්‍රාම ගොස් ඇති තැනැත්තකු නම් කොට ඒ සඳහා අවසරය ඉල්ලා සිටිය හැකි ය. — වෙනත් තැනැත්තකු පත් කිරීම

10.5 කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/විද්‍යායතනයක සේවකයකු හෝ රජයේ සේවකයකු විසින් යම් චූදිත තැනැත්තකු වෙනුවෙන් විනය පරීක්ෂණයකදී පෙනී සිටීම සඳහා ගාස්තුවක් ලබා ගැනීම වරදක් ලෙස සැළකේ. යම් තැනැත්තෙකු දිගින් — ගාස්තු අය කර ගැනීමට අවසර නැත

දිගටම චූදිත තැනැත්තන් වෙනුවෙන් පෙනී සිටීම සඳහා අවසර ඉල්ලා සිටින විටක දී, කොමිෂන් සභාවේ සභාපතිවරයාට, උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයාට, තම අභිමතය පරිදි එසේ අවසර දීමෙන් වැළකී සිටිය හැකි ය.

## 11. විනය පරීක්ෂණ පැවැත්වීම

11.1 විනය පරීක්ෂණයක් හැකි ඉක්මනින්ම පවත්වා අවසන් කිරීම, එයට සම්බන්ධ වී ඇති සියලු දෙනාගේම යහපත පිණිස වන්නේය. අදාළ විනිශ්චය සභාව/විමර්ශන නිලධරයා විසින් ප්‍රමාදයකින් තොරව විනය පරීක්ෂණය පවත්වා, විනය බලධරයා විසින් නියම කර ඇති කාලය තුළදී හෝ පරීක්ෂණය පැවැත්වීමට පත්කොට මාස තුනක් (3) ඇතුළතදී හෝ එම දෙකින් මුලින් යෙදෙන දිනයේදී පරීක්ෂණ වාර්තාව විනය බලධරයා වෙත භාරදිය යුතු ය.
සුළු සහ නොවැදගත් කරුණු ඉදිරිපත් කරමින්, කල් ඉල්ලා සිටීම හෝ පරීක්‍ෂණය ප්‍රමාද කිරීමේ අරමුණ ඇතිව කරන ඉල්ලීම් හෝ නීතිය ඉෂ්ඨ කිරීම ප්‍රමාද කිරීමේ අරමුණ ඇතිව කරන ඉල්ලීම් ප්‍රතික්ෂේප කළ යුතු ය.

*දිගටම පරීක්ෂණය පවත්වාමාස තුනක් ඇතුළත අවසන් කිරීම*

11.2 එක දිගට දෙවතාවකට වැඩි වාර ගණනක දී, කිසිදු පිළිගත හැකි හේතුවකින් තොර ව, චූදිත තැනැත්තා පරීක්ෂණයට සහභාගී නොවන විට, පරීක්‍ෂණය කල් තබා, චූදිත තැනැත්තා නොමැතිව, ඒකපාර්ශවිකව පරීක්ෂණය පැවැත්වීමට සිදුවන බව ඔහුට ලියාපදිංචි තැපැල් මගින් හෝ වෙනත් සුදුසු මාර්ගයකින් අවවාද කොට දැනුම් දිය යුතුය. චූදිත තැනැත්තා දිගින් දිගටම පරීක්ෂණයට සහභාගී නොවන්නේ නම්, නැවත පරීක්ෂණය ආරම්භ කොට, ඒකපාර්ශවිකව පවත්වාගෙන යා යුතුය.

*ඒකපාර්ශවීය පරීක්ෂණය*

11.3 එල්ල කර ඇති චෝදනාවන්හි ස්වභාවය සැලකිල්ලට ගෙන, ලේඛනගත වාර්තාමය සාක්ෂි පමණක් ම පදනම් කොටගෙන තීරණයකට එළඹීමට විනිශ්චය සභාවට/ විමර්ශන නිලධරයාට හැකියාව ඇත. යම් විටකදී, තීරණයකට එළඹීම සඳහා, ඉදිරිපත් වී ඇති කරුණක්/ සිද්ධියක් වෙනුවෙන් දෙන ලද වාචික සාක්ෂියක සත්‍ය අසත්‍යතාවය සනාථ කර ගැනීම අවශ්‍ය වන අවස්ථාවක දී, ඒ බව, හරස් ප්‍රශ්න ඇසීමෙන් සනාථ කරගත යුතු ය. චූදිත තැනැත්තා හටද හරස් ප්‍රශ්න ඇසීමේ අයිතිය ඇති අතර, එසේ කිරීමට අවශ්‍ය අවස්ථාව ඔහුට ලබාදිය යුතු ය.

*ලේඛනගත සාක්ෂි මත පදනම් වීම පමණක්*

11.4 ඉහත 8.3.1 උපඡේදයෙහි වුවද, පරීක්ෂණය පැවැත්වෙන අතරතුර දී පරීක්ෂණ නිලධරයාගේ අවසරය ඇති ව, චෝදනා පත්‍රය දෙවතාවකට නොවැඩි වාර ගණනකදී නැවත වෙනස් කිරීමට විනය බලධරයා හට අවසරය තිබේ.

*චෝදනාවක් වෙනස් කිරීමට, අලුත් සාක්ෂියක් කැඳවීමට*

චූදිත තැනැත්තා හට අදාළ පරිදි ලේඛන පරීක්ෂා කිරීමට හෝ වෙනස් කරන ලද චෝදනාවන්ට අනුව කරුණු ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙමින් දැනටමත් සාක්ෂි ලබා දී ඇති සාක්ෂිකරුවන් නැවත කැඳවීමට හෝ අලුත් සාක්ෂිකරුවන් පරීක්ෂණයට කැඳවීමට, අවශ්‍ය පරිදි වැඩිමනත් ලේඛන ඉදිරිපත් කිරීමට, අවකාශ ඇත.

මුල් අවස්ථාවේ දී සඳහන් කරන ලද ලේඛනවලට, වැඩිමනත් වශයෙන් ලේඛන පසුව ඉදිරිපත් කළ විට, ඉහත 9.7 සහ 9.8 උපඡේදයන්හි නියමයන්ට යටත්ව, එවැනි ලේඛන ඉදිරිපත් කරන අවස්ථාවේදී, ඒවා පරීක්ෂා කිරීමට චූදිත තැනැත්තාහට අවසර දිය යුතු වේ.

11.5 විනය පරීක්ෂණයක් පැවැත්වෙන අතරතුර දී, විරෝධතාවයක් මතුකළ විට හෝ පරීක්ෂණය පැවැත්වෙන ආකාරය ගැන යම් ගැටලුවක් මතුවූ විට, එම කරුණ සඳහා විනිශ්චය සභාව/විමර්ශන නිලධරයා විසින් දෙනු ලබන තීරණය අවසාන තීරණය වන්නේය. මෙවැනි අවස්ථාවන්හිදී, විනිශ්චය සභාව/විමර්ශන නිලධරයා විසින් අනුගමනයකළ යුතු ප්‍රතිපත්තිය වන්නේ, ක්‍රමවේදයන්හි ඇතුළත්ව හෝ එසේ නොමැතිව යම් අදාලත්වයක් නොමැති තාක්ෂණික වශයෙන් හෝ වැදගත්කමක් ඇතැයි යැයි සැලකෙන පරිපාලනයට බාධාවක් වියහැකි කරුණු මත නොරැඳී, හැකි විගස සත්‍යය හෙළිකර ගැනීමය. විරෝධතාවයන් මතු කළ විට සහ ඒ සඳහා තීරණයක් ලබා දුන් විට, එකී විරෝධතාවයන් සහ තීරණ මෙන්ම එසේ කිරීමට හේතු පාදක වූ කරුණුද එම අවස්ථාවේදීම, නිසි පරිදි වාර්තාගත කළ යුතු ය.

විරෝධතාවයක් මතු වූ විට තීරණ දීම

11.6 විනිශ්චය සභාව විසින් හෝ විමර්ශන නිලධරයා විසින් පාදක කරගත යුත්තේ, පරීක්‍ෂණයේ දී ඉදිරිපත් කරන ලද වඩාත් පිළිගත හැකි සාක්ෂි ය. එම සාක්ෂි උසාවියකදී ඉදිරිපත් කළ හැකි ද/නොහැකි ද යන්න මෙහිදී අදාළ වන්නේ නැත. මෙවැනි ක්‍රියාමාර්ගයන් තුළින් විනිශ්චය සභාවට/විමර්ශන බලධරයාට ප්‍රාථමික සාක්ෂි නොමැති අවස්ථාවක දී ද්විතීක සාක්ෂි බැහැර කිරීම වළක්වාලයි. ප්‍රධාන සාක්ෂියක් වශයෙන් හැඟෙන්නේ, විනිශ්චය සභාවට/විමර්ශන බලධරයාට ඔවුන්ගේ පරීක්ෂාව සඳහා අදාළ ලේඛනයම ඉදිරිපත් කිරීම ය.

සාක්ෂි උසාවියකදී පිළිනොගැනීම

11.7 පරීක්ෂණයක් පැවැත්වෙන අතරතුරදී, යම් තැනැත්තෙකුගේ අත් අකුරු, අත්සන හෝ "කෙටි අත්සන" සම්බන්ධයෙන් ගැටලුවක් මතු වූ අවස්ථාවකදී, එම අත්සන යෙදූ හෝ ලේඛනගත කළ තැනැත්තාගේ, එසේ ලේඛනගත කිරීම හෝ අත්සන යෙදීම දුටු තැනැත්තකුගේ, අත්සන සහ අත්අකුරු අදාළ තැනැත්තාගේ යැයි එම අත් අකුරු සහ අත්සන

අත්සන්, අත් අකුරු ලේඛන ගැටළු මතු වූ විට

ගැන දැනීමක් ඇති තැනැත්තකුගේ සාක්ෂියෙන්ද, එම අත්සන සහ අත් අකුරු විනිශ්චය සභාව/විමර්ශන නිලධරයා විසින් සමාන ලේඛනයක් සමග සැසඳීමෙන් පසුව සනාථ කර ගැනීමෙන් ද, මත භේදයට තුඩු දුන් ලේඛන පරීක්ෂා කරනු ලබන විශේෂඥයෙකු විසින් පල කරන ලද මතයකින්ද සනාථ කර ගැනීම ප්‍රමාණවත් වේ.

11.8 මූලික විමර්ශනයකදී, සටහන් කරගන්නා ලද සාක්ෂි, විධිමත් විනය පරීක්ෂණයේදී නැවත ඉදිරිපත් කිරීමක් අවශ්‍ය නොවේ. මෙවැනි කරුණකදී තීරණයක් දීම විනිශ්චය සභාවේ/විමර්ශන නිලධාරියාගේ අභිමතය පරිදි සිදුවේ.

මූලික විමර්ශනයේදී සටහන් කරගත් සාක්ෂි

11.8.1 අලුත් සාක්ෂි ඉදිරිපත් නොකරන ලද අවස්ථාවකදී, විනිශ්චය සභාවට/විමර්ශන නිලධරයා හට යම් කරුණක් සම්බන්ධයෙන් සාක්ෂිකරුවන්ගෙන් වැඩිදුර කරුණු දැන ගැනීමට ප්‍රශ්න කිරීම අවශ්‍ය යැයි තීරණය කළ විට, එසේ ප්‍රශ්න කළ හැකි අතර, රැකවරණ නිලධරයා හට එම සාක්ෂිකරුගෙන් ලබා දුන් ප්‍රකාශය ගැන හෝ පරීක්ෂණයේදී දුන් වාචික සාක්ෂියක් ගැන හරස් ප්‍රශ්න ඇසීමට ද, අවසරය ලබාදිය හැකි ය.

වැඩිපුර කරුණු දැන ගැනීමට අවශ්‍ය වූ විට

11.9 චූදිත තැනැත්තකු තමා විසින්ම, තමන් වෙනුවෙන් සාක්ෂි දිය හැකි අතර, එවැනි අවස්ථාවකදී ඔහුගෙන් හරස් ප්‍රශ්න ඇසිය හැකිය. කෙසේ වුවද, පරීක්ෂණයේදී මතුවන කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් අවශ්‍ය වන විටදී, විනිශ්චය සභාව/විමර්ශන නිලධරයා විසින් ප්‍රශ්න කරනු ලැබූ විට, ඒවාට පිළිතුරු දීමට චූදිත තැනැත්තා හට සිදුවේ.

චූදිත තැනැත්තාගේ සාක්ෂිය

11.10 විනිශ්චය සභාව/විමර්ශන නිලධාරියා විසින්; විධිමත් විනය පරීක්‍ෂණයේ දී සියලුම සාක්‍ෂිකරුවන්, සාක්‍ෂි දීම සඳහා කැඳවිය යුතුවේ. කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/විද්‍යායතනයක සාක්‍ෂිකරුවන්, ඔවුන්ගේ අධ්‍යයනාංශ/ අංශ ප්‍රධානීන් මාර්ගයෙන් කැඳවිය යුතු ය.

සාක්‍ෂිකරුවන් කැඳවීම

11.10.1 බාහිර ආයතනයන් හි සාක්‍ෂිකරුවන්; විනය පරීක්ෂණයට සහභාගීවීම සඳහා සහ එහිදී සාක්‍ෂි දීම සඳහා නිදහස් කරන ලෙසට කරන ඉල්ලීමක් ද සමඟ, ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් කැඳවිය යුතුවේ.

බාහිර ආයතනයන් හි සාක්‍ෂිකරුවන්

11.11 කැඳවා ඇති සාක්‍ෂිකරුවන් ප්‍රමාණය අවශ්‍යයතාවයට වඩා වැඩිනම් හෝ ඇති චෝදනාවන්ට අනුව කැඳවා ඇති සාක්‍ෂිකරුවන්ගේ සාක්‍ෂිය නොවැදගත් යැයි විනිශ්චය සභාව/විමර්ශන නිලධරයා අදහස් කරන විට දී හෝ යම් සාක්‍ෂිකරුවෙකුගේ පැමිණීම අනවශ්‍ය යැයි

සාක්‍ෂිකරුවන් කැඳවීම විනිශ්චය සභාව/විමර්ශන නිලධරයාගේ අභිමතය මත පමණි

සැලකෙන විටක දී හෝ එවැනි සාක්ෂිකරුවන් විමර්ශනයට කැඳවීම ප්‍රතික්ෂේප කිරීමට විනිශ්චය සභාව/විමර්ශන නිලධරයා හට හැකියාව තිබේ. චූදිත තැනැත්තා විසින්; තම රැකවරනය පිණිස නිල ලේඛන ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටින අවස්ථාවක දී මෙම ප්‍රතිපත්තියම අදාල කරගත හැක.

11.12 කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවයේ නියුතු යම් තැනැත්තෙකු; විනය පරීක්ෂණයක සාක්ෂිදීම සඳහා කැඳවා තිබිය දී, එසේ සාක්ෂි දීමට නොපැමිණි විට, විනිශ්චය සභාව/විමර්ශන නිලධරයා විසින් ඒ බව අදාල බලධාරියාගේ මාර්ගයෙන්, උචිත පරිදි එම තැනැත්තා සේවයේ නියුතු කොමිෂන් සභාවේ සභාපතිවරයාට/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධාරියා හට වාර්තාකල යුතු වේ. එවැනි අවස්ථාවක දී එම තැනැත්තා අදාල විනය පරීක්ෂණයට සහභාගී කරවීම, එකී සභාපතිවරයාගේ, ප්‍රධාන විධායක නිලධරයාගේ වගකිම වන්නේ ය.

කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සාක්ෂිකරුවන් පරීක්ෂණයට නොපැමිණිම

11.13 ඉහත 11.10.1 උපඡේදයේ සඳහන් ආකාරයට, වෙනත් ආයතනයක සේවයේ නියුතු තැනැත්තෙකු විනය පරීක්ෂණයක සාක්ෂිකරුවකු ලෙස කැඳවන ලද අවස්ථාවක දී, එම තැනැත්තා එකී විනය පරීක්ෂණයට පෙනී සිටීමට අසමත් වූ විට, විනිශ්චය සභාව විසින් හෝ විමර්ශන නිලධාරියා විසින් හෝ ඒ බව සුදුසු නිලධරයකු මාර්ගයෙන් කොමිෂන් සභාවේ සභාපතිවරයාට / උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයාට වාර්තාකල යුතු ය. එවැනි අවස්ථාවක දී, එම නිලධරයා විසින්, අදාල සාක්ෂිකරුවා පරීක්ෂණයට සහභාගි කරවා ගැනීමට අවශ්‍යය වැඩිදුර පියවර ගන්නවා ඇත. මෙම සෑම උත්සහයක්ම අසාර්ථක වු විට, විනිශ්චය සභාව/ විමර්ශන නිලධරයා විසින්, එම කරුණ පරීක්ෂණයේ සටහන් වලට ඇතුලත් කොට, පැමිණ සිටින සාක්ෂිකරුවන් සමඟ පරීක්ෂණය ඉදිරියට පවත්වාගෙන යනු ලබයි.

අනෙකුත් ආයතනයන්හි සාක්ෂිකරුවන් නොපැමිණිම

11.14 පෞද්ගලික සාක්ෂිකරුවන්ගේ නො පැමිණිම, පරීක්ෂණයේ සටහන්වල නිසිපරිදි සඳහන් විය යුතු අතර, අනෙකුත් සාක්ෂිකරුවන් සමඟ පරීක්ෂණය ඉදිරියට පවත්වාගෙන යා යුතුය.

පෞද්ගලිකසාක්ෂිකරුවන්ගේ නොපිමිණිම

11.15 යම් සාක්ෂිකරුවකුගේ සාක්ෂිය සටහන් කරගන්නා අවස්ථාවේ දී, අනෙකුත් සාක්ෂිකරුවන්හට එහි රැදි සිටීමට අවසර නොදිය යුතු ය.

සාක්ෂිවල රහස්‍යභාවය

11.16 චූදිත තැනැත්තාගේ හෝ සාක්ෂිකරුවකුගේ ප්‍රකාශයක් සටහන් කරගන්නා විට, මෙහි නියමයන්ට අනුව චූදිත තැනැත්තා ඔහුගේ නියෝජිතයා හෝ නිතිඥවරයා හට එම ස්ථානයේ රැදී සිටිය හැකි අතර, වෙනත් කිසිඳු තැනැත්තෙකු හට එම අවස්ථාවට සහභාගි වීමට අවසර දෙනු නොලැබේ.

| | | |
|---|---|---|
| 11.17 | විධිමත් විනය පරීක්ෂණයක දී, තමා වෙනුවෙන් සාක්ෂි දීමට චූදිත තැනැත්තා හට අයිතියක් ඇත්තේ ය. එවැනි සාක්ෂීන් හරස් ප්‍රශ්ණ ඇසීමට යටත් වේ. එමෙන් ම, සියළුම සාක්ෂි සටහන් කරගැනීමෙන් අනතුරුව, තමා වෙනුවෙන් ප්‍රකාශයක් කිරීමට චූදිත තැනැත්තා හට අවස්ථාව තිබේ. එවැනි අවස්ථාවක දී, අදාල ප්‍රකාශය සම්බන්ධයෙන්, පැමිණිලිකාර පාර්ශවය විසින් හරස් ප්‍රශ්ණ ඇසීමට අවස්ථාවක් නො ලැබෙන බව, විනිශ්චය සභාව/ විමර්ශන නිලධරයා විසින්; එකී ප්‍රකාශයක් සාක්ෂියක් වශයෙන් ඇති වැදගත්කම සම්බන්ධයෙන් සලකා බැලිය යුතු ය. කෙසේ වුවද, එවැනි ප්‍රකාශයක් හරස් ප්‍රශ්ණ ඇසීමකට භාජනය නොවුනද, අවශ්‍යය යැයි සිතන්නේ නම්, ඒ පිළිබඳ වැඩිදුර කරුණු අනාවරණය කරගැනීමට විනිශ්චය සභාවට / විමර්ශන නිලධරයා හට අවකාශ තිබේ. | චූදිත තැනැත්තා විසින් තමා වෙනුවෙන් කරන ප්‍රකාශය |
| 11.18 | චූදිත තැනැත්තා වෙනුවෙන් ඉදිරිපත් කරන ලිඛිත දේශන විනය පරික්ෂණය නිම වී සති දෙකක් (02) ඉක්ම යාමට ප්‍රථමයෙන් ඉදිරිපත් කළ යුතු වේ. එම ලිඛිත දේශන පරික්ෂණයේ වර්තාවන් හි කොටසක් ලෙස සැලකෙනු ඇත. | චූදිත තැනැත්තාගේ ලිඛිත දේශන |
| 11.19 | විනය පරීක්ෂණය අවසානයේ දී, පරීක්ෂණය පැවැත්වූ ආකාරය සම්බන්ධයෙන් යම් විරෝධතාවයන් පිළිබඳව විමර්ශන සභාවේ/ විමර්ශන නිලධරයාගෙන් අදහස් ද වාර්තාගත කළ යුතු ය. එකී වාර්තාගත කිරීමට, පරීක්ෂණයට සම්බන්ධ වු සියළුම පාර්ශවන් විසින් අත්සන් තැබිය යුතු වේ. | පරීක්ෂණය අවසන් කිරීම |
| 11.20 | කිසිඳු අවස්ථාවක දී පරීක්ෂණයේ තීරණ කුමන ආකාරයේ එකක් විය හැකි ද යන්න ගැන ඉඟි කිරීමක් විනිශ්චය සභාව / විමර්ශන නිලධරයා විසින් නොදිය යුතු ය. | |
| 11.21 | විනය පරික්ෂණය අවසන් වීමෙන් පසු, විනිශ්චය සභාව / විමර්ශන නිලධරයා විසින්, පරීක්ෂණයේ දී සටහන් කරගත් සියළුම ප්‍රකාශයන්, වාර්තාගත කළ කරුණු සහ පරීක්ෂණ වාර්තාව, කොමිෂන් සභාවේ සභාපතිවරයා/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයා මාර්ගයෙන්, උචිත විනය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. එම පරීක්ෂණ වාර්තාව යම් හෙයකින් ඉදිරිපත් කිරීමට ප්‍රමාද වූයේ නම්, එසේ ප්‍රමාද විමට හේතු ද පරීක්ෂණ වාර්තාව සමඟ ඉදිරිපත් කළ යුතු ය. | පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කිරීම |
| 11.21.1 | විනය පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන විට දී, අනෙකුත් කරුණු වලට වැඩිමනත් වශයෙන් පහත කරුණු විනිශ්චය සභාව/ විමර්ශන නිලධරයා විසින් එකී වාර්තාවට ඇතුලත් කළ යුතු වේ: | අනාවරණය වීම් නිර්දේශ අදිය |

(අ) සිද්ධියට පසුබිම් වූ කරුණු ගැන සංක්ෂිප්ත විස්තරයක්

(ආ) පරීක්ෂණය පැවැත්වූ ආකාරය සම්බන්ධයෙන් වැදගත් වියහැකි කරුණු වෙතොත් ඒවා

(ඇ) සාක්ෂි සම්පිණ්ඩනය කිරීම සහ එක් එක් චෝදනාවක් සම්බන්ධයෙන් විමර්ශන නිලධරයාගේ අනාවරණය කරගැනීම

(ඈ) චූදිත තැනැත්තා අවම වශයෙන් එක් චෝදනාවකට හෝ වැරදිකරු බවට නිගමනය වී ඇත්නම්, එම වරදේ බරපතලකම ගැන විනිශ්චය සභාවේ/ විමර්ශන නිලධරයාගේ අදහස සහ විනය නිලධරයා විසින් යම් දඬුවමක් නියම කරන විට, එහි අවධානය යොමු විය යුතු කරුණු ගැන විනිශ්චය සභාවේ/ විමර්ශන නිලධරයාගෙ නිර්දේශ

(ඉ) පරීක්‍ෂණය පැවැත්වෙන අතරතුරෙහි දී, පරීක්‍ෂණයේ සාක්‍ෂිකරුවකු වූ යම් නිලධරයෙකුගේ විෂමාචාරයක් අනාවරණය වූ විට, එම සියළුම කරුණු, ඔවුනට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීම පිණිස වර්තාකල යුතු ය.

(ඊ) පරීක්‍ෂණයේ දී, විෂමාචාරය සිදු වූ ආයතනයේ යම් අඩුපාඩුවක් අනාවරණය වූ විට, එකී අඩුපාඩු සම්බන්ධ සියළු තොරතුරු සහ ඒවා නිවැරදි කර ගැනීම පිණිස විනිශ්චය සභාව/ විමර්ශන නිලධරයා විසින් කරනු ලබන නිරීක්ෂණ සහ නිර්දේශ;

(උ) අදාල විෂමාචාරය පිළිබඳව කරන ලද පරීක්ෂණයන්හි හෝ පැමිණිල්ලේ අඩුපාඩුවක්;

(ඌ) පරීක්‍ෂණයේ හෝ ක්‍රමවේදයන් හි ඇති අඩුපාඩු මෙන්ම පරීක්ෂණයේදී හෙළිදරව් වූ යම් විෂමාචාරී ක්‍රියාවන් නැවත නැවතත් සිදුවීම වැළැක්වීම සහ එමඟින් රාජ්‍ය සේවයේ යහපැවැත්ම සහතික කිරීම උදෙසා විනිශ්චය

සභාව/ විමර්ශන නිලධරයා විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ සහ සංස්කරනාත්මක යෝජනා

11.22 11.22.1 තම විනය පර්ක්‍ෂන වාර්තාව සමඟ, විනිශ්චය සභාව/ විමර්ශන නිලධරයා විසින් පහත සඳහන් ලේඛන ද විනය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු ය: — පරීක්‍ෂණ වාර්තාව සමඟ ඉදිරිපත් කළයුතු ලේඛන

(අ) පරීක්‍ෂණයේ සටහන් වාර්තාව; මෙහි සෑම පිටුවකම පරීක්ෂණයේ පැමිණිලි පාර්ශවයේ සහ චූදිත පාර්ශවයේ අත්සන තැබිය යුතු ය.

(ආ)පැමිණිලි පාර්ශවය විසින් පරීක්‍ෂණයට ඉදිරිපත් කරන ලද සාක්ෂි වශයෙන් සහ සලකුණු කරන ලද සියළුම ලේඛන සහ භාණ්ඩ, එසේ ඉදිරිපත් කළයුතු අනු පිළිවෙලට අනුව;

(ඇ) චූදිත පාර්ශවය විසින් පරීක්‍ෂණයට ඉදිරිපත් කරන ලද සාක්ෂි වශයෙන් සහ සලකුණු කරන ලද සියළුම ලේඛන සහ භාණ්ඩ, එසේ ඉදිරිපත් කළයුතු අනු පිළිවෙලට අනුව

(ඉ) චූදිත තැනැත්තා විසින්, යම් ලිඛිත ප්‍රකාශයක් ලබා දී ඇත්නම්, එම ප්‍රකාශය

(ඊ) පැමිණිල්ල මෙහෙයවූ නිලධරයාගේ ලිඛිත දේශනය

(උ) රැකවරණ නිලධරයාගේ ලිඛිත දේශනය;

(ඌ) පරීක්‍ෂණයට ඉදිරිපත් නොකල, එහෙත් විමර්ශන නිලධරයා විසින් මෙහි 9.8 උපඡේදයට අනුව තමන්ගේ නිගමනයන්ට පැමිණීම සඳහා උපයෝගි කරගත් වෙනත් ලේඛන;

(එ) පරීක්ෂණයේ “සටහන්” අඩංගු ජර්නලය

11.22.2 විනිශ්චය සභාව/ විමර්ශන නිලධරයා විසින්, සවිස්තරාත්මක විනය පරීක්‍ෂණ වාර්තාවක්, පරීක්‍ෂණය අවසන් වු දිනයේ සිට දින හැටක් (60) ඇතුලත දී විනය බලධරයා වෙත භාරදිය යුතු ය. — පරීක්ෂණ වාර්තාව භාරදීමේ අවසන් දිනය

## 12. නිර්මාණ කොල්ලයට (Plagiarism) එරෙහිව ගතයුතු ක්‍රියාමාර්ග

12.1 නිර්මාණ කොල්ලයට එරෙහිව පනවා ඇති රීති වලට අනුව, එවැනි සිදුවීමක් වාර්තා වු වහාම ක්‍රියාකල යුතු ය. — කඩිනම් ක්‍රියාමාර්ග

12.2 නිර්මාණ කොල්ලය පිළිබඳ වාර්තා වූ විට, එම සිද්ධීන් ගැන විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා දැනට භාවිතයේ පවත්නා පරීක්‍ෂණ හෝ විමර්ශන පැවැත්වීමේ ක්‍රමවේදයන් සුදුසු පරිදි භාවිතා කල හැකි ය.

12.3 දැනට භාවිතයේ පවත්නා විනය පරීක්‍ෂණ පැවැත්වීමේ හෝ කරුණු අනාවරණය කර ගැනීමේ රීති නිර්මාණ කොල්ලයක් පරීක්‍ෂා කිරීමට තරම් ප්‍රමාණවත්ක්‍රමවේදයන් නොමැති අවස්ථාවක දී කොමිෂන් සභාව/ විශ්වවිද්‍යාලය/ විශ්වවිද්‍යාලීය විද්‍යායතනය/ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානය විසින් තමත් හට සුදුසු යැයි සැලකෙන රීති සම්පාදනය කොට නිර්මාණ කොල්ලය වැළැක්වීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සම්පාදනය කරගත හැකි වේ. මණ්ඩපයක/ ආයතනයක එවැනි පැමිණිලි තම මණ්ඩපය/ ආයතනයක අනුබද්ධිතව / අනුයුක්තව පවතින විශ්වවිද්‍යාලය වෙත සුදුසු පියවර ගැනීම සඳහා වාර්තා කළ යුතු වේ.

විශ්වවිද්‍යාලයන්ට තමන්ගේ ක්‍රියාමාර්ග යොදාගත හැකිය

12.4 කොමිෂන් සභාව විසින් හෝ උසස් අධ්‍යාපන ආයතනයක්/ විද්‍යායතනයක් විසින් හෝ සම්පාදනය කරනු ලබන එවැනි රීති සහ එමඟින් ගන්නා වූ ක්‍රියාමාර්ග විෂයානුබද්ධ සහ විනිවිද භාවයෙන් යුතු බවට සෑම අවස්ථාවකදීම සහතික වීම අවශ්‍ය වේ. එබැවින්, එවැනි පරීක්ෂණයක් පැවැත්වෙන විට, පරීක්‍ෂණයේ රීති ක්‍රියාත්මක වන්නේ ද යන්න පරීක්‍ෂා කිරීමට සහ ස්වභාවික යුක්තියේ මූලධර්මයන්ට අනුව පරීක්‍ෂණය පැවැත්වෙන්නේ ද යන්න නිරීක්‍ෂණය කිරීම පිණිස විශ්‍රාමලත් මහාචාර්යවරයෙක් හෝ විශ්‍රාමලත් අධිකරණ නිලධරයකු හෝ අදාල පරීක්‍ෂණ මණ්ඩලයට සහභාගි කරවා ගැනීම යෝග්‍ය වේ.

පරීක්ෂණ මණ්ඩලයට විශ්‍රාමලත් මහාචාර්යවරයෙකු හෝ විශ්‍රාමලත් අධිකරණ නිලධරයකු හෝ සහභාගි කරවා ගැනීම

12.5 නිර්මාණ කොල්ලයන් සොයා ගැනීම පිණිස විශේෂයෙන් නිපදවා ඇති මෘදුකාංගයක් උපයෝගි කරගනිමින් සපයාගත් සාක්ෂීන් එවැනි පරීක්‍ෂණයක දි පිළිගත හැකි සාක්ෂියක් ලෙසට සැලකෙනු ඇත.

විද්‍යුත් සාක්ෂි

12.6 යම් තැනැත්තෙකු නිර්මාණ කොල්ලයකට වැරදිකරු බවට නිගමනය වූ විට, ඔහුට සුදුසු දඬුවමක් පැනවීම, අදාල පරිදි කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන ආයතනය විසින් සිදුකරනු ඇත. එබඳු අවස්ථාවක දී ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පවත්නා ප්‍රමාණවත් රීති නොමැති විට, පනවනු ලබන රීති මඟින් එබඳු ක්‍රියාමාර්ග ගැන ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන සැපයිය යුතුවේ.

රීති වලට අනුව දඬුවම් ලබාදිය යුතුය

## 13. **විනය බලධරයාගේ නියෝගය**

13.1 විනිශ්චය සභාවෙන් / විමර්ශන නිලධාරියාගෙන් පරීක්‍ෂණයට අදාල සියළුම ලේඛන ද සමඟ පරීක්ෂණ

විනය බලධරයාගේ වගකීම

වාර්තාව ලැබුනු පසු, එහි ලේඛන සහ පරීක්‍ෂණ වාර්තාව නිසිලෙස සහ නියමාකාරයෙන් සකස් කොට ඇති බවට විනය බලධරයා සෑහීමකට පත්විය යුතු ය. එම ලේඛනවල හෝ වාර්තාවෙහි යම් අඩුපාඩුවක් විනය බලධරයා විසින් නිරීක්ෂණය කලවිට එම කරුණු අවශ්‍ය පරිදි නිවැරදි කිරීම සඳහා විනිශ්චය සභාවේ/ විමර්ශන නිලධරයාගේ අවධානයට යොමුකල යුතු ය.

13.2 විනිශ්චය සභාවේ/ විමර්ශන නිලධරයා විසින් අදාල ලේඛන සහ පරීක්ෂණ වාර්තාව තමන් වෙත ලබාදුන් බව, විනය බලධරයා විසින් ලිඛිතව තහවුරු කලයුතු වේ.

වාර්තාව ලැබුනු බව තහවුරු කිරීම

13.3 තමන් වෙත ලබාදුන් විනය පරීක්‍ෂණ වාර්තාවේ සහ එයට අදාල අනෙකුත් ලේඛනවල සුරක්‍ෂිතභාවය සහ රහස්‍යය භාවය ආරක්‍ෂා කිරීම විනය බලධරයාගේ කාර්යභාරය වේ.

සුරක්‍ෂිතභාවය සහ රහස්‍යය බව ආරක්‍ෂා කිරීම

13.3.1 විමර්ෂන නිළධරයා හෝ විනිශ්චය සභාව විසින් ලබාදුන් තීරණය, විනය බලධරයා විසින් අවලංගු කිරීමට තීරණය කළහැකි අතර, එසේ කල යුත්තේ විමර්ෂන නිළධරයා/විනිශ්චය සභාව අදාල පරීක්ෂනය පැවැත්වීමේදී පිලිගත් ක්‍රමවේදයන් තුළ නොසිටිමින් සහ පරීක්ෂනය අවිධිමත් ලෙස පවත්වා ඇතැයි යන්න අනාවරණය වුවහොත් හෝ පැමිණිල්ල ඉදිරිපත් කරන නිළධරයා අත්‍යාවශය කරුණු ඉදිරිපත් කිරීම අතපසු කොට ඇති බව හෝ නොසැලකිලිමත් ලෙස කරුණු දක්වා ඇතැයි යන්න අනාවරණය වූ අවස්ථාවකදී ය.

විනය පරීක්ෂනය අවලංගු කිරීමට හේතු

13.4 විනිශ්චය සභාව/ විමර්ශන නිලධරයා කුමන ආකාරයකින් තිරණය කර තිබුන ද, තමන් වෙත ලබා දුන් විනය පරීක්‍ෂණ වාර්තාව නිසි පරිදි අධ්‍යයනය කොට ස්වාධීන තීරණයකට එළඹීම විනය බලධරයාගේ වගකීම වන්නේ ය. අවශ්‍ය වන්නේ නම්, යම් පැහැදිලි කිරීමක් ලබා ගැනීම පිණිස, විනිශ්චය සභාව/ විමර්ශන නිලධරයාගෙන් විමසීමට විනය බලධරයා හට හැකියාවක් තිබේ.

විනය බලධරයාගේ තිරණය

13.5 විනිශ්චය සභාව/ විමර්ශන නිලධරයා විසින් අනාවරණය කරගත් කරුණු වලින් එකක් හෝ කිහිපයක් හෝ එයින් කොටසක්; ලැබී ඇති සාක්‍ෂි පදනම් කොට ගෙන පිළිගැනීමට, ප්‍රතික්‍ෂේප කිරීමට හෝ සංශෝධනය කිරීමට විනය බලධරයා හට බලය ඇත්තේ ය. විනය බලධරයා විසින් විනිශ්චය සභාවේ/ විමර්ශන නිලධරයාගේ යම් අනාවරණය කර ගැනීමක් සංශෝධනය කරන විට හෝ ප්‍රතික්‍ෂේප කරන විට, එසේ කිරීමට හේතු වූ කරුණු අදාල විනය කරුණු අඩංගු ගොනුවේ සඳහන් කිරීම විනය බලධරයාගේ වගකීම වන්නේ ය.

පිලිගැනීමට, ප්‍රතික්‍ෂේප කිරීමටත් හෝ සංශෝධනය කිරීමටත් බලය

13.6 පරීක්‍ෂණ වාර්තාව අධ්‍යයනය කිරීමෙන් පසු, චූදිත තැනැත්තා ඔහුට විරුද්ධව ඉදිරිපත් කරන ලද චෝදනා සියල්ලටම හෝ එයින් කිහිපයකට හෝ එක්

විනය බලධරයාගේ තීරණය

චෝදනාවකට පමණක් වරදකරු වී ඇති බව හෝ විනය පරීක්ෂණය සම්පූර්ණයෙන්ම අවලංගු කොට අලුතින් පරීක්ෂණයක් පැවැත්වීමට විනය බලධරයා විසින් තීරණය කළ යුතු වේ.

13.7 ඉහත 13.6 උපඡේදයට අනුව, විනය බලධරයා විසින් අළුතින් විනය පරීක්ෂණයක් පැවැත්විය යුතු යැයි තීරණය කළ විට, එසේ කිරීමට හේතු පාදක වු කරුණු අදාල පරිදි ලේඛනගත කොට, ප්‍රමාදයකින් තොරව වෙනත් විනිශ්චය සභාවකින් / විමර්ශන නිලධරයෙකු පත්කල යුතු වේ.

අළුතින් පරීක්ෂණයක් පැවැත්වීමට තීරණය කලවිට

13.8 එවැනි තීරණයක් ගන්නා ලද අවස්ථාවක දී, එකී තීරණය ගැනීමට හේතු වූ කරුණු අදාල පරිදි විනය පරීක්ෂණ ගොනුවේ සටහන් කිරීමට විනය බලධරයා ක්‍රියාකල යුතු ය.

හේතු සටහන් කිරීම

13.9 විනිශ්චය සභාවක්/ විමර්ශන නිලධරයෙකු විසින් පවත්වන ලද විනය පරීක්ෂණයක් විනය බලධරයා විසින් අහෝසි කළ යුත්තේ එම පරීක්ෂණය පිළිගත් ක්‍රමවේදයන්ට අනුව පවත්වා නොමැති විට හෝ පැමිණිල්ල මෙහෙයවන නිලධරයා හිතාමතාම, නොසැලකිල්ලෙන් හෝ අනවධානයෙන් ක්‍රියාකරමින් කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයේ/ විද්‍යායතනයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අසමත් වීම නිසා යන කරුණු අනාවරණය වු අවස්ථාවකදී ය.

විධිමත් විනය පරීක්ෂණයක් අහෝසි කලයුතු අවස්ථා

13.10 පරීක්ෂණ වාර්තාවක, චූදිත තැනැත්තා විසින් සිදුකරන ලද වෙනත් විෂමාචාරයක් සම්බන්ධයෙන් අනාවරණයක් කරගත් විට, එම විෂමාචාරය සම්බන්ධයෙන් ද විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම විනය බලධරයාගේ වගකීම වේ.

වෙනත් විෂමාචාරයක් වාර්තා වූ විට

13.11 විනය පරීක්ෂණ වාර්තාවට අනුව, එම විනය පරීක්ෂණයේ සාක්ෂිකරුවකු වූ යම් නිලධරයකුගේ සාක්ෂිය තුලින් අනාවරණය වූ වෙනත් නිලධරයකු යම් විෂමාචාරයක් සිදුකර ඇතිබවට අනාවරණය වූ කල්හි සහ අදාල විනය බලධරයා එම නිලධාරීන්ගේ විෂයයෙහි ද විනය බලධරයා වූ විට එකී නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම, එම විනය බලධරයා නොවන විට, හැකි විගස එම නිලධාරීන්ගේ විෂමාචාර ක්‍රියාවන් අදාල විනය බලධාරීන් වෙත වාර්තාකල යුතු වේ.

වෙනත් නිලධරයෙකුගේ විෂමාචාරි ක්‍රියාවක් අනාවරණය වු විට

13.12 වෙනත් විෂමාචාරයක් සිදු වි ඇතැයි සැලකෙන කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යයන ආයතනයක/ විද්‍යායතනයක කිසියම් දෝෂයක් පරීක්ෂණ වාර්තාවෙන් එළිදරව් වු විට අදාල විනය බලධරයා විසින්, ඒ බව කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යයන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයාට හෝ

ආයතනයේ අඩුපාඩුවක් අනාවරණය වු විට

විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයට වාර්තා කළ යුතු ය. එසේ වාර්තා කරන ලද දෝෂය හෝ අඩුපාඩුව නිවැරදි කිරීම පිණිස පියවර ගැනීම එම ආයතනයන් හි ප්‍රධාන විධායක නිලධාරිගේ වගකීම වන්නේ ය.

13.13 විනිශ්චය සභාවේ/ විමර්ශන නිලධරයෙකු විසින්, පරීක්ෂණයේ දී අනාවරණය වූ වැරදි නැවත සිදුවීම වැලැක්වීමේ අරමුණින් සහ ආයතනයේ යහපැවැත්ම උදෙසා ලබාදුන් නිරීක්ෂණ සහ සාධණීය යෝජනා ද පරිපාලනයේ හෝ ක්‍රමවේදයන් හි සිදුකල යුතු යැයි යෝජනා කරන ලද වෙනස් කිරීම් සම්බන්ධයෙන් අදාල පරිදි කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ වෙනත් සුදුසු බලධරයෙකු හට ප්‍රමාදයකින් තොරව දැන්වීම, විනය බලධාරියාගේ කාර්යභාරය වේ.

විනය බලධාරියාගේ කාර්යභාරය

13.14 විනය බලධරයෙකු විසින් ලබා දුන් විනය නියෝගයක පහත සඳහන් කරුණු අනිවාර්යයෙන් ඇතුලත් විය යුතු ය;

විනය නියෝගගහේ අන්තර්ගත වියයුතු කරුණු

(අ) චූදිත තැනැත්තා හට යොමු කරනු ලැබූ චෝදනා පත්‍රයෙහි සඳහන් චෝදනා සියල්ලටම හෝ චෝදනාවකට හෝ ඔහු වැරදිකරු වී ඇත්ද යන්න හෝ එම චෝදනාවන්ට ඔහු නිවැරදි කරු ද යන්න

(ආ) චූදිත තැනැත්තා වරදකරු වී ඇති චෝදනාවකට / චෝදනාවන්ට අදාලව පැනවිය යුතු දඬුවම්/ කොන්දේසි, එනම් පහත සඳහන් දඬුවම් වලින් එකක් හෝ කිහිපයක්;

i. අවවාද කිරීම (තරවටු කිරීම)
ii. තදින් අවවාද කිරීම
iii. තහනම් කිරීම
iv. සතියක වැටුප නොඉක්මවන පරිදි දඩයක් නියම කිරීම
v. එක් අවුරුදු කාලයක් නොඉක්මවන ලෙසට එක් වැටුප් වර්ධකයක් හෝ වැටුප් වර්ධක කිහිපයක් නැවැත්වීම, අඩුකිරීම හෝ විලම්භනය කිරීම
vi. විනය පරීක්ෂණයෙන් පසුව යම් මුදලක් ආපසු අයකර ගැනීම
vii. විනය හේතුමත සිදුකරන ස්ථාන මාරු කිරීම්
viii. අවුරුද්දකට වැඩි කාලයක් සඳහා එක් වැටුප් වර්ධකයක් හෝ වැටුප් වර්ධක කිහිපයක් නැවැත්වීම, අඩුකිරීම හෝ විලම්භනය කිරීම
ix. උසස්වීම් සඳහා පවත්වන පරීක්ෂණයකට පෙනී සිටීමට නුසුදුස්සෙකු කිරීම හෝ නිශ්චිත කාල සීමාවන් සඳහා උසස්වීමක් සඳහා සලකා බැලීමට නුසුදුස්සෙකු කිරීම
x. යම් නිශ්චිත කාලසීමාවක් සඳහා උසස්වීම් ලබා නොදී සිටීම
xi. තමන් අයත් ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨත්වය පහත දැමීම (නිශ්චිත ස්ථාන ගණනකින්)

xii. නිල තත්ත්වයෙන් පහල දැමීම
xiii. සාමාන්‍ය අකාර්යක්ෂමතාවය වෙනුවෙන් විශ්‍රාම යැවීම
xiv. විනය පරීක්ෂණයෙන් පසු සේවය අවසන් කිරීම
xv. සේවයෙන් පහ කිරීම

13.15 යම් චූදිත තැනැත්තෙකුට එරෙහිව ඉදිරිපත් කරන ලද කිසියම් චෝදනා වලින් ඔහු නිදහස් කළ යුතු යැයි විනය බලධරයා තීරණය කළ විටදී, එම තීරණය අදාල පරිදි චූදිත තැනැත්තා වෙත දැන්විය යුතු ය. එම තැනැත්තා, තමන්ට එරෙහිව නගන ලද චෝදනා සම්බන්ධයෙන් වැඩ තහනමට ලක් වී සිටින්නේ නම්, අදාල විනය නියෝගයේ ඔහු නැවත සේවයේ පිහිටවන ලෙසට දැක්වෙන නියෝගයත් නිකුත්කල යුතු අතර, අදාල තැනැත්තාගේ වැඩ තහනමට ලක් වී සිටි කාලය තුල දී නොගෙවා තිබූ පාරිශ්‍රමිකයන් නැවත ගෙවීමට හෝ නොගෙවන ලෙසට දැක්වෙන නියෝගයන් ද එහි අඩංගු විය යුතුවේ.

චූදිත තැනැත්තා නිදහස් කිරීමට විනය බලධරයා තීරණය කල විට

13.16 සිදුකරන ලද වරද, සුළු දඬුවම් යටතට ගැනෙන වරදක් නම්, ඒ සඳහා සුළු දඬුවමක් පමණක් ලබා දීමට විනය බලධරයා කටයුතු කරනු ඇත.

සුළු දඬුවම් යටතට ගැනෙන වරදක් වූ විට

13.17 නිකුත් කර ඇති චෝදනා පත්‍රයට අනුව, සිදුකර ඇත්තේ බරපතල දඬුවමක් ලැබීමට තරම් වන වරදක් / වරදවල් නම්, විනය බලධරයා විසින් මෙයි 13.18 උපඡේදයෙහි දක්වා ඇති පරිදි, සුළු දඬුවමක් සහ / හෝ බරපතල දඬුවමක් පනවනු ඇත.

බරපතල දඬුවම් යටතට ගැනෙන වරදක් වූ විට

13.18 චූදිත තැනැත්තා තමන්ට එරෙහිව නගන ලද චෝදනා සියල්ලටම හෝ චෝදනා කිහිපයකට හෝ එයින් එක් චෝදනාවකට පමණක් හෝ වරදකරු වී ඇති බව විනය බලධරයා හට අනාවරණය වූ විට, එක් එක් චෝදනාවන් සඳහා වෙන වෙනම දඬුවම් පැනවීම හෝ සියළුම චෝදනාවන්ට එක් දඬුවමක් පැනවීමට එම විනය නිලධරයා හට හැකියාව තිබේ. මෙහි දී පනවනු ලබන දඬුවම මෙම පරිච්ඡේදයේ 4 වන ඡේදයෙහි විස්තර කොට ඇති අකාරයට එක් දඬුවමක් පමණක් හෝ දඬුවම් කිහිපයක එකතුවක් විය හැකි ය.

එක් එක් චෝදනාවන්ට සඳහා වෙනත් දඬුවම් පැනවීම

13.19 සේවය අත්හිටුවා ඇති (වැඩ තහනම් කොට ඇති) සේවකයෙකු හට සේවයෙන් පහකිරීමට වඩා අඩු මට්ටමේ දඬුවමක් ලබා දෙන විට, එම තැනැත්තා වහාම නැවත සේවයේ පිහිටුවන ලෙසට සහ ඔහුගේ නොගෙවා ඇති සියළුම පාරිශ්‍රමිකයන් හෝ එයින් යම් නියම කරන ලද කොටසක් ගෙවන ලෙසට ද එම නියෝගයේ සඳහන් කළ යුතු වේ. එම නියෝගය ලබා දෙන අවස්ථාවේ දී, විනය පරිපාලන කටයුතු හේතුවෙන් අදාල තැනැත්තාගේ සේවය අත්හිටුවා තිබූ කාලපරාසය දීර්ඝ කිරීම හෝ විශේෂයෙන් චූදිත තැනැත්තාගේ

ලබාදුන් දඬුවම සේවයෙන් පහකිරීමට වඩා අඩු දඬුවමක් වූ විට

වරදකින් නොවන එහෙත් යම් අස්වාභාවික ප්‍රමාද වීමක් හේතුවෙන් සිදුවූ කාලය ගත වීමක් ගැනද විනය බලධරයාගේ අවධානය යොමුවිය යුතු වේ.

13.20 විනය පරීක්‍ෂණය අවසානයේ දී හෝ නිදහසට කරුණු විමසීමෙන් අනතුරුව යම් චූදිත තැනැත්තෙකු විෂයයෙහි, විනය බලධරයා විසින් පනවන ලද දඬුවමක් ක්‍රියාත්මක වන දිනය වන්නේ, එම තැනැත්තා වෙත චෝදනා පත්‍රයක් නිකුත් කරන ලද දිනය හෝ ඔහුගෙන් නිදහසට කරුණු විමසන ලද දිනයයි.

කරුණු එසේ වුවද, අඩවැටුප් මත වැඩ තහනමට ලක්වී සිටින යම් තැනැත්තෙකුගේ සේවය අවසන් කල බවට විනය නියෝගය ලබා දුන් අවස්ථාවක දී, එසේ සේවය අවසන් කිරීමට නියෝගය දුන් දිනය දඬුවම ක්‍රියාත්මක වන දිනය විය යුතු ය.

දඬුවමක් ක්‍රියාත්මකවන දිනය

13.21 විනය බලධරයා විසින් ඒ අනුව, චූදිත තැනැත්තා වෙත තම නියෝගය ලබාදිය යුතු ය. එම විනය නියෝගයේ චූදිත තැනැත්තාට එරෙහිව නිකුත් කරන ලද චෝදනා පත්‍රයේ සඳහන් එක් එක් චෝදනාවන්ට ඔහු වැරදිකරු හෝ නිවැරදිකරු වී ඇති බවට සඳහන් විය යුතු අතර, වැරදිකරු වී ඇත්නම්, එම තැනැත්තාට විරුද්ධව පනවා ඇති දඬුවම් හෝ යම් කොන්දේසි පනවා ඇත්නම් ඒවා ද සඳහන් විය යුතු ය .

විනය නියෝගයේ ස්වභාවය

13.22 විනය නියෝගය චූදිත තැනැත්තා වෙත ලැබෙන පරිදි ලියාපංදිචි තැපැලෙන් යැවිය යුතු ය. එම අවස්ථාවේදී ම එකී විනය නියෝගයේ පිටපත්, චෝදනා පත්‍රයේ පිටපත් යොමුකර ඇති සියළුම බලධරයින් සහ නිලධරයන් වෙත ද ලියාපදිංචි තැපැලෙන් යැවීම හෝ අතින් භාරදීම සිදුකල යුතු ය.

විනය නියෝගය කෙලින්ම චූදිත තැනැත්තා හට යැවිය යුතු ය

13.23 යම් චූදිත තැනැත්තෙකු ඔහුට එල්ල කරන ලද චෝදනා වලින් නිදහස් කරන ලද අවස්ථාවක දී එම විනය නියෝගයට පහත සඳහන් කරුණු ඇතුලත් විය යුතු ය.

අ) සේවකයා වැඩ තහනමට ලක්වී සිටී නම්, ඔහු නැවත සේවයේ පිහිටුවීමේ නියෝගය;

ආ) වැඩ තහනමට ලක්වී සිටි කාලය තුළදී අත්හිටුවා තිබූ වැටුප් ගෙවීමේ නියෝගය;

ඇ) විනය ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් අත්හිටුවා තිබූ සියලුම වැටුප් වර්ධක ගෙවීමේ නියෝගය;

යම් තැනැත්තෙකු චෝදනා වලින් නිදහස් කල විට

13.24 විධිමත් විනය පරීක්‍ෂණයක් අවසානයේ දී, යම් විනය නියෝගයක් චූදිත තැනැත්තෙකු විෂයයෙහි නිකුත් කරන අවස්ථාවේ දී, ඔහුට විරුද්ධව වෙනත් විනය පරීක්‍ෂණයක් පැවැත්වෙමින් තිබේ නම්; දැනට පැවැත්වෙමින් ඇති විධිමත් විනය පරීක්ෂණය අවසන් කොට එහි නියෝගය නිකුත් කරන තෙක්, ප්‍රථමයෙන් අවසන් වූ විනය පරීක්ෂණයේ නියෝගය නිකුත් කිරීම අත්හිටුවිය යුතුය.

වෙනත් පරීක්‍ෂණයක් පැවැත්වෙන විට

## 14. විනය නියෝගයන් සංශෝධනය කිරීම සහ වෙනස් කිරීම

14.1 වාර්තාවෙහි අඩංගු සහ දක්නට ඇති දෝෂ සහගත තැන් හැරෙන්නට විනය නියෝගයක ඇති කිසිදු කරුණක් කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන ආයතනයක විද්‍යායතනයක පාලක බල මණ්ඩලයකින් මිස විනය බලධරයෙකු විසින් (එනම්, මෙහි උපලේඛනයෙහි බලය පවරනු ලැබූ නිලධාරීන් විසින්) සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට කටයුතු නොකළ යුතු ය.

විනය නියෝගය සංශෝධනය නොකල යුතුය

14.2 යම් විනය නියෝගයක් සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට අවශ්‍ය වූ විට, ඒ පිළිබඳව සකස් කරන ලද අයදුම්පතක් කොමිෂන් සභාවට හෝ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක පාලක බල මණ්ඩලයට මෙහි III පරිච්ඡේදයේ 20.11 උප ඡේදයෙහි සඳහන් නියමයන්ට අනුව ඉදිරිපත් කළ යුතු අතර, එම අයදුම්පත සම්බන්ධයෙන් මෙහි දකවා ඇති පරිදි කටයුතු කළ යුතු වේ. විනය නියෝගය සේවයෙන් පහ කිරීමක් සම්බන්ධයෙන් නම්, එම නියෝගය සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට අයදුම් කරන විට එකී අයදුම් පත සේවයෙන් පහ කළ දිනයේ සිට මාස හයක් (06) ඇතුළත දී ඉදිරිපත් කළ යුතු වේ.

විනය නියෝගයක් සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට ඉල්ලුම් කිරීම

## 15. විනය නියෝගයන්ට විරුද්ධව කරන අභියාචනා

15.1 පනතේ 86 වන වගන්තියට අනුව, කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක කාර්ය මණ්ඩලයට අදාළ විනය කරුණු සම්බන්ධයෙන් අභියාචනා බලධරයා වන්නේ, විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයයි.

විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය

15.1.1 කොමිෂන් සභාවේ/ පාලක සභාවක/ කළමනාකාරණ මණ්ඩලයක හෝ වෙනත් ඕනෑම බලධරයකු හෝ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක බලතල කුමක් වුවද, පණතෙහි 86 සහ 87 වගන්තිවලට අනුව, විශ්ව විද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයට අභියාචනා විභාග කිරීමට සහ තීරණ ලබාදීමට බලය ඇත්තේ ය.

විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ තීරණ

15.1.2 පනතෙහි 86 වගන්තිය යටතේ ක්‍රියා කරමින්, විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලය විසින් තමන් වෙත පවරා ඇති බලතල, කාර්ය සහ කර්තව්‍යයන් ඉෂ්ට කිරීමේ දී, මුදවා හැරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී ලබාදුන් යම් තීරණයක් අවසාන තීරණය වන අතර, එවැනි තීරණයක් අනුසාරයෙන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් ගතයුතු අවස්ථාවන්හි දී, කොමිෂන් සභාව/ උසස් අධ්‍යාපන

විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වන්නේ ය

ආයතනය/ විද්‍යායතනය විසින් අදාළ පරිදි එහි තීරණය ක්‍රියාත්මක කළ යුතු යුතු වේ. (පනතෙහි 87 වන වගන්තිය)

## 16. සාපරාධී වැරදි, අල්ලස් චෝදනා සහ විනිශ්චයට භාජනය වී ඇති කරුණු

16.1 මූලික විමර්ශනයක් අතරතුර දී, අපරාධ විධිවිධාන සංග්‍රහ පනතේ සාපරාධී වරදක් ලෙස වර්ගීකරණය කරනු ලැබූ වරදක් හෝ අල්ලස් හෝ දූෂණයට සම්බන්ධ වරදක් අනාවරණය වූ විට, උචිත පරිදි එම කරුණ කොමිෂන් සභාවේ සභාපතිවරයාට හෝ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයා හට, එම පරීක්ෂණ සටහන්වල පිටපත් ද සමඟ කඩිනමින් වාර්තා කළ යුතු ය. එවිට, ඔවුන් එම කරුණ අදාළ පරිදි පොලිසියට හෝ අල්ලස් සහ දූෂණ විමර්ශන කොමිසමට හෝ වෙනත් සුදුසු ව්‍යවස්ථාපිත ආයතනයකට අදාල නීති ප්‍රතිපාදන යටතේ සුදුසු පියවර ගැනීම සඳහා යොමු කරනු ඇත.

මූලික විමර්ශනයේදී අනාවරණය වූ සාපරාදී ක්‍රියා සහ අල්ලස් ගැනීම්

16.2 විනය පරීක්ෂණයක් අතරතුර දී හෝ එම පරීක්ෂණය අවසානයේ දී සාපරාධී වරදක් හෝ අල්ලස් හෝ දූෂණයට අදාළ යම් වරදක් අනාවරණය වූ විට විනිශ්චය සභාව/ විමර්ශන නිලධාරයා විසින් උචිත පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයාට/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයාට එම කරුණට අදාළ වාර්තාවල පිටපත් ද සමඟ වාර්තා කළ යුතු අතර, ඔවුන් එය අදාල බලධාරීන් වෙත අවශ්‍ය කටයුතු කිරීම සඳහා යොමු කරනු ඇත.

විධිමත් විනය පරීක්ෂණයක් අතරතුරදී හෝ එය අවසානයේදී

16.2.1 විනය පරීක්ෂණ කටයුතු අවසන් කොට ඇත්නම්, අදාල විනය නියෝගය ලබාදීම ඉහත සඳහන් පරිදි අනාවරණය කරගත් කරුණ පොලිසියට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට හෝ වෙනත් සුදුසු ව්‍යවස්ථාපිත ආයතනයක වාර්තා කිරීමට පෙර සිදුකළ යුතුවේ.

විනය පරීක්ෂණ කටයුතු අවසන් වී ඇති විට

16.3 ඉහත 16.1 සහ 16.2 උපඡේදයන් යටතේ දක්වා ඇති පරිදි අනාවරණය කරගත් කරුණ අදාළ බලධාරීන් වෙත දන්වා යැවූව ද, සිදුකරමින් පවතින මූලික විමර්ශනය යම් තදබල හේතුවක් හෝ නොවැළැක්විය හැකි තත්ත්වයන් යටතේ හැර කල් දැමීමට හෝ අත්හිටුවීමට ක්‍රියා නොකල යුතු ය. යම් හෙයකින් මූලික විමර්ශනයක් එවැනි තදබල හේතුවක් හෝ නොවැළැක්විය හැකි තත්ත්වයක් යටතේ අත්හිටවූ විට එය කඩිනමින් නැවත ආරම්භ කළ යුතු ය.

මූලික විමර්ශනය නොකඩවා පැවැත්විය යුතුය

**පරීක්ෂණ නිලධාරීන්ට ලේඛන ලබාදීම**

16.4 නීතිමය කටයුතු සිදු කිරීමට අදාළ බලධාරීන් දැනුවත් කල පසු, එම බලධාරීන් විසින් යම් ලේඛන ඉල්ලා සිටි විටකදී තිබෙන යම් භාණ්ඩයක් හෝ ඔවුන්ගේ පරීක්ෂණයේ දී වැදගත් විය හැකි වෙනත් එවැනි යම් දෙයක්; විනය බලධරයා හෝ එම බලය පවරනු ලැබූ වෙනත් යම් නිලධරයකු විසින් එම අයිතමයන් සහ ලේඛන අදාළ බලධාරීන් වෙත ලබාදිය යුතු වේ.

**ලබාදුන් ලේඛනවල පිටපත් තබාගත යුතු ය**

16.5 නීතිමය කටයුතු සිදු කිරීමට අදාළ බලධාරීන් දැනුවත් කළ පසු එම බලධාරීන් විසින් යම් ලේඛන ඉල්ලා සිටි විටක දී තිබෙන, යම් භාණ්ඩයක් හෝ ඔවුන්ගේ පරීක්ෂණයේදී වැදගත් විය හැකි වෙනත් එවැනි යම් දෙයක් විනය බලධරයා හෝ එම බලය පවරනු ලැබූ වෙනත් යම් නිලධරයකු විසින් එම අයිතමයන් සහ ලේඛන අදාළබලධාරීන් වෙත ලබාදිය යුතු වේ. (පරීක්ෂණ නිලධාරීන්ට ලේඛන ලබාදීම)

**අත්අඩංගුවට ගත් විට හෝ රිමාන්ඩ් භාරයට පත් කළ විට අනිවාර්ය නිවාඩු**

16.6 යම් සේවකයකුට විරුද්ධව නීතිමය කටයුතු කිරීම පිණිස පොලිසිය විසින් හෝ වෙනත් බලධරයෙකු විසින් අත්අඩංගුවට ගත් විට හෝ එම සේවකයා උසාවියකදී විභාග කරනු ලබන යම් නීති කෘත්‍යයකට ප්‍රථමයෙන් රිමාන්ඩ් භාරයට පත්කළ අවස්ථාවක දී, එම කාලසීමාව ආවරණය වන පරිදි, ඔහුට අනිවාර්ය නිවාඩු ලබාදිය යුතු යුතු ය.

**උසාවියකින් රිමාන්ඩ් බන්ධනාගාර ගත කළ විට**

16.7 කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවයේ නියුතු යම් තැනැත්තකු උසාවියක් විසින් රිමාන්ඩ් ගත කළ විට එම අවස්ථාවේදීම ඔහුගේ වැඩ තහනම් කළ යුතු ය.

**විමර්ශනය පැවැත්වෙන අතරතුරදී නැවත සේවයේ පිහිටුවීමට අදාළ කොන්දේසි**

16.8 පොලිසිය විසින් හෝ වෙනත් ව්‍යවස්ථාපිත බලධරයකු විසින් අත්අඩංගුවට ගනු ලැබූ සේවකයෙකු, අත්අඩංගුවෙන් නිදහස් කළ විට, පත්කිරීමේ බලධරයා විසින් එම තැනැත්තා නැවත සේවයේ පිහිටුවිය යුතු ය. එසේ වුවද, විනය බලධරයා විසින් පැවැත්වීමට නියමිත මූලික විමර්ශනයක් හෝ විධිමත් විනය පරීක්ෂණයකට එසේ නැවත සේවයේ පිහිටුවීම බාධාවක් වේ යැයි අදහස් කරන අවස්ථාවක දී, චූදිත තැනැත්තා නැවත සේවයේ පිහිටුවීම නොකළ යුතු අතර, වැඩ තහනම් කිරීම දිගටම පවත්වාගෙන යා යුතු ය.

**විනය පරීක්ෂණය උසාවි ක්‍රියාමාර්ගයන්ට පරිබාහිරව සිදුකිරීම**

16.9 යම් චූදිත තැනැත්තෙකුට විරුද්ධව උසාවියක දී නීතිමය කටයුතු සිදුවෙමින් පවතින අතරතුර දී වුවද, ඔහුට විරුද්ධව ආරම්භ කොට ඇති විනය පරීක්ෂණය, එම උසාවි ක්‍රියාමාර්ගයන්ට පරිබාහිරව පවත්වාගෙන යාමට විනය බලධරයා විසින් කටයුතු කළ යුතු ය . තදබල හේතුවක් ඇති විට හෝ නො වැළැක්විය හැකි තත්ත්වයක් යටතේ පමණක්, එම විනය පරීක්ෂණය කල්දැමීම හෝ අත්හිටුවීමට අවකාශ තිබේ.

16.10 උසාවියක දී යම් තැනැත්තෙකුට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් තිබීම, පවත්වන ලද විනය පරීක්ෂණය අවසානයේ දී එම තැනැත්තාට විරුද්ධව විනය නියෝගයක් ලබාදීම කෙරෙහි කුමන හේතුවක් මත හෝ බල නොපානු ඇත.

විනය නියෝගය දීමට බාධාවක් නොවේ

16.11 යම් තැනැත්තෙකුට එරෙහිව එල්ල කරන ලද චෝදනාවක් හෝ චෝදනාවන් සම්බන්ධයෙන් පවත්වන ලද විනය පරීක්‍ෂණයක දී, ඔහු නිදොස් කරනු ලැබුව ද, උසාවියකදී එම චෝදනාවන් සම්බන්ධයෙන් ම ඔහු වරදකරු කරනු ලැබූ විට ආයතනික විනය පරීක්ෂණයෙන්, එම තැනැත්තා නිදොස් කරනු ලැබීය යන කරුණු ඔහුට විරුද්ධව විනය පියවර ගැනීමට බාධාවක් නොවිය යුතු ය.

විනය පරීක්ෂණයේදී නිදොස් වීම සහ උසාවියෙන් වරදකරු කිරීම

16.12 යම් තැනැත්තෙකුට එරෙහිව එල්ල කරන ලද චෝදනාවකට හෝ චෝදනාවන්ට උසාවියක දී මෙන්ම විනය පරීක්ෂණයකදී විමර්ශනය කිරීමෙන් අනතුරුව, එම තැනැත්තා ආයතනික විනය පරීක්ෂණයේ දී චෝදනාවන්ට වරදකරු යැයි නිගමනය කළ විට ඔහු උසාවි ක්‍රියාමාර්ගයෙන් නිදහස් වී තිබුන ද ඔහුට විරුද්ධව ඇති කරුණු මත ආයතනික විනය ක්‍රියා පරිපාටියන්ට අනුව විනය පියවර ගැනීමට බාධාවක් නොවනු ඇත.

විනය පරීක්ෂණයේ නිගමන ක්‍රියාත්මක කළ යුතුය

## 17. උසාවියකින් වරදකරු කරනු ලැබීම හෝ ව්‍යවස්ථාපිත බලධරයෙකු විසින් දඬුවම් ලබාදීම

17.1 කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තෙකු, යම් සාපරාධි ක්‍රියාවක් හේතුවෙන් උසාවියක් මඟින් දඬුවම් කරනු ලැබූ විට හෝ අපරාධ නීති සංග්‍රහය පනතේ 449 වැනි වගන්තිය ප්‍රකාරව යම් දඬුවමකට භාජනය කළ කල්හි මෙන්ම, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ විභාග කොමසාරිස්වරයා ආදී අයෙකු වැනි ව්‍යවස්ථාපිත බලධරයකු විසින් යම් වරදක් හේතු කොටගෙන දඬුවම් පමුණුවා ඇත්නම් හෝ දඬුවමකට භාජනය සිද්ධියට අදාළ සියළුම කරුණු එකී උසාවිය විසින් හෝ ව්‍යවස්ථාපිත බලධරයා විසින් කොමිෂන් සභාවේ සභාපතිවරයාට/ උසස් අධ්‍යාපන ආයතනයක /විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයාට එම ක්‍රියාමාර්ගයන් අඩංගු ලේඛනවල පිටපත් ද සමඟ වාර්තා කළ යුතු ය.

අදාළ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියා වෙත වාර්තා කළ යුතු ය

17.2 ඉහත 17.1 උපඡේදයෙහි සඳහන් පරිදි වාර්තාවක් ලැබුණු විට එම වාර්තාව විනය බලධරයා වෙත යොමු කළ යුතු අතර, එම විනය බලධරයා විසින් සිද්ධියට අදාළ සියලුම කරුණු විමසීමෙන් අනතුරුව අවශ්‍ය වේ නම්, එම වාර්තාව වැඩිදුර විමර්ශනය සඳහා යොමු කොට සිද්ධියට අදාළ කරුණුවලට ගැලපෙන ආකාරයෙන් දඬුවමක් නියම කළ හැකි

විනය බලධරයාගේ ක්‍රියාමාර්ගය

ය. උසාවියකින් හෝ ව්‍යවස්ථාපිත බලධරයකු විසින් ලබා දුන් දඬුවම් ලබාදීමේ තීරණයට හෝ අනාවරණය වී කරුණු වලට එරෙහිව යම් තැනැත්තෙකු විසින් අභියාචනයක් ඉදිරිපත් කොට ඇති බව සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ද සමඟ විනය බලධරයා වෙත කරුණු ඉදිරිපත් කළ විට එම අභියාචනයේ තීරණය ලැබෙන තෙක් දඬුවම් ලබාදීම ප්‍රමාද කිරීමට විනය බලධරයා කටයුතු කළ යුතු ය.

17.3 යම් තැනැත්තකු උසාවියක් මඟින් හෝ ව්‍යවස්ථාපිත බලධරයකු මඟින් නිදහස් කොට හෝ වැරදිවලින් නිදොස් කොට ඇති අවස්ථාවකදී වුවද, මෙහි නියමයන්ට අනුව ඔහුට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රමාණවත් කරුණු තිබේ නම්, එසේ කිරීමට බාධාවක් නොවේ. — උසාවියකින් නිදහස් කළ ද විනය ක්‍රියාමාර්ග ගැනීම

සාමාන්‍යයෙන් එවැනි විමර්ශනයක් ආරම්භ කළ යුත්තේ, එම වරද සේවයේ යෙදී සිටියදී සිදුකරන ලද විට හෝ වරද කොමිෂන් සභාවට හෝ උසස් අධ්‍යාපන ආයතනයකට/ විද්‍යායතනයකට අයත් පරිශ්‍රයකදී සිදුකර ඇති විටෙක දී ය.

17.4 මෙහි ඇති ප්‍රතිපාදනයන්ට අනුකූලව, විනය බලධරයකු විසින් යම් තැනැත්තෙකු විසින් සිදුකළ වරදට දඬුවම් පමුණුවා ඇති විටෙක දී, එම චෝදනාව සම්බන්ධයෙන් ඔහු උසාවියක් මඟින් නිදහස් කොට හෝ උසාවියකින් දුන් දඬුවමක් අභියාචනයක් මඟින් අහෝසි කොට ඇති බව දන්වමින් තමාට එසේ විනය බලධරයා විසින් ලබා දුන් දඬුවම ලිහිල් කරන ලෙසට ඉල්ලා සිටිය නොහැකි ය. — දඬුවම ඉවත් කරන ලෙසට ඉල්ලා සිටිය නොහැක

## 18. විමර්ශන, කොමිෂන් සභා වාර්තාවන් සහ විගණන වාර්තාවන් මඟින් අනාවරණය වූ වැරදි

18.1 විමර්ශන, කොමිෂන් සභා වාර්තාවක් මඟින් සහ විගණන වාර්තාවක් මඟින් යම් තැනැත්තකු විසින් සිදුකරන ලදැයි අනාවරණය වූ සහ එම වරදට ඔහු වගකිවයුතු යැයි කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයා සෑහීමකට පත් වූ අවස්ථාවක දී, එම තැනැත්තාගෙන් ලිඛිතව කරුණු විමසා, එම කරුණු තමන්ගේ නිර්දේශ ද සමඟ අදාළ විනය බලධරයා වෙත, එම සභාපතිවරයා හෝ ප්රධාන විධායක නිලධරයා කළ යුතු ය. — ලිඛිතව කරුණු දැක්වීමට දැන්වීම

18.2 එවිට, විනය බලධරයා විසින්, අවශ්‍ය යැයි සැලකෙන පරිදි, ඒ පිළිබඳව විමර්ශනය කිරීමට කමිටුවක් පත්කොට, සුදුසු දඬුවමක් පැනවීමට කටයුතු කරනු ඇත. — විනය බලධරයාගේ ක්‍රියාමාර්ග

## 19. වැඩ තහනම් කිරීම සහ අනිවාර්ය නිවාඩු යැවීම (මෙම කොටස VI පරිච්ඡේදයේ 8 වන ඡේදය සමඟ කියවිය යුතුය)

19.1 කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවයේ නියුතු යම් තැනැත්තකු තම තනතුරේ රාජකාරී කටයුතුවල යෙදීම නොමැනවයි සැලකෙන අවස්ථාවකදී, කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් හෝ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධාරියා විසින් හෝ පහත සඳහන් තත්ත්වයන් යටතේ එම තැනැත්තාගේ වැඩ තහනම් කිරීමට කටයුතු කළ යුතු ය: වැඩ තහනම් කිරීම සුදුසු යැයි නිගමනය කළ විට

(අ) එම තැනැත්තාට විරුද්ධව ඉදිරිපත් කොට ඇති චෝදනා ඔප්පු වුවහොත්, එය ඔහු සේවයෙන් පහකිරීමට තරම් වන අන්දමේ චෝදනා වීම සහ ඒ පිළිබඳව දැනටමත් විනය පරීක්ෂණයක් හෝ අපරාධ ක්‍රියාමාර්ග ආරම්භ කොට තිබීම හෝ ආරම්භ කිරීමට නියමිතව තිබීම; හෝ

(ආ) ඉහත 17.1 උපඡේදයට අනුව උසාවියකින් හෝ ව්‍යවස්ථාපිත බලධරයකුගෙන් වාර්තාවක් ලැබී තිබීම හෝ ඉහත 16.1 උපඡේදයෙහි සඳහන් පරිදි, යම් තැනැත්තෙකු සේවයෙන් පහකිරීමට තරම් ප්‍රමාණවත් බරපතල වැරැද්දක් සිදුකොට ඇති ය යන්න, මෙම කරුණ 17.2 උපඡේදයෙහි සඳහන් පරිදි සුදුසු විනය බලධරයෙකු විසින් සලකා බලා නිගමනය කිරීමෙන් පසුව

19.1.1 ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරු දරන කාර්ය මණ්ඩල සාමාජිකයකුගේ වැඩ තහනම් කිරීමට අවශ්‍ය අවස්ථාවන් වලදී, ඔහු සාමාන්‍යයෙන් විනය පරීක්ෂණ කටයුතු පැවැත්වෙන තුරු වැඩ තහනමට ලක් නොකළ යුතු අතර, ඔහුගේ සේවා කොන්දේසි වලට අනුකූලව, සේවය අවසන් කිරීමට කටයුතු කළ යුතු ය. පරීක්ෂණය අවසානයේ දී එම තැනැත්තා නැවත තනතුරට පත් කළ යුතු බවට කරුණු අනාවරණය වන්නේ නම්, ඒ අනුව ඔහු නැවත තනතුරට පත් කළ යුතු ය. යම් සේවකයෙකුගේ සේවය නැවැත්වීම හේතුවෙන් විශේෂිත තත්ත්වයක් මත ඔහු පිළිබඳව කිසියම් පාලනයක් තබා ගැනීමට නොහැකි වේ යැයි හැඟෙන අවස්ථාවක දී, ඒ පිළිබඳව, කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයා විමසීමෙන් පසු ක්‍රියාකළ යුතු ය. ස්ථිර කාර්ය මණ්ඩලයේ නොවන තැනැත්තන්

19.2 යම් තැනැත්තකු අපරාධයක් සම්බන්ධයෙන් උසාවියකින් වරදකරු බවට නිශ්චිය කළ විට එම නියෝගයට එරෙහිව ඉහළ උසාවියකට අභියාචනයක් ඉදිරිපත් කොට තිබුණ ද, එකී වරදකරු බවට නියෝගය දුන් දිනයේ සිට ඔහුගේ වැඩ තහනම් කළ යුතු වේ. ඉහත 17.2 උපඡේදයේ සඳහන්වන ආකාරයට, විනය බලධරයා විසින් තීරණයක් ලබාදෙන තෙක්, ඒ ආකාරයට වැඩ තහනම් කිරීම ක්‍රියාත්මක වේ. එමෙන්ම, එම තැනැත්තා හට, වැඩ තහනමට ලක්වී සිටින කාලය පුරාවට කිසිඳු පරිශ්‍රමිකයක් නො ගෙවිය යුතු වේ. — සාපරාදී ක්‍රියාවකට වරදකරු වීම

19.3 ඉහත 19.2 උපඡේදයෙහි සඳහන් හේතු වලට අමතර වෙනත් හේතුවක් නිසා, යම් තැනැත්තෙකුගේ වැඩ තහනම් කළ විට, ඔහුට විරුද්ධව සිදුකරන විනය ක්‍රියාමාර්ග අවම ප්‍රමාදයකින් යුතුව සිදුකිරීමට කටයුතු කළ යුතු ය. — අවම ප්‍රමාදයකින් විනය කටයුතු අවසන් කිරීම

19.4 වැඩ තහනමට ලක්වී සිටින යම් තැනැත්තකු විෂයෙහි සිදුකළ විනය පරීක්ෂණය, අවසානයේ දී ඔහුට ලබා දුන් දඬුවම සේවයෙන් පහකිරීමට හෝ පොදු අකාර්යක්ෂමතාවය හේතුවෙන් සේවය අවසන් කිරීම යන දඬුවම්වලට වඩා ලිහිල් දඬුවමක් වන්නේ නම්, වහාම එම තැනැත්තා නැවත සේවයේ පිහිටුවිය යුතු අතර, ඔහුට හිඟ වැටුප් ගෙවන්නේ ද, නැද්ද යන නියෝගය විනය බලධරයා විසින් පසුව ලබාදෙනු ඇත. — නැවත සේවයේ පිහිටුවීම

19.5 වැඩ තහනම් කොට ඇති තැනැත්තකු හට, පාරිශ්‍රමිකයන් ගෙවීම, VI පරිච්ඡේදයේ 8 වැනි ඡේදයට අනුව නිගමනය කළ යුතු ය. — වැඩ තහනම් කාලය තුළ පාරිශ්‍රමිකයන්

19.6 වැඩ තහනමට ලක්වී සිටින තැනැත්තෙකු හට, සේවයෙන් පහකිරීමට වඩා අඩු දඬුවමක් ලබාදුන් විට, එම තැනැත්තා හට ගෙවීමට නියමිත පාරිශ්‍රමිකයන් හෝ පාරිශ්‍රමිකයේ යම් කොටසක් සම්බන්ධයෙන්, එම විනය බලධරයා විසින් නිගමනය කොට එම විනය නියෝගයේ සඳහන් විය යුතු අතර, ඉහත 19.5 උපඡේදයට අනුව විනය නියෝගයේ කොටසක් ලෙස දැක්විය යුතු වේ. — ගෙවීමට ඇති ප්‍රමාණය විනය බලධරයා නිගමනය කළ පරිදි

19.7 මෙම කොටසේ නියමයන්ට අනුව, යම් තැනැත්තකු සුදුසු පරිදි වැඩ තහනමට ලක් කිරීමට නොහැකි වන අවස්ථාවක දී, එහෙත්, පවත්වන පරීක්ෂණයන්හි යහපත උදෙසා, එම තැනැත්තා එම නිල කාර්යයන්හි කටයුතු කිරීම සුදුසු නොවන අවස්ථාවන්වල දී, X වන පරිච්ඡේදයේ 15 වන ඡේදයේ සඳහන් ආකාරයට, ඔහු වෙනත් ස්ථානයකට මාරු කිරීම හෝ අනිවාර්ය නිවාඩු යැවීම හෝ සිදුකළ යුතු ය. — ස්ථාන මාරු කිරීම හෝ අනිවාර්ය නිවාඩු යැවීම

## 20. සාමාන්‍ය අකාර්යක්‍ෂමතාවය හේතුවෙන් විශ්‍රාම ගැන්වීම

20.1 යම් තැනැත්තකු තම සේවා කාලය තුළ දීර්ඝ කාලීනව සිදු කරන ලද විෂමාචාරයන්, නොකළ යුත්තක්, නොසැලකිලිමත් ක්‍රියාවන්, හෝ අතපසු කිරීම් හේතුවෙන්, ඔහුට ලබා දුන් අවවාද කිරීම්, තරවටු කිරීම් සහ වෙනත් දඬුවම්, ඔහුගේ සේවා තත්ත්වය වැඩිදියුණු කිරීමට අසමත් වී තිබෙන විට සහ එම තැනැත්තා තවදුරටත් සේවයේ තබා ගැනීම ආයතනයේ යහපැවැත්ම කෙරෙහි අහිතකර ආකාරයෙන් බලපානු ලබන බවට විනය බලධරයා විසින් නිගමනය කළ විට, පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරමින් ඔහු සාමාන්‍ය අකාර්යක්‍ෂමතාවය යටතේ විශ්‍රාම ගැන්විය හැකි ය.

සේවයේ දිගටම තබා ගැනීම ආයතනයේ යහපැවැත්මට බලපාන විට

20.1.1 යම් තැනැත්තකුට එරෙහිව නිශ්චිත චෝදනාවන් ඉදිරිපත් කිරීමට අපහසු එහෙත් ඔහු සාමාන්‍ය අකාර්යක්‍ෂමතාවය යටතේ අනිවාර්යෙන් විශ්‍රාම ඉගැන්වීමට සුදුසු බවට කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධරයා අදහස් කරන්නේ නම්, එම තැනැත්තා කලින් සේවය කර ඇති සෑම ආයතනයකින්ම ඔහුගේ වැඩ, හැසිරීම සහ පැමිණීම සම්බන්ධයෙන් වාර්තා ලබාගත යුතු ය.

වැඩ සහ හැසිරීම සම්බන්ධ වාර්තා

20.1.2 එම වාර්තා ලබාගත් පසු, අදාළ තැනැත්තා සාමාන්‍ය අකාර්යක්‍ෂමතාවය යටතේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීම සිදුකරන්නේ කුමන කරුණු පදනම් කරගෙන ද යන්න ගැන සහ අකාර්යක්‍ෂමතාවය හේතුවෙන්, එම තැනැත්තා අනිවාර්ය විශ්‍රාම නොගැන්වීමට හේතු ඇතොත්, එම හේතු ලිඛිතව දන්වන ලෙසටත් ඔහුට දැනුම් දිය යුතු ය. ඔහු කලින් සේවය කොට ඇති කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ඔහුගේ නියමිත රාජකාරී ඉටු කිරීමේදී දක්වා ඇති අදක්‍ෂතාවය නිසා සිදුවී තිබෙන අකාර්යක්‍ෂමතාවය සහ අනවධානය, අතපසු වීම් සහ අසාර්ථකවීම් නිසා ඇති වූ පාඩු ද, එම කරුණු මත ඔහුට එරෙහිව විනයානුකූලව ක්‍රියාකොට තිබුණු බව හෝ එසේ කොට නොමැති බව නොසලකා, අදාළ සියලුම කරුණු එම දැනුම් දීමට ඇතුළත් කළ යුතු යුතු වේ.

අනිවාර්ය විශ්‍රාම ගැන්වීමට හේතු දැක්විය යුතුය

20.1.3 අදාල තැනැත්තාගෙන් නිදහසට කරුණු ලැබුණු විට, එම නිදහසට කරුණු තීරණයක් ගැනීම සඳහා විනය බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඉදිරිපත් කරන ලද නිදහසට

විශ්‍රාම යැවීමේ හෝ වෙනත් දඬුවමක් පැනවීමේ නියෝගය

කරුණු ගැන සෑහීමකට පත් විය නොහැකි නම් හෝ අදාළ තැනැත්තා නියමිත කාලය තුළදී නිදහසට කරුණු ඉදිරිපත් කිරීමෙන් හිතාමතාම වැළකී සිටින්නේ නම්, ඔහුට නිදහසට ඉදිරිපත් කිරීමට කිසිඳු කරුණක් නොමැති යේ සලකා බලා අදාල විනය බලධරයා විසින් ඔහු සාමාන්‍ය අකාර්යක්ෂමතාවය යටතේ අනිවාර්ය විශ්‍රාම යවන ලෙසට නියෝග කිරීමට හෝ එම බලධරයාට අනුව වෙනත් උචිත දඬුවමක් නියම කිරීමටද කටයුතු කළ හැකි ය.

20.1.4 එසේ අනිවාර්ය විශ්‍රාම ගැන්වීම ක්‍රියාත්මක වන දිනය වන්නේ, නියමිත විනය බලධරයා විසින් අදාළ විනය නියෝගය නිකුත් කරන ලද දිනයයි.

නියෝගය ක්‍රියාත්මක වන දිනය

**21. විනය ක්‍රියාමාර්ගයන් සිදුකරමින් පවතින විට හෝ විනය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව තිබියදී, සේවයෙන් විශ්‍රාම ගැනීම, ඉල්ලා අස්වීම හෝ දිවයිනෙන් බැහැරවීමට අවසර ඉල්ලීම.**

21.1 යම් තැනැත්තෙකුට එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් සිදු කෙරෙමින් පවතින විට හෝ විනය ක්‍රියාමාර්ගයෙන් ගැනීමට නියමිතව ඇති විට, විනය බලධරයාගේ එකඟතාවයකින් තොරව, ඔහුට රටින් පිටවීමට අවසර නොදිය යුතු ය.

දිවයිනෙන් බැහැර වීමට අවසරය

21.2 එවැනි තැනැත්තෙකුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගනිමින් පවතින විට හෝ එම විනය ක්‍රියාමාර්ග අවසන් වුවද, තවමත් විනය නියෝගය ලබාදී නොමැති තත්ත්වයක් තුළ ඔහු විසින් සේවයෙන් ඉල්ලා අස්වීම ලබා දුන්නද, එම ඉල්ලා අස්වීම භාර නොගත යුතු අතර, ඔහු සේවයෙන් පහකළ තැනැත්තෙකු සේ සලකා ක්‍රියා කළ යුතු ය. එවැනි අවස්ථාවකදී යම් තැනැත්තකු සේවයෙන් පහ කරනු ලැබූ විට ගනු ලබන්නා වූ ක්‍රියාමාර්ගයන්ට ඔහු යටත් වන්නේය.

විනය පරීක්ෂණ කටයුතු අවසන්වීමට ප්‍රථමයෙන් ඉල්ලා අස්වීම

21.3 රජයේ සේවයේ හෝ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප හිමි තැනැත්තකු පසුව කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවයට, ඔහුගේ කලින් සේවය ද සමග පත්වී ඇති අවස්ථාවකදී, විනය පරීක්ෂණයක් පැවැත්වෙන අතරතුරදී හෝ එම පරීක්ෂණය අවසානයේදී කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවයෙන් විශ්‍රාම ගැනීමට අවසර දුන් විට එම විශ්‍රාම යාම, විශ්‍රාම වැටුප් සංග්‍රහයේ දොළොස්වන (12) වගන්තියේ සඳහන් සහ විශ්‍රාම වැටුප් වලට අදාල කාර්ය සටහන් වල නියමයන්ටද යටත් වන්නේ ය.

රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත නිලධාරීන්

## 22. තනතුර අතහැර යාම

22.1 යම් තැනැත්තකු V වන පරිච්ඡේදයේ 7 වන ඡේදයට අනුව, තනතුර අතහැර ගියා සේ සලකන ලද විට දී සහ නියමිත විනය බලධරයා මඟින් ඔහු විසින් දෙන ලද නිදහසට කරුණු සැලකීමෙන් අනතුරුව, නැවත සේවයට වාර්තා කිරීම සඳහා අවසර නොදුන් අවස්ථාවකදී හෝ තනතුර අතහැර ගියාසේ සලකන ලද දිනයේ සිට හෝ මාස හයක (06) කාලයක් ඇතුලතදී, ඔහු සිය ස්වේච්ඡාවෙන් නිදහසට කරුණු ඉදිරිපත් නොකළ අවස්ථාවකදී, යම් තැනැත්තකු සේවයෙන් පහ කරනු ලැබූ අවස්ථාවකදී මෙන් විශ්වවිද්‍යාල සේවා අභියාචනා මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

අභියාචනා කිරීම, සේවයෙන් පහ කළ අවස්ථාවලදී මෙන්වේ.

23. 23.1 මෙම සංග්‍රහයේ සඳහන් කොට ඇති වෙනත් නියමයන් කෙසේ වුවද, යම් තැනැත්තෙකු හට නිකුත් කරන ලද පත්වීම් ලිපියට අනුව දැනට තම තනතුරේ පරිවාස කාලය හෝ දීර්ඝ කරන ලද පරිවාස කාලය ගත කරමින් සිටින තැනැත්තකු විෂයයෙහි පහත සඳහන් නියමයන් බලපැවැත්වෙනු ඇත.

පරිවාස කාලය ගත කරමින් සිටින විට

23.2 මෙම සංග්‍රහයේ නියමයන්ට වෙනත් යම් කරුණක් පැවතිය ද, අදාළ පරිවාස කාලය ගත කරමින් සිටින සේවයකු පිළිබඳව විනය පරීක්ෂණයක් පැවැත්වීමට විනය බලධරයා හට අත්‍යාවශ්‍ය වන්නේ නැත.

එහෙත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට සුදුසු යැයි විනය බලධරයා අදහස් කරන්නේ නම්, එවැනි විනය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කළ හැකි ය.

23.3 යම් පරිවාස කාලයක් ගත කරමින් සිටින සේවකයෙකු "විෂමාචාරයක්" සිදුකර ඇති බව අනාවරණය වූ විට, විනය බලධරයා විසින්, මෙහි සඳහන් කර ඇති ලඝු විනය ක්‍රියා පරිපාටිය යටතේ කටයුතු කළ හැකිය.

23.4 මෙම පරිච්ඡේදයේ 8.3 උපඡේදයෙහි සඳහන් පරිදි, විනය බලධරයා විසින්, යම් සේවකයකුට විරුද්ධව ලඝු විනය ක්‍රියාමාර්ගයන් ගැනීමට සැරසෙන විට, එම තැනැත්තා හට, මොහු විසින් සිදුකර ඇතැයි සැලකෙන විෂමාචාරය කුමක්ද යන්න ගැන දැනුවත් කොට, ඔහුගේ සේවය අවසන් නොකළ යුත්තේ කුමන හේතුවක් මතද යන්න දින හතක් (07) ඇතුලත දී කරුණු දන්වන ලෙසට, එසේ කරුණු දන්වන ලෙස දන්වීමේ ලිඛිත නිවේදනයක් මඟින් දැනුම් දිය යුතු ය.

23.5 එම නිදහසට කරුණු දන්වන ලෙසට දන්වන ලිපිය අදාළ තැනැත්තා වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු අතර, එසේ නොවන අවස්ථාවකදී, එම ලිපිය ඔහුට පෞද්ගලිකවම භාරදිය යුතු අතර එසේ ලිපිය භාරදුන්

බවට ඔහුගේ පිළිගැනීමද ලබාගත යුතු ය. එමෙන් ම, අදාළ නිදහසට කරුණු දැන්වීම සඳහා එම තැනැත්තාට දින හතකට (07) නොඅඩු කාලයක් ලබාදිය යුතු අතර නිදහසට කරුණු විමසන ලිපියේ පිටපත් ඔහුගේ ළඟම සුපරීක්ෂක නිලධරයා හටද ලබාදිය යුතු ය.

23.6 එබඳු නිදහසට කරුණු දන්වන ලෙසට නිකුත් කරන ලද ලිපියට ප්‍රතිචාරයක් වශයෙන්; අදාල තැනැත්තා ලබා දුන් නිදහසට කරුණු විනය බලධරයා විසින් පිළිගත් විට සහ එම තැනැත්තා කළ වරදෙන් නිදහස් කිරීමට එම විනය බලධරයා තීරණය කළ විට, ඒ බව අදාළ තැනැත්තා වෙත විනය බලධරයා විසින් වහාම දැන්විය යුතු වේ.

23.7 යම් තැනැත්තෙකුගේ සේවය අවසන් නොකළ යුත්තේ කුමන හේතුවක් නිසාද යන්න විමසමින්, විනය බලධරයා විසින් නිදහසට කරුණු දක්වන ලෙසට දන්වා තිබියදීත්, නියමිත කාලය තුලදී නිදහසට කරුණු දැක්වීමට, එම තැනැත්තා අසමත් වන විට හෝ ඉදිරිපත් කර ඇති නිදහසට කරුණුවලට අනුව, එම තැනැත්තා වරදෙන් නිදහස් කිරීමට තරම් ප්‍රමාණවත් කරුණු අනාවරණය වී නොමැති බවට විනය බලධරයා තීරණය කළ විටදී, එම තැනැත්තාගේ සේවය විනය බලධරයා විසින් අවසන් කළ යුතු ය.

**24. චෝදනා පත්‍රයක් නිකුත් කිරීමෙන් පසු, විනය බලධරයා වෙනස් වන අවස්ථාවන්වලදී, එම සේවකයා සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීම**

24.1 යම් සේවකයෙකුට එරෙහිව විධිමත් චෝදනා පත්‍රයක් නිකුත් කර තිබිය දී සහ එම චෝදනා පත්‍රය සම්බන්ධයෙන් අවසාන නිගමනයකට එළඹී නොමැති කුමන හෝ අවස්ථාවක, විනය බලධරයා වෙනස් වූ විට, එසේ වූ වෙනස් වීම විනය ක්‍රියාමාර්ගය ඉදිරියට පවත්වාගෙන යාමට කිසිඳු ආකාරයකින් බාධාවක් නොවිය යුතු ය. එසේ විනය බලධරයා වෙනස් වුවද, මෙම සංග්‍රහයේ දක්වා ඇති ක්‍රියා පරිපාටිය අනුගමනය කරමින් අදාළ විනය ක්‍රියාමාර්ගය එම සේවකයාගේ කලින් සිටි විනය බලධරයා විසින් දිගටම පවත්වාගෙන යා යුතුවේ.

විනය බලධරයා වෙනස් වූ විට

24.2 චූදිත තැනැත්තාට අදාළ වන කලින් සිටි විනය බලධරයා විසින්, විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා අවසානයේ දී, විනිශ්චය සභාව/ විමර්ශන නිලධරයාගේ තීරණ, අනාවරණය කර ගැනීම්, සහ විනය නියෝගය ලබාදීම පිළිබඳ ව ඔවුන්ගේ නිර්දේශද විනය පරීක්ෂණයට අදාළ සියලුම ලේඛන ද, එහි චූදිත තැනැත්තාගේ වර්තමාන විනය බලධරයා වෙත නොපමාව ලබාදිය යුතු වේ.

විනය නියෝගයට අදාළ සියලුම ලේඛන වර්තමාන විනය බලධරයාට ලබාදිය යුතු ය

24.3 ඒ අනුව චූදිත තැනැත්තාගේ වර්තමාන විනය බලධරයාගේ වගකීම වන්නේ, එම චූදිත තැනැත්තාගේ කලින් විනය බලධරයා විසින් ලබා දුන්, විනය පරීක්ෂණයට අදාළ සියලුම ලේඛන, නිරීක්ෂණ සහ නිර්දේශද මනා ලෙස අධ්‍යයනය කිරීමෙන් පසු සුදුසු විනය නියෝගයක් ලබා දීමයි.

වර්තමාන විනය බලධරයාගේ වගකීම

24.4 කලින් විනය බලධරයා විසින් පත්කරන ලද විනිශ්චය සභාව/ විමර්ශන නිලධාරියා විසින් ලබා දුන් ඔවුන්ගේ අනාවරණය කර ගැනීම් හෝ නිර්දේශ සම්බන්ධයෙන්, වර්තමාන විනය බලධරයා එකඟ නොවන අවස්ථාවක දී, වර්තමාන විනය බලධරයා විසින් තම ස්වාධීන විමර්ශනයක් හෝ අධ්‍යයනය කිරීම් තුළින් සොයා ගත් පරිදි, කලින් පැවැත්වූ විනය පරීක්ෂණයේ තීරණයන් සහ නිර්දේශයන්ට වෙනස් වූ විනය නියෝගයක් ලබාදිය හැකි ය. එම ආකාරයට කලින් ලබා දුන් විනය නියෝගයට වඩා වෙනස් විනය නියෝගයක් ලබාදීමට හේතු වූ විශේෂිත කරුණු සම්බන්ධයෙන් පැහැදිලි සහ නිශ්චිත සටහන් එම අවස්ථාවේදීම අදාල විනය පරීක්ෂණ ගොනුවේ වාර්තා කොට තැබිය යුතු වේ.

වර්තමාන විනය බලධරයා පරීක්ෂණ වාර්තාව සමඟ එකඟ නොවන විට

**විනිශ්චය සභාවක්/ විමර්ශන නිලධාරීන් සඳහා මග පෙන්වීමට අවශ්‍ය සටහන්**

1. කිසියම් විමර්ශනයක් ආරම්භයේදී, එම විමර්ශනය ආරම්භ කරන දිනය, වේලාව සහ විමර්ශනය පැවැත්වෙන ස්ථානය ද විමර්ශන සටහන් වල (වාර්තා සඳහන් වල) සඳහන් කළ යුතු ය. එයට අමතරව, පැමිණිල්ල වෙනුවෙන් විභාගයට ගැනෙන කරුණ ඉදිරිපත් කරන තැනැත්තාගේ නම, චූදිත තැනැත්තාගේ නම, එකී චූදිත තැනැත්තාගේ රැකවරණ නිලධාරියා වශයෙන් පෙනී සිටින නිලධරයාගේ නම, ආදී කරුණු ද එම වාර්තාවෙහිම සඳහන් කළ යුතු ය.

2. සාක්ෂිකරුවන් විසින් ලබා දෙන සාක්ෂි, එම අයවලුන් හට තේරුම් ගැනීමට පහසු භාෂාවකින් සටහන් කළ යුතු වේ. යම් හෙයකින් ලබාදෙන සාක්ෂි සම්බන්ධයෙන්, විනිශ්චය සභාව/ විමර්ශන නිලධරයා හෝ චූදිත තැනැත්තා වෙනුවෙන් පෙනී සිටින රැකවරණ නිලධරයා හට හුරුපුරුදු කමක් නොමැති අවස්ථාවකදී, එම සාක්ෂි සුදුසු භාෂාවකට පරිවර්තනය කළ යුතු වේ. එම කාර්යය සඳහා භාෂා පරිවර්තකයෙකුගේ සේවය ලබාගත හැකි අතර, සාක්ෂි දීම දිවුරුම් දීමක් මත සිදු කිරීම අවශ්‍ය නැත.

3. සෑම සාක්ෂියක්ම, සිද්ධිය වූ ආකාරය විස්තර කරන ස්වභාවයෙන්ම වාර්තා කළ යුතු අතර, එම සාක්ෂි ලබාගැනීම ප්‍රශ්න/ උත්තර ලබා ගැනීමේ ස්වභාවයෙන් නොගත යුතුවේ. එම සාක්ෂි වාර්තා කළ යුතු වන්නේ, "පෙරේරා කාර්යාලයෙන් පිටවෙනවා මම දැක්කා" ආදී වශයෙන් මිස "පෙරේරා කාර්යාලයෙන් පිටවනවා මා දුටු බව සාක්ෂිකරු විසින් ප්‍රකාශ කර සිටි" වශයෙන් නොවේ. එසේ වුවද, යම් කරුණක් සනාථ කිරීමට ප්‍රශ්න/ උත්තර ස්වභාවයේ ප්‍රකාශයක් අත්‍යවශ්‍ය යැයි හැඟෙන විට, එම කරුණ සනාථ කිරීමට, සහ අදහස් කරන කරුණ වඩාත් තේරුම් ගත හැකි වන පරිදි වාර්තා කිරීමට, ප්‍රශ්න/ උත්තර ස්වරූපයෙන් ප්‍රකාශය සටහන් කර ගැනීමට කටයුතු කළ හැකි ය.

4. යම් සාක්ෂිකරුවකු විසින් මූලික විමර්ශනයේදී ලබාදුන් සාක්ෂිය, විධිමත් විනය පරීක්ෂණයේදී දෙනු ලබන සාක්ෂියට පටහැනි වන අවස්ථාවකදී, එම පරස්පරතාවයන්ට හේතු දක්වන ලෙසට එම සාක්ෂිකරුවා හට දැන්විය යුතු ය. එවැනි කරුණු දැක්වීමක් වේ නම්, එය ද නිසි පරිදි වාර්තා සටහන් සටහන් වලට ඇතුළත් කළ යුතු යුතු වේ. එසේම සාක්ෂිකරුවා හට එවැනි කරුණු දැක්වීමක් සිදු කිරීමට නොහැකි බව දැන් වූ විට, එම ප්‍රකාශනය ද සටහන් කර ගත යුතු ය. සාක්ෂිකරුවා විසින්, කරන ලද විමසීම් වලට නිශ්ශබ්දතාවයක් දක්වයි නම්, එම කරුණ ද කොටු වරහන් තුළ සටහන් කළ යුතුවේ.

5. යම් සාක්ෂිකරුවකු විමසන ලද ප්‍රශ්නයට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරයි නම්, එම ප්‍රශ්නයට යටින් කොටු වරහන් තුළ "සාක්ෂිකරුවා අසන ලද ප්‍රශ්නයට පිළිතුරු නොදී සිටි" යන නිරීක්ෂණය සටහන් කළ යුතු ය.

6. සාක්ෂියක් සටහන් කරගන්නා අවස්ථාවේ දී, විනිශ්චය සභාවට/ විමර්ශන නිලධරයාට, යම් නිරීක්ෂණයක් සටහන් කිරීමට අවශ්‍ය වූ විට, එම නිරීක්ෂණය කොටු වරහන් තුල සටහන් කල යුතු ය.

[උදා. මෙම අවස්ථාවේදී මා විසින් සාක්ෂිකරුගෙන් අසන ලද "ජේම්ස් සිරගත කොට සිටි බව ඔබ දැන සිටියේද" යන ප්‍රශ්නයට රැකවරණ නිලධරයා සිය විරෝධය ප්‍රකාශ කර සිටී, වග උත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම සලකා බැලීමෙන් පසු මා විසින් එම විරෝධය නිශ්ප්‍රභා කරන ලදි.]

7. ඒ ආකාරයෙන්ම, විමර්ශනය පැවැත්වෙන අතරතුර දී මතුවන වෙනත් අදාළ නිරීක්ෂණයන්, එම නිරීක්ෂණයන් මතුවන අවස්ථාවෙහිදී විමර්ශන වාර්තාවේ ම සටහන් කළ යුතු ය. (එනම්, මෙම අවස්ථාවේදී සාක්ෂිකරුවා කලහකාරී ලෙස හැසිරෙන්නට වූ නිසා මා/ අප විසින් පරීක්ෂණය පැය භාගයකට අත්හිටුවීමට ක්‍රියා කළෙම්/ කළෙමු.)

8. පැමිණිල්ලේ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි මෙහෙයවීම නිමවීමෙන් පසු, තමන් වෙනුවෙන් යම් සාක්ෂිකරුවෙකු ඉදිරිපත් කරනවාද යන්න චූදිත තැනැත්තාගෙන් විමසිය යුතු අතර, ඔහුගේ පිළිතුර අදාළ පරිදි සටහන් කළ යුතු ය. එසේ සිටී නම්, විත්තියේ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සටහන් කර ගත යුතු වේ. පැමිණිල්ලේ සාක්ෂිකරුවන්ගෙන් නැවත සාක්ෂි විමසීමක් කරන්නේ නම් හෝ විත්තිය විසින් තම සාක්ෂිකරුවන් කැඳවීමෙන් පසු, පැමිණිල්ල විසින් අලුතෙන් සාක්ෂිකරුවන් කැඳවන්නේ නම්, ඒ හා සමානවම කටයුතු කිරීමට වගඋත්තරකාර පාර්ශ්වයට ද අවසර දිය යුතුවේ.

9. යම් සාක්ෂිකරුවෙකු විසින් තම සාක්ෂිය දී අවසන් වූ පසු, එම සාක්ෂිය කියවා බලන ලෙසට, සාක්ෂිකරුවාට දැන්විය යුතු අතර, එහි "කියවා බලා නිවැරදි බවට පිළිගනිමි" යන වාක්‍ය ලියා අවසන් කිරීමට දැන්විය යුතු ය. එම ප්‍රකාශයේම විනිශ්වය සභාව/ විමර්ශන නිලධාරියා විසින් ද අත්සන් තැබිය යුතු වේ. යම් සාක්ෂියක්, සාක්ෂිය දුන් භාෂාවට වෙනත් භාෂාවකින් සටහන් කරගත් විට, විනිශ්වය සභාව/ විමර්ශන නිලධරයා විසින් එම සාක්ෂිය, සාක්ෂිකරුට කියවා තේරුම් කර දී අවසානයේ දී "මා විසින් කියවා තේරුම් කර දුනිමි" යන වාක්‍ය ලියා අත්සන් කිරීමට කටයුතු කළ යුතු ය. යම් අවස්ථාවක දී, සාක්ෂිකරුවා විසින් වාර්තා කොට ඇති ප්‍රකාශය තමන් විසින් නොකළ බවට පැවසූ විට, එසේ ප්‍රතික්ෂේප කිරීම විනිශ්වය සභාව/ විමර්ශන නිලධාරියා විසින් කොටු වරහනක් තුළ සාක්ෂිකරු ඉදිරියේදී අදාළ ප්‍රකාශයට පහළින් සඳහන් කොට ඔහුගේ අත්සන යොදන ලෙසට දැන්විය යුතු ය.

10. සාක්ෂිකරුගෙන් විමසන ප්‍රශ්න සරල භාෂාවෙන් විය යුතු අතර, හැකිතාක් දුරට ඔහු විසින් දුටු කරුණට/ සිද්ධියට අදාළ සියලුම කරුණු කාලානුරූපව පෙළගස්වන ලද පරිදි විය යුතු ය. එනම්, ඔහු අදාළ කරුණ ඍජුවම දුටු බව, ඍජුවම නිරීක්ෂණය කළ බව හෝ ප්‍රත්‍යක්ෂ කරගත් බව තහවුරු වන පරිද්දෙන් වීම ය. යම් සාක්ෂිකරුවෙකු හට තමන් දන්නා දෙයක් ප්‍රකාශ කරන ලෙසට ඉල්ලා සිටීම හෝ යම් සිද්ධියකට අදාළ කරුණු දන්වන ලෙසට ඉල්ලා සිටීමට ,රීතියක් වශයෙන් අවසර නොදිය යුතු වන්නේ, එමඟින් තමා විසින් ගොතන ලද කතාවක් ඉදිරිපත් කිරීමට සාක්ෂිකරුවාට අවස්ථාවක් සැලසෙන බැවිනි.

11. සාක්ෂි දෙන අවස්ථාවක දී, යම් සාක්ෂිකරුවකු විසින් "වෙනත් තැනැත්තෙකු තමාට පැවසුවා ය" යනා දී වශයෙන් ප්‍රකාශ කිරීමට ඉඩ නොදිය යුතු ය. එහෙත් එසේ සඳහන් කරන ලද තැනැත්තාගේද ප්‍රකාශයක් විමර්ශනය පැවැත්වෙන අතරතුරදී සටහන් කරගෙන ඇත්නම්, එවැනි ප්‍රකාශයන් සඳහා අවස්ථාවක් දිය හැකි ය.

12. සිද්ධියට අදාළ කරුණු සනාථ කර ගැනීම විනිශ්වය සභාවේ/ විමර්ශන නිලධාරයාගේ වගකීම වන්නේ ය. දැනටමත් සාක්ෂි ලබා දුන් සාක්ෂිකරුවෙකු සත්‍ය තහවුරු කර ගැනීම පිණිස නැවත වරක් කැඳවීමට විනිශ්වය සභාවට/ විමර්ශ නිලධාරියා හට හැකියාවක් තිබේ. අදාළ විමර්ශනය අවසානයේ දී, චූදිත තැනැත්තා හට එල්ල කරන ලද චෝදනාවකට/ චෝදනාවන්ට වැරදකරුවී ඇති බව හෝ නිවැරදිකරු බවට විනිශ්වය සභාවට/ විමර්ශන නිලධරයා හට පැහැදිලිවම ප්‍රකාශ කිරීමට හැකියාව තිබිය යුතු ය.

13. යම් විමර්ශනයකදී පැමිණිල්ල විසින් ඉදිරිපත් කරනු ලබන ලේඛන, පැ, 1 පැ, 2 පැ, 3 ආදී වශයෙන් ඒවා ඉදිරිපත් කරනු ලබන අනුපිළිවෙල අනුව සලකුණු කළ යුතු අතර, වගඋත්තරකාර පාර්ශවයක් විසින් ඉදිරිපත් කරනු ලබන ලේඛන ඩී.1, ඩී.2, ඩී.3 ආදී වශයෙන් සලකුණු කළ යුතු ය. මෙම සියලුම ලේඛන විනිශ්වය සභාව/ විමර්ශන නිලධාරියා විසින් ද අත්සන් කළ යුතුවේ. (කෙටි අත්සන්)

14. විනිශ්වය සභාව/ විමර්ශන නිලධාරියා විසින් තම නිගමනවලට එළඹෙන විට ලැබී ඇති සියළුම සාක්ෂිවලට අනුව, යම් සිදුවීමක් ඔප්පු වී ඇතැයි නිගමනය කළ යුත්තේ, දක්වා ඇති කරුණු සත්‍ය කරුණු සේ විශ්වාස කරන්නේ නම් හෝ පවත්නා තත්ත්වය යටතේ එය එසේම සිදුවන්නට ඇතැයි සිහිබුද්ධිය ඇති තැනැත්තෙකු විසින් එවැනි ක්‍රියාවක යෙදීමට සම්භාවිතාවයක් ඇති බවට සාක්ෂි ලැබී ඇත්නම් පමණකි. එසේම විනිශ්වය සභාව/ විමර්ශන නිලධරයා විසින් යම් කරුණක් ඔප්පු වී නැතැයි නිගමනය කළ යුත්තේ, සියලුම සාක්ෂි සලකා බැලීමෙන් පසුව, එය සත්‍ය ලෙසට සිදුවිය නොහැක්කක් යැයි සලකා, අදාල තත්ත්වයන් යටතේ සිහි බුද්ධිය ඇති තැනැත්තකු විසින් එවැනි ක්‍රියාවක නිරත වීමට තරම් අසම්භාවී සිදුවීමක් යැයි සලකනු ලබන්නේ නම් පමණි. යම් කරුණක් සත්‍ය බව හෝ අසත්‍ය බව ඔප්පු වී නොමැති නම්, එම කරුණු ඔප්පු නොවූ කරුණු ලෙසට සැලකිය යුතු ය.

15. විනිශ්වය සභාවක/ විමර්ශන නිලධරයකුගේ අවසන් නිගමනයට පදනම් විය යුත්තේ, ඔවුන් වෙත ඉදිරිපත් කරන ලද සාක්ෂි මඟින් සනාථ වූ කරුණු මිස, වෙනත් කරුණු නොවේ. කරුණු එසේ වුවද, අදාළ අවස්ථාවන්හිදී සිද්ධියට අදාල කරුණු වලින් පැහැදිලිවම පෙන්නුම් කරන යම් අනුමානයන් සැලකිල්ලට ගත හැකි වේ.

## 'අ' උපලේඛණය

මෙම පරිච්ඡේදයේ 4.1.1 උපඡේදයට අනුව කොමිෂන් සභාවේ සේවයේ නියුතු තැනැත්තන් හට සුළු දඬුවම් පැමිණවීමට බලය පැවරීම

| විනය බලධරයා | කුමන කාර්ය මණ්ඩලය සඳහාද | සුළු දඬුවම |
|---|---|---|
| අතිරේක ලේකම්වරු | ලේකම්වරයා සහ අතිරේක ලේකම්වරුන් හැරෙන්නට කොමිෂන් සභාවේ සේවයේ නියුතු අනෙකුත් තැනැත්තන් | 1. තරවටු කිරීම<br>2. තදින්තරවටු කිරීම<br>3. තහනම් කිරීම |
| ලේකම්වරයා | අතිරේක ලේකම්වරුන් හැරෙන්නට කොමිෂන් සභාවේ සේවයේ නියුතු සියලුම තැනැත්තන් | ඉහත සඳහන් 1, 2, 3 සහ<br>4. සතියක වැටුප් නොඉක්මවන දඩයක්<br>5. එක් අවුරුදු කාලසීමාවක් නොඉක්මවන කාලයකට වැටුප් වර්ධකයක් නැවැත්වීම, අඩු කිරීම හෝ විලම්භනය කිරීම |
| සභාපතිවරයා | කොමිෂන් සභාවේ සේවයේ නියුතු සියලුම තැනැත්තන් | ඉහත සඳහන් 1, 2, 3, 4 සහ 5 සහ<br>6. විනය පරීක්ෂණයකට පසු යම් අධිභාරයක් පැනවීම<br>7. විනය හේතුවකට ස්ථාන මාරු කිරීම<br>8. මෙහි සඳහන් දඬුවම්වලට වඩා බරපතල නොවන ඕනෑම දඬුවමක් |

**'ආ' උපලේඛණය**

මෙම පරිච්ඡේදයේ 4.1.1 උපඡේදයට අනුව උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තන් හට සුළු දඬුවම් පැමිණවීමටය බලය පැවරීම

| විනය බලධරයා | කුමන කාර්ය මණ්ඩලය සඳහාද | සුළු දඬුවම |
|---|---|---|
| උසස් අධ්‍යාපන ආයතනක නියෝජ්‍ය ලේඛකාධිකාරිවරයෙකු හෝ මණ්ඩපයක හෝ ආයතනයකට අනුයුක්තව සිටින වඩාත් ජ්‍යෝෂ්ඨතම පරිපාලන නිලධරයා | ආචාර්යවරුන් සහ පීඨයකට අනුයුක්ත කොට නොමැති විධායක ශ්‍රේණි නිලධාරීන් | 1. අවවාද කිරීම<br>2. තදින් අවවාද කිරීම |
| පීඨයක පීඨාධිපතිවරයා/ පුස්තකාලයාධිකාරීවරයා | ආචාර්යවරුන් සහ විධායක ශ්‍රේණි නිලධාරීන් හැරෙන්නට පීඨයකට හෝ පුස්තකාලයකට අනුයුක්තව සේවයේ නොමැති සියලුම තැනැත්තන් | ඉහත 1 සහ 2 සහ<br>3. තහනම් කිරීම |
| විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරීවරයා/ විශ්වවිද්‍යාල විද්‍යායතනයක ලේකම්වරයා/ මණ්ඩපයක මණ්ඩපාධිපතිවරයා/ ආයතනයක අධ්‍යක්ෂකවරයා | ආචාර්යවරුන් සහ විධායක ශ්‍රේණි නිලධාරීන් හැරෙන්නට විශ්වවිද්‍යාලයක/ මණ්ඩපයක හෝ විශ්ව විද්‍යාල විද්‍යායතනයක/ උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ යුතු සියළුම තැනැත්තන් අදාළ වන පරිදි | ඉහත 1. 2 සහ 3 සහ<br>4. සතියක වැටුප් නොඉක්මවන දඩයක්<br>5. එක් අවුරුදු කාලසීමාවක් නොඉක්මවන කාලයකට වැටුප් වර්ධකයක් නැවැත්වීම, අඩු කිරීම හෝ විලම්බනය කිරීම |
| විශ්වවිද්‍යාලයක උප කුලපතිවරයා හෝ නියෝජ්‍ය උපකුලපතිවරයා/ විශ්වවිද්‍යාල විද්‍යායතනයක අධ්‍යක්ෂවරයා/ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක අධ්‍යක්ෂවරයා | ආචාර්යවරුන් සහ විධායක ශ්‍රේණියක නිලධාරීන් හැරෙන්නට, විශ්වවිද්‍යාලයක/ විශ්වවිද්‍යාල විද්‍යායතනයක/ උසස් අධ්‍යාපනය පිළිබඳ මධ්‍යස්ථානයක සේවයේ නියුතු අනෙකුත් සියලුම තැනැත්තන් | ඉහත 1, 2, 3, 4 සහ 5 සහ<br>6. විනය පරීක්ෂණයකට පසු යම් අධිභාරයක් පැනවීම<br>7. විනය හේතුවකට ස්ථාන මාරු කිරීම<br>8. මෙහි සඳහන් දඬුවම්වලට වඩා බරපතල නොවන ඕනෑම දඬුවමක් |
| පාලක බල මණ්ඩලය | විශ්වවිද්‍යාලයක විශ්වවිද්‍යාල විද්‍යායතනයක මධ්‍යස්ථානයක ආයතනයක උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක සේවයෙන් යුතු සියලුම තැනැත්තන් | ඉහත 1. 2, 3, 4, 5, 6, 7 සහ 8 යන ඕනෑම දඬුවමක් |

**උපලේඛනය 'ඇ'**

මෙම පරිච්ඡේදයේ 4.1.2 උපඡේදයෙහි සඳහන් පරිදි කොමිෂන් සභාවේ සේවයේ නියුතු තැනැත්තන්හට සුළු දඬුවම් පැමිණවීමට බලය පැවරීම

| විනය බලධරයා | කුමන කාර්ය මණ්ඩලය සඳහාද | බරපතල දඬුවම |
|---|---|---|
| ලේකම්වරයා | අතිරේක ලේකම්වරුන් හැරෙන්නට කොමිෂන් සභාවේ සේවයේ නියුතු අනෙකුත් සියලුම තැනැත්තන් | 9 අවුරුද්දකට වැඩි කාල සීමාවක් සඳහා වැටුප් වර්ධක එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් නැවත්වීම, අඩු කිරීම හෝ විලම්භනය කිරීම |
| සභාපතිවරයා | කොමිෂන් සභාවේ සේවයේ නියුතු සියලුම තැනැත්තන් | 10. ඉහත 9 සහ යම් උසස්වීමක් සඳහා පවත්වන විභාගයට පෙනී සිටීමට නුසුදුස්සෙකු කිරීම හෝ විශේෂිත කාල පරිච්ඡේදයක් සඳහා උසස් වීම් සඳහා නොසලකා හැරීම<br>11. විශේෂිත කාල පරිච්ඡේදයක් සඳහා උසස් වීමක්, විලම්භනය කිරීම<br>12. තමන් සිටිනා ශ්‍රේණියේ ජ්‍යෝෂ්ඨත්වයෙන් පහත හෙළීම (නිශ්චිත ස්ථාන කිහිපයකින්) |
| කොමිෂන් සභාව | කොමිෂන් සභාවේ සේවයේ නියුතු සියලුම තැනැත්තන් | 13. ඉහත 9 සිට 12 දක්වා සහ තත්ත්වයෙන් පහත හෙළීම (එකම ශ්‍රේණියේ ඊළඟ පහළ පන්තියට හෝ පහළ තනතුරකට යැවීම)<br>14. සාමාන්‍ය අකාර්යක්ෂමතාවය හේතුවෙන් සේවයෙන් විශ්‍රාම ගැන්වීම<br>15. විනය පරීක්ෂණයකට පසු සේවය නැවැත්වීම<br>16. සේවයෙන් පහකිරීම |

## උපලේඛනය ‘ඇ’

මෙම පරිච්ඡේදයේ 4.1.2 උපඡේදයට අනුව උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක සේවයේ නියුතු තැනැත්තන් හට දඬුවම් පැමිණවීමට බලය පැවරීම

| විනය බලධරයා | කුමන කාර්ය මණ්ඩලය සඳහාද | බරපතල දඬුවම |
|---|---|---|
| විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරීවරයා / විශ්වවිද්‍යාලීය විද්‍යායතනයක ලේකම්වරයා/ මණ්ඩපයක මණ්ඩපාධිපතිවරයා විද්‍යායතනයක අධ්‍යක්ෂකවරයා | අවස්ථාවෝචිත පරිදි විශ්වවිද්‍යාලයක විද්‍යායතනයක/ ආචාර්යවරුන් සහ විධායක ශ්‍රේණි නිලධාරීන් හැර අනෙකුත් සියලුම තැනැත්තන් | 9. අවුරුද්දකට වැඩි කාලයක් සඳහා වැටුප් වර්ධයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් නැවත්වීම, අඩු කිරීම හෝ විලම්භනය කිරීම<br>10. විභාග වරදකදී, ඕනෑම උසස්වීම් පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට විශේෂ කාලයක් සඳහා නුසුදුස්සෙකු කිරීම |
| විශ්වවිද්‍යාලයක උප කුලපතිවරයා හෝ නියෝජ්‍ය උපකුලපතිවරයා/විශ්වවිද්‍යාල විද්‍යායතනයක අධ්‍යක්ෂවරයා/ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක අධ්‍යක්ෂවරයා | උසස් අධ්‍යාපන ආයතනයක/ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක ආචාර්යවරුන් සහ විධායක ශ්‍රේණි නිලධාරීන් හැර අනෙකුත් සියලුම තැනැත්තන් | 11. ඉහත 9 සහ 10 සහ විශේෂ කාලපරිච්ඡේදයක් සඳහා උසස්වීම් විභාගයකට පෙනී සිටීමට නුසුදුස්සකු කිරීම සහ උසස්වීම්වලට නොසලකා සිටීම<br>12. යම් විශේෂිත කාල පරිච්ඡේදයකට උසස් වීම් විලම්භනය කිරීම<br>13. විනය පරීක්ෂණයක් පැවැත්වෙන තුරු සේවය අත්හිටුවීම |
| පාලක බල මණ්ඩලය | ආදාල උසස් අධ්‍යාපන ආයතනයේ/ විද්‍යාතනයේ සියලුම කාර්ය මණ්ඩලය සඳහා | 14. ඉහත 9 සිට 13 දක්වා සහ ජ්‍යෙෂ්ඨත්වයෙන් පහළ දැමීම (තමා දැනට සිටින ශ්‍රේණියෙන් ස්ථාන කීපයක් පහත දැමීම)<br>15. තත්ත්වයන් පහළ දැමීම (එම තනතුරේම සමාන ශ්‍රේණියක පහළ පන්තියකට යැවීම හෝ පහළ තනතුරකට යැවීම)<br>16. සාමාන්‍ය අකාර්යක්ෂමතාවය හේතුවෙන් සේවයෙන් විශ්‍රාම ගැන්වීම<br>17. විනය පරීක්ෂණයකට පසු සේවය නැවැත්වීම<br>18. සේවයෙන් පහකිරීම |